# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2012 නොවැම්බර් 06 වන අඟහරුවාදා**
2012 நவம்பர் 06 செவ்வாய்க்கிழமை
Tuesday 09th November 2012

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.55 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.55 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.55 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# නිවේදනය
ANNOUNCEMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"බස්නාහිර පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඇති පළාත් රෝහල්වල තත්ත්වය උසස් කිරීම සම්බන්ධව, 2012.09.18 වන දින සභා සම්මත වූ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර තිබෙන බව දැනුම් දෙනවා."*

***දැනුම් දීම :***

*"මෙම පළාත් සභාවේ දීර්ඝ කාලයක සිට ඉංග්‍රීසි - සිංහල - ඉංග්‍රීසි සමකාලීන ක්ෂණික භාෂණ පරිවර්තන කටයුතුවල (බාහිරව) යෙදෙමින් ගරු ඔබතුමන්ලා සැමට සේවය ලබා දුන් ප්‍රවීණ භාෂණ පරිවර්තක එස්.ඒ. රංජිත් අමරසේකර මහතා පසුගිය ඉරිදා හදිසියේ අභාවප්‍රාප්ත වූ බව ඉතා සංවේගයෙන් දැනුම් දෙනවා.*

*ප්‍රවීණ ගත්කරුවෙකු, කලාකරුවෙකු, ගුවන් විදුලි හා විද්‍යුත් මාධ්‍ය ශිල්පියෙකු, මාධ්‍යවේදියෙකු වශයෙන් විවිධ ක්ෂේත්‍රවලින් දක්ෂතා දැක් වූ එස්.ඒ. රංජිත් අමරසේකර මහතා භාෂණ පරිවර්තන කටයුතුවලදී මෙම පළාත් සභාවට ලබා දුන් සේවය කෘතවේදීව සිහිපත් කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා. එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.*

*අවසන් කටයුතු ලබන බ්‍රහස්පතින්දා තලාහේන පොදු සුසාන භූමියේදී සිදු කිරීමට නියමිත බවත් කාරුණිකව දැනුම් දෙනවා."*

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2012.10.24 වන දින පැවැති සභා කටයුතු කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that copies of the relevant report is placed on the tables of the Hon. Members.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

***න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ උදේන විජේරත්න ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල් බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon. Udena Wijerathne, Member, under item No. 01 of the agenda, was presented to the Hon. Chief Minister and as two weeks time was asked for, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

***න්‍යාය පත්‍රයේ අංක 02 යටතේ යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු සමුපකාර අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල් බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon. U. George Perera - Chief Opposition Whip, under item No. 02 of the agenda, was presented to the Hon. Minister of Cooperatives and as two weeks time was asked for, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

***න්‍යාය පත්‍රයේ අංක 03 යටතේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු සමුපකාර අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල් බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon. Niroshan Padukka, Member, under item No. 03 of the agenda, was presented to the Hon. Minister of Cooperatives and as two*

*weeks time was asked for, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

# අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

MINISTRIES ' ANNOUCEMENTS/ MINISTERS ' STATEMENTS

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)

Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාරයට ඉදිරිපත් වුණු බස්නාහිර පළාත් සභා සෞඛ්‍ය පීඩා ප්‍රඥප්තියට අදාළ රීති උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර තිබෙනවා. මම එදා මේ සභාවට සහභාගී වුණා. ලුනාව රෝහලේ සිදු වුණු හදිසි තත්ත්වයක් යටතේ DMO එකත් එක්ක පොඩි සාකච්ඡාවක් තිබුණා, පහළ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශයේ. මම දැනුම් දීලා ගියත් මට ඒ අවස්ථාවේ ඊට සහභාගී වෙන්න හම්බ වුණේ නැහැ. මා වෙනුවෙන් උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා රීතීන් සභාවට යොමු කරලා තිබුණා. පසුව ඒක ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, එය ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කිරීමේ පූර්ණ අවශ්‍යතාවයක් වන්නේ නැහැ. ඒ රීතිවල යම්කිසි අඩුපාඩුවක් පිළිබඳව මේ සභාව දැනුවත් කිරීම තමයි නීත්‍යානුකූලව කළ යුතු කාරණාව තිබුණේ. ගැසට් පත්‍රයේ පළ වුණු දවසේ ඉඳලා ඒ රීති ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ කඩිනම් අවධානයට යොමු කරලා නැවත මේ සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන ලෙස ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

මේ වනවිට අපි එම රීති ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරලා තිබෙනවා. ඔබතුමාගේ ඉල්ලීම පරිදි ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ ගරු සභාපතිතුමාගෙන් මේ අවස්ථාවේ ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා, එළැඹෙන පළාත් සභාවේදී සාකච්ඡාවට ගැනීමට පහසු වන පරිදි එම වාර්තාව ඊළඟ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට කඩිනම්ව ලබා දෙන්න ලෙස.

# පෞද්ගලික පැහැදිලි කිරීම්

PERSONAL EXPLANATIONS

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**

Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය අතර බලය බෙදා දීම මගින් එක් පුද්ගලයෙකු හෝ ස්ථානයක් තුළ බලය කේන්ද්‍රගත වීම වැළැක්වීම සඳහා වර්තමානයේ සියලු රටවල් පියවර ගනිමින් සිටිනවා. එකී තත්ත්වයට හානිදායක වන පරිසරයක් අද බිහි වෙමින් පවතින බවට පෙනී යනවා. බලවත් -

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*

*[Expunged on the order of the chair]*

කාරණා තුළින් -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක

Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් මතු කරනවා. 27 (10) වගන්තිය සඳහා මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එතුමා කරන ප්‍රකාශයේ ඇතැම් කරුණු සම්බන්ධව මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා 27 (10) වගන්තියේ පැහැදිලිවම කියලා තිබෙනවා,

"*විනිශ්චයකාරවරයෙකු අග්‍රවිනිශ්චයකාරවරයෙකු, ජනාධිපතිවරයෙකු සහ මන්ත්‍රීවරයෙකු පිළිබඳව මෙම සභාවේදී සාකච්ඡාවට නොගත යුතුයි*" කියන කාරණය පිළිබඳව. ඒ නිසා ඔබතුමා එම රීතිය පිළිබඳව තදින්ම අවධානය යොමු කරන්න. කරුණාකරලා ඒ පිළිබඳව කථා කිරීමෙන් වළකින්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**

Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මම කථා කරන්නේ අග්‍රවිනිශ්චයකාරතුමිය ගැන නොවෙයි. අග්‍රවිනිශ්චයකාරතුමියට එරෙහිව ඉදිරිපත් කර තිබෙන දෝෂාභියෝගය ගැන පමණයි.

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

එහෙත් ඒ පිළිබඳව ප්‍රශ්නයක් තියෙනවා ගරු මන්ත්‍රීතුමා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක

Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හැසිරීම සම්බන්ධව කථා කරන්නේ. ඔබතුමා 27 (10) -

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

27 (10) වගන්තියේ ඒ සම්බන්ධව පැහැදිලිව කියලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා ඔබතුමා ඒ සම්න්ධව කථා කිරීමෙන් වැළකී සිටින්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම දකින ආකාරයට -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මේ එකක්වත් අපි හදපුවා නොවෙයි.

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

නීතිය දන්න අයනේ නීතිය වරද්දා ගන්නේ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම දකින ආකාරයට -

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

මෙතුමන්ලා තමයි ජනාධිපති නිතීඥ -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

කියන්න තියෙන දේ කියන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාත් ඒ ගැන කරුණාකරලා අවධානය යොමු කරන්න. ඒ රීතියේ පැහැදිලිවම කියලා තිබෙනවා, මන්ත්‍රීවරයෙකු, අග්‍රවිනිශ්චයකාරවරයෙකු, නඩුකාරයකු සම්බන්ධව -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මම දකින ආකාරයට මෙම ක්‍රියාවලිය සැලකිය හැක්කේ, මේ රටේ ඇති වුණු ත්‍රස්තවාදයට පමණක් දෙවැනි වන ක්‍රියාවලියක් හැටියටයි. ස්වාධීන අධිකරණයක් රැක ගැනීමට රටේ සියලු ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමත් -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මේ උගත් නිතීඥ මහත්මයාට ඔබතුමාට දැනුම් දුන්නා, ඒ පිළිබඳව කථා කරන්න ප්‍රතිපාදන නැහැයි කියලා. එතුමා තවමත් අර ලියාගෙන ආපු ලියවිල්ල කියවන්නේ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

එය දැනට වඩාත් වැදගත් වන්නේ විපක්ෂයට -

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

නැහැ, නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

නැහැ, නැහැ නොවෙයි. ඒක තමයි කියවන්නේ. ඔබතුමා කොහොමද කියන්නේ ඒක නොවෙයි කියලා. ඒක තමයි කියවන්නේ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

එයට දැනට වඩාත් වැදගත් වන්නේ විපක්ෂයට වුවත්, අනාගත දිනයකදී ආණ්ඩු පක්ෂය බලයට -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමන්ලා තමයි ඕවා හදලා දීලා තියෙන්නේ. අද පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථානුකූල කටයුත්තක් කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, 27 (10) රීතියේ සහ 64 (1) රීතියේ ඒ සම්බන්ධව පැහැදිලිව තිබෙනවා. ඒ නිසා නැවත වරක් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා කරුණාකරලා ඒ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඒ සම්බන්ධව කථා කිරීමෙන් වළකින්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ව්‍යවස්ථාව හැදුවේ මෙතුමන්ලා නේ? ඒ ව්‍යවස්ථාව අනුව තමයි අද කටයුතු කරන්නේ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම කථා කරන්නේ මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මගෙන් ඉල්ලීමක් කරලා තිබෙන්නේ, ජනතා අයිතීන් සුරැකීම් සම්බන්ධව කථා කරන්න. ඒ නිසා ඔබතුමා ඒ කාරණය කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, ජනතා අයිතීන් ආරක්ෂා කිරීමේදී වැදගත්ම වන දේ තමයි අධිකරණයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම. අධිකරණයේ අයිතිවාසිකම් විනාශ වෙලා යනවා නම්, ජනතාවගේ අයිතිවාසිකම් සම්පූර්ණයෙන් විනාශ වී යාමක් සිද්ධ වෙනවා. (බාධා කිරීම්)

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මේ සභාවේ රීති කඩ කරනවා නම්, මේ සභාවත් විනාශ වෙනවා. ඒ නිසා ජනාධිපති නිතීඥවරයෙක් මේ සභාවේ රීති උල්ලංඝණය කරමින් හැසිරීම පිළිබඳව ඔබතුමා අවධානය –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, ඔබතුමා –

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

දිගින් දිගටම මෙතුමා ව්‍යංගයෙන් සභාවේ රීති උල්ලංඝණය කරනවා. ඒකට ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මගෙන් ඉල්ලීම කරලා තිබෙන්නේ, ජනතා අයිතීන් සුරැකීම් සම්බන්ධව. ඒ නිසා ඔබතුමා ඒ කාරණයම කථා කරන්න. ඊට එහාට යන්න එපා.

**ගරු නිමල් ලාන්සා** – අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මම හිතන්නේ කාලය ඉවරයි සභාපතිතුමා. විනාඩි 10 ක් විතර ගියා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, 27 (10) –

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. 27 (10) සහ 64 (1) කියන කාරණා කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මම ඉල්ලා සිටිනවා. මෙතුමා මෙතෙක් වේලා පැහැදිලි කරපු දේවල් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙසට. ඉදිරියේදී ඒ දේවල් නොවෙන්න කටයුතු සලස්වන ලෙස.

**ගරු නිමල් ලාන්සා** – අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අනෙක් එක නීතිය ගැන කථා කරනවා. මෙතුමා රීතිය දන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. දැන් ඔබතුමාගේ කාලයත් අවසන් වේගෙන යන්නේ.

[සභාවේ ඝෝෂා]

ගරු මන්ත්‍රීතුමා දැන් ඔබතුමාගේ කාලයත් අවසන් වේගෙන යන්නේ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, 27 (10) කියන්නේ, *"ජනාධිපතිගේ හෝ ආණ්ඩුකාරවරයකුගේ හෝ විනිශ්චයකාරවරයකුගේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ හෝ හැසිරීම සම්බන්ධයෙන් ප්‍රශ්න විමසීමක් නොකළ යුතුය."* මම මෙතැන ප්‍රශ්න විමසීමක් කරන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

64 (1) රීතිය බලන්න. ඔබතුමා දිගින් දිගටම පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙන්නේ නැහැ. ඔබතුමාට මම මේ සම්බන්ධව පැහැදිලිව කිව්වා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මූලාසනයට ගරු කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න මට ඉඩකඩ දෙන්න බැහැ. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු නිමල් ලාන්සා – අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

උගත් නිතීඥතුමාව වාඩි කරවන්න. මෙතුමන්ලා තමයි ඒ කාලේ ව්‍යවස්ථාව හැදුවේ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, 64 (1) රීතියෙන් කියන්නේ,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තර්ක කරන්න ඉඩ දෙන්න බැහැ. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙර්රා**
Hon. Meril Perera

***[නැඟී සිටියේය.]***
*[Stood.]*

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම අවසාන වශයෙන් කියනවා ගරු සභාපතිතුමනි.

**ගරු නිමල් ලාන්සා – අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

හරි, හරි අවසාන වශයෙන් –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මේ ජනතාවගේ අයිතිවාසිකම් ගසා කාලා –

**ගරු නිමල් ලාන්සා – අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

කරුණාකරලා ඉඳ ගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

සහයෝගය දෙන –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර – අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, –

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ජනතාවගේ අයිතිවාසිකම් සම්පූර්ණයෙන්ම විනාශ කරන ක්‍රමවේදයක් –

[සභාවේ ඝෝෂා]

මේ රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන –

[සභාවේ ඝෝෂා]

කියලා කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න. මම ඔබතුමාට විනාඩි 03 ක කාලයක් ලබා දුන්නා. නමුත් ඔබතුමා විෂයය පථයට අදාළ නොවන දෙයක් කථා කළා. ඒ නිසා මම ඒ සම්බන්ධ දේවල් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා. ඔබතුමාට සිදු වූ අසාධාරණයක් පිළිබඳව පැහැදිලි කිරීමට.

**ගරු මෙරිල් පෙර්රා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න.

[සභාවේ ඝෝෂා]

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා –

**ගරු මෙරිල් පෙර්රා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මම පෞද්ගලික -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීතිය මොකක්ද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36 (1). අපටත් පුළුවන්ද මේ වාගේ නැඟිටලා තනියම කථා කරන්න? ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කෑගහනවා වාගේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා මේ හැම දෙයක්ම -

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ ආණ්ඩු පක්ෂයේ සංවිධායක.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. ඔබතුමා යොමු කරන්නේ වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මගේ වරප්‍රසාද ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට වරප්‍රසාද ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

මොකක්ද ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් එතැන නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරු කථා කරනවා. ඔබතුමා එක එක දේවල් කියන්න ලැහැස්ති වෙන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මටත් කටක් තියෙනවා කෑගහන්න. අහගෙන ඉන්න කියන්න. ඔය කට තුවාල කරගෙන තියෙනවා මදීවාටද තවත් කෑගහන්නේ? කටට ප්ලාස්ටර් දාගෙන ඇවිල්ලත් කෑගහනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ලැජ්ජ නැහැ. ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් ඇති වෙලා නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ලක්බිම පත්තරේ පළ වුණු කාරණයක් ගැන මට කථා කරන්න වරප්‍රසාද ප්‍රශ්නයක් තියෙනවා. එම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට අවස්ථාව දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එම පත්තරේ ප්‍රකාශ කරලා තිබුණා බස්නාහිර පළාත් සභාවේ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පත්තරේ දැන් ඔබතුමා ළඟ තියෙනවාද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ ළඟ පත්තරේ නැහැ. පත්තරේ තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තිබුණා කියලා ඔබතුමා එක එක කරුණු ගැන කථා කරන්න බැහැ. ඔබතුමාට මෙතැන එක එක ප්‍රශ්න කථා කරන්න ඉඩ දෙන්න බැහැ. කරුණාකරලා ඔබතුමා කරුණු ඇතිව කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා කියන්නේ පත්තරේ නැහැයි කියලාද? මම වගකීමෙන් කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පත්තරේ පෙන්වන්න. පත්තරේ සභාගත කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, පත්තරේ තියෙන දෙයක් කියන්න පත්තරේ ගේන්න අවශ්‍ය නැහැ. ඔබතුමාත් දැකලා තිබෙනවා. මේ සභාවේ ඔක්කෝම ඒක දැක්කා.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, පත්තරේ ඉදිරිපත් කරන්නේ නැතුව කථා කරන්න බැහැ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ඔය වාගේ කියන කථා අපට විශ්වාස කරන්න පුළුවන්.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පේන්නේ නැද්ද -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. පෞද්ගලික දේවල් මේ සභාවේ කථා කරන්න එපා. ඔබතුමා වාඩි වෙන්න. වරප්‍රසාද ප්‍රශ්නයක් කියලා පෞද්ගලික ප්‍රශ්නවලට යන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා බලාගෙන ඉන්නවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බලාගෙන ඉන්නවා නෙවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ ගැන කිසිම දෙයක් කරන්නේ නැහැ නේ?

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා මේ ගැන අරගෙන තියෙන පියවර මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මේ සභාව විහිළුවක් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා මේ ගැන මොනවාද අරගෙන තියෙන පියවර?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා 36 (1) කියලා අනවශ්‍ය ප්‍රශ්න කථා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකර වාඩි වෙන්න මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වාඩි වෙන්නේ කොහොමද? ඔබතුමාත් මේකට උල්පන්දම් දෙනකොට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. මොකක්ද ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය?

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා ඉන්නේ මේ සභාවේ ගරුත්වය ආරක්ෂා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා ඒක කරන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36 (1) කියලා වෙන වෙන දේවල් කථා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතකොට මේ මෙරිල් මන්ත්‍රීතුමා කෑගහද්දී හොඳයි. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා නැඟිටලා කථා කරන එක හොඳයි. අපට තමයි බැරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරුන්ට කථා කරන්න අයිතියක් තියෙනවා. කෑගහන්නත් අයිතියක් තිබෙනවා. මම නැහැයි කියන්නේ නැහැ. (බාධා කිරීම්) නමුත් ඔබතුමා අනවශ්‍ය ප්‍රශ්න කථා කරන්න එපා. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

[සභාවේ ඝෝෂා]

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හැබැයි මට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දැන් වාඩි වෙන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසදා ප්‍රශ්නයක්. අපේ උගත් ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා නිමල් ලාන්සා ඇමැතිතුමා අට පාස් නැහැයි කියලා. ඉතින් මම ඔබතුමාට අභියෝග කරනවා මම ඉතාමත් හොඳට උසස් පෙළ ලියලා ඉතාමත් හොඳට සමත් වෙලා ඊට පස්සේ තවත් විශේෂ බාහිර වෘත්තීය පුහුණු විශාල ප්‍රමාණයක් කරලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගොඩාක් කරලා තියෙනවා ඒ කාලේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේ කියන්නේ මම අට පාස් නැහැ. අ.පො.ස. (උසස් පෙළ) ඉතාමත් විශිෂ්ට ලෙස සමත් නැහැයි කියලාද කියන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාට ඕනෑ නම් ගෙනැල්ලා ඔප්පු කරන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

නැහැ, නැහැ. පොඩ්ඩක් ඉන්නකෝ.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, මගේ උසස් පෙළ ප්‍රතිඵල පිළිබඳව මම ඉතාමත් සෑහීමට පත් වෙනවා. ඒ නිසා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මම ඉස්සරහා මේ සභාව නොමඟ යවමින් (බාධා කිරීම්) පොඩ්ඩක් ඉන්න. ගරු සභාපතිතුමනි, මේ සභාව නොමඟ යවමින් ඉතාමත් අභූත චෝදනාවක් කිරීම පිළිබඳව මගේ කනගාටුව ප්‍රකශ කරනවා. ඒත් එක්කම ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටිනවා, කරුණාකරලා ඒ ප්‍රකාශය එතුමාට ඉල්ලා අස් කර ගන්න කියලා -

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, එතුමාට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හැසිරෙන්න අභියයෝගයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අභියෝග එපා. වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එපාලු. එපාලු. සභාපතිතුමාට කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. මම ඉතාමත් කාරුණිකව ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා පෞද්ගලික පැහැදිලි කිරීම් සහ වරප්‍රසාද ප්‍රශ්න කියලා ඉල්ලීම් කරමින් ද්වේශ සහගතව මන්ත්‍රීවරුන්ට අපහාස කරන්න එපා. ඒවා මේ සභාවේ හොඳ නැහැ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මගේ අභියෝගය?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේ හැමෝටම කියන්නේ. යම් යම් වචන මෙතැන ප්‍රකාශ වෙනවා. යම් යම් වචන මෙතැන කථාබහ කරනවා. ඒ නිසා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙන්, කාරුණිකව එවැනි කථාවලින් වළකින්න. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා -

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ විශාල වරප්‍රසාද ප්‍රශ්නයක් මට තියෙන්නේ. මෙතුමා කියනවා මම අට පාස් නැහැයි කියලා. එතුමාට කියන්න ඉල්ලා අස්කර ගන්න කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

මොක්කද? සංශෝධනයක් නොවෙයි.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, -

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

විභාගයක් කරන්න ඉඳගන්න බැරුව ගියා. Fail.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මේ සභාවේ බරපතළ ප්‍රශ්නයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

[සභාවේ ඝෝෂා]

මේ සභාව හැල්ලුවට පත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. විවිධ ප්‍රකාශ කිරීමෙන් වළකින්න. කරුණාකරලා මන්ත්‍රීතුමන්ලා දෙන්නාම වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේවා මාධ්‍යයේ යන එක ඇත්ත. මේ සභාව හැල්ලුවට පත් කරන්න එපා.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ මට විශාල වරප්‍රසාද ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේ සියලුම දේවල් -

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

මම අට පාස් නැහැ කියනවා නම්

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සියලුම දේවල් මම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ වාගේ උදවිය තමයි ආණ්ඩු පක්ෂයෙන් පාර්ලිමේන්තුවට, පළාත් සභාවලට එවලා තියෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අද රටේ නීතිය නැති වෙන එක අහන්න දෙයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. අපි සියලුම මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කිරීම ඔබතුමාගේ වගකීමක්. ගරු අමාත්‍යතුමා සම්බන්ධව විපක්ෂයේ මන්ත්‍රීවරයා කරපු ප්‍රකාශය සම්බන්ධව ඔබතුමා නොසලකා හැරලා ඊළඟ –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නොසලකා හැරීමක් නොවෙයි සංවිධායකතුමා. මම ඒ ගැන පැහැදිලි කළා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඔබතුමා ප්‍රකාශයක් කළා –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

පැහැදිලි කිරීමක් නොවෙයි. එතුමාගේ ප්‍රකාශය ඉල්ලා අස් කර ගැනීමක් අවශ්‍යයි. එහෙම නැතුව කොහොමද මේ සභාව වෙන කාරණයකට යන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සියලුම කාරණා මම ඉවත් කරනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඕනෑම අයෙකුට අපහාස කරන්න පුළුවන්.

**ගරු නිමල් ලාන්සා –** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, ඒ චෝදනවා ඇත්ත නම් ප්‍රශ්නයක් නැහැ. ඒ චෝදනාව ඇත්ත නැහැ නේ?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඕනෑම කෙනෙකුට නැගිටලා ඕනෑම වෙලාවක අපහාස කරන්න පුළුවන් මේ සභාවේ. ඒ තත්ත්වයට වට්ටන්න එපා ඔබතුමා. ඒක ඔබතුමාගේ වගකීමක්.

**ගරු නිමල් ලාන්සා –** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි,මේ මට චෝදනා කරපු මන්ත්‍රීතුමාට –

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඔබතුමාගේ වගකීමක්. ඔබතුමා එය මඟ අරිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක කරන්නම්.

**ගරු නිමල් ලාන්සා –** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම ඒ පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා කථා කරන්න එපා. මූලාසනයේ ගෞරවයත් ආරක්ෂා කරන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒක දැන් –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා දැන් –

**ගරු නිමල් ලාන්සා –** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

එතුමා පිළිගත්තේ නැහැ ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ප්‍රකාශ කරපු දේවල් එතුමා දැන් –

**ගරු නිමල් ලාන්සා –** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, එතුමා පිළිගත්තේ නැහැ ඒක. පිළිගන්න කියන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මම ඉල්ලා අස්කර ගන්න කැමැතියි. හැබැයි යකා, මෝඩයා, බූරුවා, බල්ලා කියන ඒවා ඉල්ලා අස්කර ගන්නවා නම් මම ඉල්ලා අස්කර ගන්න කැමැතියි. මේ කියපු හැම කෙනාටම කියන්න ඒවාත් ඉල්ලා අස්කර ගන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම විවාදයට යන්න අවශ්‍ය නැහැ නේ?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, පත්තරවල තියෙන දේවල් නිවැරැදි කරන්න අපට පුළුවන්කමක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෝඩයා, බූරුවා, බල්ලා, යකා කියපු හැම එක්කෙනාටම කියන්න ඉල්ලා අස් කර ගන්න කියලා. එතකොට මමත් ඉල්ලා අස්කර ගන්නම්.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ගැන ලියලා තිබුණු එකක් නොවෙයි මම කිව්වේ. මම කිව්වේ මේ සභාව ගැන.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

විපක්ෂයේ මන්ත්‍රීතුමාටත් වක්‍රව මේ සංවිධායකතුමා අපහාස කරනවා. එතුමාත් මේවා ඉල්ලා අස්කර ගන්න ඕනෑ. මෙතුමාට විතරක් කියන එක වැරැදියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙපැත්තෙන්ම තමයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඕක තමයි කියන්නේ උගත්කම නැතිකම කියලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

වක්‍රව කියන්නේ ඒක තමයි. එහෙම නම් එතුමාටත් අස්කර ගන්න කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මම කිව්වේ -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, අභියෝගය භාර ගන්න කියන්න. ඉල්ලා අස්කර ගන්න ඕනෑ නැහැ. අභියෝගය භාර ගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔක්කෝමට කියන්න ඉල්ලා අස්කර ගන්න කියලා. මමත් ඉල්ලා අස්කර ගන්නම්.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අභියෝගය භාර ගන්න.

[සභාවේ ඝෝෂා]

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සභාවේ අභියෝග කරන්න අවස්ථාවක් අපට නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ඒ ප්‍රකාශය ඉල්ලා අස්කර ගන්න. ඔබතුමා වාඩි වෙන්න. නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා පිළිබඳව කළ ප්‍රකාශය ගරු මන්ත්‍රීතුමා ඉල්ලා අස්කර ගත්තා. ඒ නිසා ආණ්ඩු පක්ෂයෙන් ප්‍රකාශ කළ යම් යම් අපහාසාත්මක වචන මම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මම අද -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, දැන් මෙතැන දෙපැත්තෙන්ම වරප්‍රසාද ප්‍රශ්න මතු වුණා. මෙතුමාත් වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළා. එතුමාත් මතු කළා. මම හිතන්නේ සභාවේ මන්ත්‍රීවරු හැටියට අපි දැන් අපහසුතාවට පත් වෙලා තිබෙනවා මොකක්ද ඇත්ත කියන එක. ඒ නිසා -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපට එහෙම -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, අපි ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, එතුමා අධ්‍යාපන ඇමැති හැටියට ඒ අවශ්‍ය ලිය -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමා අභියෝගය භාර ගන්නවාද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මාස තුනක් කල් ඉල්ලනවා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මගේ අභියෝගය භාර ගන්නවාද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මාස තුනක් කල් ඉල්ලනවා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමා අභියෝගය භාර ගන්නවාද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මාස තුනක් කල් ඉල්ලනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සම්බන්ධව දිගින් දිගටම අදහස් ප්‍රකාශ කළා. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මාස තුනක් කල් ගන්නේ මොකටද? තමුන්නාන්සේ අද -

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමුන්නාන්සේට ඕනෑ වෙලාවට දෙන්නේ නැහැ. මට ඕනෑ වෙලාවටයි ඒක දෙන්නේ. මාස තුනක් කල් ඉල්ලනවා. කැමැති නම් භාර ගන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අද මෙතුමා අභියෝගයක් කළා නේ? මම අභියෝග කරනවා තමුන්නාන්සේගේ විභාග ප්‍රතිඵලයි -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අභියෝගය භාර ගන්නවා. මාස තුනක් කල් ඉල්ලනවා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මාස තුනක් කල් ඉල්ලන්නේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමාගේ හදපු හොර එක බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලාගේ වරප්‍රසාද කඩවීම් සිදු වුණා නම් එහෙම එම සියලුම වරප්‍රසාද කඩවීම් මම ඊළඟ සභා කටයුතු කාරක

සභාවට යොමු කරනවා. එතැනදී සාකච්ඡා කරන්න ඉඩකඩ තිබෙනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැන අධිකරණයක් වෙන්න බැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මෙතුමාගේ ප්‍රකාශ සම්බන්ධව - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඉල්ලා අස්කර ගත්තා. මම තීන්දුවක් දුන්නා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඉල්ලා අස්කර ගත්තේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඉල්ලා අස්කර ගත්තා. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ගිය ඔක්තෝබර් 26 වැනි සිකුරාදා දින -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. ඔබතුමා කථා කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, අද පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ මම විශේෂ ඉල්ලීමක් කෙරුවේ මා හට වුණු අසාධාරණයක් වෙනුවෙන් කරුණු පැහැදිලි කිරීමට. ගිය ඔක්තෝබර් 26 වැනි දින ජා-ඇළ ප්‍රාදේශීය කළමනාකරු, ප්‍රවාහන අධිකාරිය, ගම්පහ 01 කාර්යාලයේ අයිවන් සනත් මහතාව මාරු කර යවා ඇති බවට ජා-ඇළ පොලීසිය ඉදිරිපිට ඒ කාර්යාලයේ සේවකයින්, කළමනාකරු අයිවන් සනත් මහතා සහ වේලා සටහන්කරුවන්, ඒ වාගේම මාර්ගවල වැඩ කරන රියදුරු සහ කොන්දොස්තර මහත්වරු එක්ක ගම්පහ දිස්ත්‍රික්කයේ කැබිනට් අමාත්‍යවරයෙකුගේ මැදිහත්වීම තුළ විශේෂ විරෝධතා උද්ඝෝෂණයක් කෙරුවා, මම මාරු කෙරුවා කියලා. ගරු සභාපතිතුමාට මම ඉදිරිපත් කරනවා.

*"අයිවන් සනත් මහතා, ගරු සභාපති, ප්‍රවාහන අධිකාරිය, ප්‍රධාන කාර්යාලය, බත්තරමුල්ලට 2012.10.17 වැනිදා ස්ථාන මාරුවක් ඉල්ලා සිටීම"*

කියන ලිපිය සභාගත කරනවා. ඒකේ ඉල්ලීමක් කරලා තිබෙනවා. එතුමා සේවය කරන ගම්පහ 01 කාර්යාලයේ රාජකාරී කිරීමට ගැටළු සහගත තත්ත්වයක් ඇති බැවින් මා හට වෙනත් කාර්යාලයක් රාජකාරී සඳහා ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි කියලා. මාරුවක් ඉල්ලලා, 10 වැනි මාසේ 17 වැනිදා ඉල්ලීම කරලා තියෙන්නේ. මේ උද්ඝෝෂණය කරන්නේ 10 වැනි මාසේ 26 වැනි දින. 27 වැනිදා මව්බිම පත්තරේ ඒ වාගේම 30 වැනි දින අද කියන පත්තරේ ඒ දෙකේම සඳහන් කරලා වාර්තාවන් දෙකක් දාලා තියෙනවා. මේකේ දාලා තියෙන්නේ *"පළාත් සභා දේශපාලනඥයාට සේවක විරෝධතාවය"* අනෙක් වාර්තාවේ තිබෙන්නේ, *"ප්‍රාදේශීය කළමනාකරුවකුට තර්ජනය කිරීමට එරෙහිව ජා-ඇළදී විරෝධතාවක්"* කියලා. කළමනාකරු අයිවන් සනත් මහතාට යම්කිසි තර්ජනය කිරීමක් හෝ කාර්යාලයට ගොස් තර්ජනය කිරීමක් කරලා තිබෙනවා නම්, ප්‍රවාහන අධිකාරියේ සභාපතිතුමා ඉන්නවා. ඒ වාගේම ප්‍රවාහන අමාත්‍යවරයා ඉන්නවා. නැත්නම් බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා ඉන්නවා. නැත්නම් ජා-ඇළ පොලීසිය තිබෙනවා. මේ කිසිම තැනකට දවස් 09 ක් ඇතුළත කිසිම පැමිණිල්ලක් කරලා නැහැ. මම මෙම කාර්යාලයට ගිහිල්ලත් නැහැ. තර්ජනයක් කරලත් නැහැ. කිසිම විටෙක මම ඉදිරිපත් වෙලත් නැහැ. මෙය සම්පූර්ණ බොරුවක්. එතුමා විසින්ම 17 වැනිදා ස්ථාන මාරුව ඉල්ලලා, දවස් 09 කට පස්සේ එතුමා මැදිහත් වෙලා ගම්පහ දිස්ත්‍රික්කයේ කැබිනට් අමාත්‍යවරයෙක් මැදිහත් කරගෙන ඒ වාගේම වේලා සටහන්කරුවා මැදිහත් කරගෙන, මාර්ගවල ඉන්න රියදුරු සහ කොන්දොස්තරවරු මැදිහත් කරගෙන ජා-ඇළ විශාල උද්ඝෝෂණයක් කෙරුවා. එය සම්පූර්ණයෙන්ම බොරුවක් කියන එක අද ඔප්පු වෙලා තිබෙනවා. මම ලිපියකින්වත් කිසිම කෙනෙකුට ඉල්ලීමක් කරලා නැහැ, මාරු කරන්න කියලා. මම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ප්‍රවාහන අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කරනවා. අයිවන් සනත් මහතා ඉල්ලූ ලිපියත් සමග එතුමා කරපු විරෝධතාවය මොකක්ද කියලා පරීක්ෂණයක් පවත්වන්න කියලා. එයට ප්‍රධාන හේතුව, එතුමාම ඉල්ලීම් කරලා, එතුමාම දවස් 09 කට පස්සේ විරෝධතාවයක් දාලා, එතුමාම වැඩට යනවා. ඒකෙන් ඔප්පු වෙනවා එතුමාම තමයි මේ උද්ඝෝෂණය සම්පූර්ණයෙන්ම සංවිධානය කරලා තියෙන්නේ කියලා. ඒ නිසා මම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා ප්‍රධාන ඇමැතිවරයාත්, ප්‍රවාහන ඇමැතිවරයාත් මැදිහත් වෙලා පරීක්ෂණයක් පවත්වන ලෙස.

ඒ වාගේම මෙම ඡායාරූපයේ සිටින, කැබිනට් අමාත්‍යවරයා අසල සිටගෙන සිටින මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ වේලා සටහන්කරුවෙක් වන -

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ කැබිනට් අමාත්‍යතුමා කවුද කියලා ප්‍රකාශ කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ඔබතුමාට අවශ්‍ය නැහැ.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එතුමා ආණ්ඩු පක්ෂයේ ඉන්නවාද? ඔබතුමන්ලාගේ ආණ්ඩු පක්ෂයේ ඉන්නවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අනවශ්‍ය ප්‍රශ්න කථා කරන්න එපා.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමා, ආණ්ඩු පක්ෂයේ කැබිනට් ඇමැතිවරයා කවුද කියලා කියන්න. අපට කැබිනට් ඇමැතිතුමා කවුද කියලා කියන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ෆොටෝ එකේ එතුමා ඉන්නවා.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කියලා කිව්වොත් කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නම කිව්වේ නැහැ. ඔබතුමා වාඩි වෙන්න ගරු සංවිධායකතුමා.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එතුමාටත් අපහසා කරන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මේ පුවත්පත්වල තියෙනවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නම කිව්වේ නැහැ.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

නම කියන්න භය මොකද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මේ පුවත්පත්වල සම්පූර්ණයෙන් තියෙනවා. මම මේක සභාගත කරනවා. තමුන්නාන්සේලාට බලා ගන්න පුළුවන්. ඒ වාගේම ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් තවත් ඉල්ලීමක් කරනවා, ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙනුත්, ගරු ප්‍රවාහන ඇමැතිතුමාගෙනුත්. මේ ඡායාරූපයේ සිටින -

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඇමැතිවරයෙක් කියලා කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක සභාගත කරනවා. ඔබතුමාට බලා ගන්න පුළුවන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා කථා කරනකොට ඔබතුමා කථා කරන්න දුන්නේ නැහැ. එතුමා කථා කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සභාගත කරනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔක්කෝම සභාගත කරනවා. බලාගන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඒක වෙනයි. මේක වෙනයි. හැමදාම මෝඩයෙක් වාගේ කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, අනෙක් කාරණාව තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, අනෙක් කාරණාව තමයි මේ උද්ඝෝෂණය සංවිධානය කරපු කේ.ඩබ්ලිව්.එස්. ප්‍රදීප් කුමාර පෙරේරා, 262 කොළඹ - රාගම මාර්ගයේ වේලා සටහන්කරු. මේ පුද්ගලයා අපේ පළාත් සභාවේ, පළාත් සභා මන්ත්‍රීවරයෙකුගේ කාර්ය මණ්ඩලයේ වැඩ කරන පුද්ගලයෙක්. 2005 අවුරුද්දේ 10 වැනි මාසේ එතුමාට පත්වීම ලැබුණේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

කවුද ඒ පළාත් සභා මන්ත්‍රීවරයා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කරුණාකරලා අහගෙන ඉන්න. වේලා සටහන්කරුවෙක් හැටියට 2005 අවුරුද්දේ 10 වැනි මාසේ පත්වීම ලබලා තිබෙනවා. එදා ඉඳලා පළාත් සභා මන්ත්‍රීවරයාගේ කාර්ය මණ්ඩලයේ ඉඳගෙන මේ පළාත් සභාවේ මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියෙනුත් පළාත් සභා මන්ත්‍රී පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවය කිරීමෙනුත් අවුරුදු 6 1/2 ක් පඩි අරගෙන තිබෙනවා. මම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා. මේකේ නම තියෙනවා, කේ.ඩබ්ලිව්.එස්. ප්‍රදීප් කුමාර පෙරේරා යන ඒ පුද්ගලයාට -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තියෙනවා. එතුමා බොහොම පැහැදිලිව මේ කරුණු කියනවා. පළාත් සභා මන්ත්‍රීවරයෙක් කිව්වා. මමත් පළාත් සභා මන්ත්‍රීවරයෙක් විධියට මේ සභාවේ ක්‍රියා කරනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම එතුමාගේ නම මට දැනගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඒ පුවත්පත් සභාගත කරනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම ඒ අවශ්‍ය ලේඛන සභාගත කරනවා.[1]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මමත් පළාත් සභා මන්ත්‍රීවරයෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවට කියන්න අවශ්‍ය නැහැ. අපි ඒ ගැන පස්සේ බලමු.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මම -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමාගේ යුතුකමක් ඒක නිවැරැදි කරන එක. මම අභියෝගයට ලක් කරනවා නොවෙයි. එතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා එතුමා ඒ ලිපි සභාගත කරනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතුමාට ප්‍රශ්නයකුත් නැහැ ඒක කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මම පැහැදිලිව නම කිව්වේ, ඒ නම කියපු පුද්ගලයා දන්න නිසා. ඒ කාර්ය මණ්ඩලයේ ඉන්න ඒ නම කියපු පුද්ගලයා මෙතැන ඉන්නවා. මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. අපේ සභා කටයුතු අමාත්‍යවරයා හැටියට පරීක්ෂණයක් පවත්වන්න. මේ වනකොට අවුරුදු 6 1/2 ක් මේ සභාවෙන් පඩි අරගෙන තිබෙන නිසා විශේෂ පරීක්ෂණයක්

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

පවත්වන ලෙස ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මගේ ඉල්ලීමට සාධාරණයක් ඉෂ්ට වෙනවාද? එතුමා මේ පළාත් සභාවේ ඇතුළේ ඉන්න මන්ත්‍රීවරයෙක් ගැන කියනවා. ඒ කවුද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, එතුමා පැහැදිලිව සෑම දෙයක්ම සභාගත කළා. ඒ නිසා අපි -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම අහන්නේ ඔබතුමාගෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒ ගැන සභා කටයුතු කාරක සභාවේදී සාකච්ඡා කරනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

සාධාරණය ඉෂ්ට කරන්න. පක්ෂපාතී වෙන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාධාරණය තමයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

බොහොම පොඩි ප්‍රශ්නයක් අහන්නේ. මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාදයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාධාරණය තමයි. කරුණාකර වාඩි වෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නම කියන්න එතුමාට හැකියාව තියෙනවා. ඔබතුමා ඒක ප්‍රකාශයට පත් කරන්න. ඔබතුමා රාජ්‍ය ලාංඡනය යට වාඩි වෙලා ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඒක පැහැදිලියි. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමා දෙන්න කෝ සාධාරණය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමා එතුමා පැහැදිලිව ඒ සෑම දෙයක්ම සභාගත කළා. ඒ නිසා අපි ඒ පිළිබඳව සභා කටයුතු කාරක සභාවේදී සාකච්ඡා කරනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමාට යුතුකමක් තිබෙනවා. මේ සභාවේ සභාපතිවරයා විධියට මන්ත්‍රීවරුන්ට කියන්න, ඒ මන්ත්‍රීවරයා එක්තරා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කියන්න අවශ්‍ය නැහැ. අපි -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතුමා සභාගත කළේ වාර්තාවක්. එතුමාගේ ප්‍රකාශයේ එතුමා කියනවා මන්ත්‍රීවරයෙක් කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

විවාදයක් නොවෙයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒක තමයි. සාධාරණය ඉල්ලන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න අවශ්‍ය නැහැ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අපේ ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සඳහා ඉඩ දෙන්න බැහැ. අපි ඒක -

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මම ඉදිරිපත් කළේ නැහැ. මගේ නම කියන්නේ. මම ඉදිරිපත් කළේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මේ ප්‍රශ්නයේදී කවුරුත් කළබල වෙන්න අවශ්‍ය නැහැ. ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, අපි කළබල වුණේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමා කළබල වෙලා තියෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නය අපේ අමාත්‍යාංශයට අදාළ නිසා අපි ඒක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අපි ඒ පිළිබඳ පරීක්ෂණයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම් සඳහා ඔබතුමාට යන්න දෙන්න බැහැ. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම පිළිබඳව කටයුතු කිරීමේ අවශ්‍යතාව පිළිබඳව කථා කිරීමට ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඉතාමත් ස්තුතිවන්ත වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නොවෙයි. ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ රීති අංක යටතේ අපට කථා කරන්න අවස්ථාවක් නැහැ. ඔව්, නැහැ, බැහැ කියලා කථා කරන්න වෙලා තිබෙන අවස්ථාවක විපක්ෂයට මෙතැන්දීවත් අපට කථා කරන්න දෙන්නේ නැති අවස්ථාවක දැන් මම කථා කරන්නේ මොන විධියෙන්ද කියන එක මට තේරෙන්නේ නැහැ. කොහොම හරි විපක්ෂයක් වශයෙන් අපි මේ ගැන කථා කරන්න ඕනෑ. මම කියන්නේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා මෙවැනි දේවල් ඇති වුණාය කියන එක අද ලංකාවට ඔප්පු වෙලා තිබෙනවා. අද දිවි නැගුම පනත නිසා තමයි රටට හෙළි වුණේ මෙහි තිබෙන වැදගත්කම. දිවි නැගුම පනතෙන් මොකක්ද වුණේ? දිවි නැගුම පනත කියන්නේ, සමෘද්ධි හොඳ නැහැය කියලා අමාත්‍යාංශ කිහිපයක් එකතු කරගෙන එක ඇමැති කෙනෙක් යටතට බලය ගැනීමයි. එලෙස බලය ගන්න ගිය නිසා තමයි අද 13 වැනි සංශෝධනය හොඳයි කියන එක දෙමළ ජනතාවට පැහැදිලි වුණේ. මේක තමයි ඇත්ත දේ. ඒක කරන්න ගිය නිසා තමයි මේ ඔක්කෝම ප්‍රශ්න ඇති වුණේ. මේ දිවි නැගුම පනත නිසා තමයි මේ ඔක්කෝම ප්‍රශ්න ඇති වුණේ. ඒකයි මම දැන් තේරුම් කරන්න හදන්නේ. ඇයි ගරු සභාපතිතුමනි මේ දේ වුණේ? තනිකර අමාත්‍යතුමාට, සහෝදර සමාගමට මේ අමාත්‍යාංශ සියල්ලේම බලය ගන්න ගිය නිසා තමයි මේ වාගේ ප්‍රශ්නයක් ඇති වුණේ. නැත්නම් මේ සමෘද්ධිය නොදෙනවාද? දැන් සමෘද්ධිය නොදී ඉන්නවාද? ඇයි සමෘද්ධියට ඔහොම දෙයක් කරන්න උත්සාහ කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා ඔබතුමා මගෙන් ඉල්ලීම් කරලා තියෙන්නේ -

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒක තමයි මම කියන්න යන්නේ. ගරු සභාපතිතුමනි, මම කියන්න යන්නේ ඒක නිසා තමයි. මෙම ප්‍රශ්නය ඇති වුණේ මේ ප්‍රශ්නය නිසා තමයි. එම නිසා පෙළක් උදව්විය යම් යම් ස්ථානවලට ගියා. යම් යම් තීන්දු ලැබුණා. ඒ තීන්දු නිසා අද මොකද වුණේ? දෙමළ ජනතාවට අර 13 Plus ඕනෑ කියලා කෑගහපු අයට දැන් 13 ත් ඇති කියන එක වැටහුණා. ඒක තමයි ඇත්ත දේ. දැන් 13 ත් ඇති. මේ 13 වැනි සංශෝධනය අයින්

කරන්න කියලා විමල් වීරවංශ සංවිධානයත්, හෙළ උරුමයත් කථා කරන්නේ ඇයි? 13 කියන එක ඇති වුණේ මේ ප්‍රශ්නය නිසා. 13 ඇති වුණේ මේ දිවි නැගුම, බලය එකතු කර ගන්න ගිය නිසා තමයි. එම නිසා මම නම් දකින්නේ, මේ තුළ දෙමළ ජනතාවට යම් සාධාරණයක් ඇති වුණා. බලය බෙදා හැරීම සම්බන්ධව, පළාත් සභා ඇති කිරීම සම්බන්ධව දිවි නැගුම පනත නිසා අද හොඳ කාරණයක් බවට මෙය පත් වුණා. අපේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියන්න ගිය කාරණය තමුන්නාන්සේ 64 (1) කියන වගන්තියකින් හිර කළා. ඒ වාගේම තවත් වගන්තියකින් හිර කළත් මේකේ යථාර්ථය අද කවුරුත් දන්නවා ගරු සභාපතිතුමනි. එම නිසා මම ඉල්ලීමක් කරන්නේ, විපක්ෂයට කථා කරන්න තිබෙන අවස්ථාව ලබා දෙන්න. එහෙම නම් පළාත් සභා ක්‍රමය අහෝසි කරන්න කියලා කථා කරන උදවිය අද අමාත්‍ය ධූර දරනවා. මේ බස්නාහිර පළාත් සභාවේ ගෞරවනීය ස්වාමීන් වහන්සේ අද මන්ත්‍රී ධූරයක් දරනවා. හැබැයි පළාත් සභා අහෝසි කරන්න කියනවා. යම් යම් තීන්දු ගන්න හදනවා. එවැනි අවස්ථාවක මම ගරු සභාපතිතුමාගෙන් –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මාතෘකාවෙන් පිට කථා කරන්නේ.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

බොහොම ස්තුතියි. මට කියන්න ඕනෑ දේ කිව්වා. ඇති. සන්තෝෂයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී උදෑසන තේ විවේකය සඳහා මෙම සභාව විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.23 ට යළිත් රැස්විය.***
*Sitting, accordingly suspended until 11.23 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රයට අනුව තිබෙන්නේ ශෝක ප්‍රකාශ යෝජනා පිළිබඳව සාකච්ඡා කිරීම. ගරු සභානායකතුමාගේ ඉල්ලීම අනුව සහ සභාවත් එකඟ වන්නේ නම්, පොදු කටයුතුවලින් පසුව ශෝක ප්‍රකාශ යෝජනා පිළිබඳ කටයුතු ආරම්භ කිරීමට හැකියාව තිබෙනවා. ගරු සභානායකතුමාට හෝ අමාත්‍යවරයෙකුට අවස්ථාව එම යෝජනාව ඉදිරිපත් කිරීමට.

# පොදු කටයුතු
PUBLIC AFFAIRS

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, *"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාව ගත යුතු යැයි "* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා සභිකවරුන්ට අදාළ කාරක සභා සහභාගීත්ව දීමනා සඳහා රීති
RULES FOR THE PAYMENT OF ALLOWANCES TO CHAIRMAN, VICE CHAIRMEN AND COUNCILORS OF PRADESHIYA SABHA FOR ATTENDING TO COMMITTEE MEETINGS

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 184 (1) උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1769/4 හා 2012.07.30 දරණ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදී ඇති, "ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා සභිකවරුන්ට අදාළ කාරක සභා සහභාගීත්ව දීමනා සඳහා රීති" ඉහත කී 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 184 (2) උප වගන්තියේ සඳහන් විධිවිධාන අනුව අනුමැතිය සඳහා මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි යන යෝජනාව මම ඉදිරිපත් කරනවා."*

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මේ යෝජනාවේ කිසිම ප්‍රශ්නයක් නැහැ. සම්මතවීමට එකඟයි. එසේම මම යෝජනාව ස්ථිර කරනවා. ඇත්තටම ගරු සභාපතිතුමනි, මම ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක් වශයෙන් සිට මේ ස්ථානයට පැමිණි කෙනෙක් වශයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමා අදියර කිහිපයකින් ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නරග සභාවලට මේ වාගේ දේවල් ලබා දීම සම්බන්ධව අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ වාගේ කාරක සභා සම්බන්ධවත් දීමනා මුදල සම්බන්ධව අපට දැන ගන්න –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා ඊළඟ යෝජනා දෙකත් ගරු ප්‍රධාන ඇමැතිතුමාටමයි ඉදිරිපත් කරන්න තියෙන්නේ. ඉන් පසුව ඔබතුමා කථා කරන්න.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

හරි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## බස්නාහිර පළාතේ නගර සභා සභාපති, උප සභාපති හා සභිකවරුන්ට අදාළ කාරක සභා සහභාගීත්ව දීමනා සඳහා රීති

RULES FOR THE PAYMENT OF ALLOWANCES TO CHAIRMAN, VICE CHAIRMEN AND COUNCILORS OF URBAN COUNCILS FOR ATTENDING TO COMMITTEE MEETINGS

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 193 (1) (උඋ) උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1769/4 හා 2012.07.30 දරණ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදී ඇති, "නගර සභා සභාපති, උප සභාපති හා සභිකවරුන්ට අදාළ කාරක සභා සහභාගීත්ව දීමනා සඳහා රීති" ඉහත කී 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 194 වගන්තියේ සඳහන් විධිවිධාන අනුව අනුමත කළ යුතු යැයි ඉල්ලමින් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කරමි යන යෝජනාව මම ඉදිරිපත් කරනවා."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## බස්නාහිර පළාතේ මහ නගර සභා නගරාධිපති, උප නගරාධිපති හා සභිකවරුන්ට අදාළ ස්ථාවර කමිටු සහභාගීත්ව දීමනා සඳහා නියෝග

REGULATIONS FOR THE PAYMENT OF ALLOWANCES TO MAYORS, DEPUTY MAYORS AND COUNCILORS OF MUNICIPAL COUNCILS FOR ATTENDING RELEVANT STANDING COMMITTEE MEETINGS

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු මහ නගර සභා ආඥා පනතේ 289 වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1769/4 හා 2012.07.30 දරණ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදී ඇති, "මහ නගර සභා නගරාධිපති, උප නගරාධිපති හා සභිකවරුන්ට අදාළ ස්ථාවර කමිටු සහභාගීත්ව දීමනා සඳහා නියෝග" ඉහත කී 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු මහ නගර සභා ආඥා පනතේ 289 වැනි වගන්තියේම වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව අනුමැතිය සඳහා මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කරමි යන යෝජනාව මම ඉදිරිපත් කරනවා."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින් ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභාවල දීමනා සම්බන්ධව ගෙනෙන ලද යෝජනාව විපක්ෂය වශයෙන් අපි ස්ථිර කරනවා වාගේම ඇත්තටම හොඳ යෝජනාවක්. කාලෝචිත යෝජනාවක්. ගරු ප්‍රධාන ඇමැතිතුමා මීට පෙරත් යම් යම් ප්‍රාදේශීය සභාවල, නගර සභාවල, මහ නගර සභාවල දීමනා සම්බන්ධව කටයුතු කිරීම පිළිබඳව මම ස්තුතිය ප්‍රකාශ කරනවා. මමත් ප්‍රාදේශීය සභාවක හිටපු මන්ත්‍රීවරයෙක් වශයෙන් අද මේ සම්බන්ධව කථා කරනවා නම්, මෙතුමා මීට පෙර ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ වේතන සම්බන්ධවත්, දුරකථන සම්බන්ධවත්, දුරකථන බිල් සම්බන්ධවත්, ඒ වාගේම ණය සීමාවක් යටතේ මන්ත්‍රීවරුන්ට මෝටර් බයිසිකල් ලබා දීමට කටයුතු කිරීම සම්බන්ධව අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ කමිටුවලට ලබා දෙන රුපියල් 500 දීමනාව තවත් මුදලිකින් වැඩි කරන්න පුළුවන් නම් හොඳයි කියන හැඟීම අප තුළ තිබෙනවා. අපි ප්‍රාදේශීය සභාවේ ඉන්නකොට පරිසර කමිටුව වෙන්න පුළුවන්, කාර්මික කමිටුව වෙන්න පුළුවන්, මුදල් කමිටුව වෙන්න පුළුවන් ඒවාට මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය අඩුයි. එයට හේතුව මන්ත්‍රීවරුන්ට යම් මුදලක් දරාගෙන එම ස්ථානයට එන්න අමාරුකම තිබෙනවා.

අද ජනතාව අතර ඉන්න මන්ත්‍රීවරු තමයි මේ ප්‍රාදේශීය සභා, නගර සභා මන්ත්‍රීවරු කියන්නේ. ඒ උදවියට එම මුදල ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා වාගේම පුළුවන් නම් තව මුදලක් වැඩි කරලා සංශෝධනයක් කරන ලෙස අපි ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කරනවා දකුණු පළාත් සභාවේ ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා මන්ත්‍රීවරුන්ට ණය සීමාවක් යටතේ මෝටර් සයිකල් ලබා දුන්නා. මට දැන ගන්න ලැබුණා, Transport නැත්නම් රුපියල් 2500 ක් නැත්නම් රුපියල් 3000 ක දීමනාවක් ලබා දෙනවා. ඒ මෝටර් සයිකල් දීමනාවෙන් ඒක අඩු කර ගන්නවා. බස්නාහිර පළාත් සභාව කියන්නේ, ලංකාවේ තිබෙන ප්‍රධාන පළාත් සභාව. ඒ නිසා එවැනි දෙයක් ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් නාගරික මන්ත්‍රීවරුන්ට හොඳම ශක්තියක් ඇති වනවා. ඒ වාගේම මේ ස්ථානයේ ඉන්න රෙහෙන්සිරි වරාගොඩ ගරු මන්ත්‍රීතුමාත් ඒ සම්බන්ධයෙන් කථා කරයි. මම ඇත්තටම ඒ සම්බන්ධව සතුටු වෙනවා. ඒ සම්බන්ධවත් කටයුතු කරන්න පුළුවන් නම් ඒක අගය කරනවා. ඒ වාගේම නගර සභා, ප්‍රාදේශීය සභාවල දීමනා සම්බන්ධව කටයුතු කරනවා වාගේම අපේ බස්නාහිර පළාත් සභාවේත් දීමනාවක් තිබෙනවා මේ කමිටුවලට. ඒ දීමනාවත් වැඩි කරනවා නම් අගය කරනවා. නැත්නම් ඒ මුදල් දෙකම සමාන වෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඔබතුමා වරප්‍රසාද ගන්නද ඇවිල්ලා ඉන්නේ?

**ගරු යූ. ජෝර් පෙරේරා** – විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ මුදල් දෙකම සමාන වෙනවා. ඔබතුමාත් -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මම අහන්නේ ඔබතුමා මෙතැනට ඇවිල්ලා තියෙන්නේ වරප්‍රසාද ගන්නද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා වාඩි වෙන්න කෝ?

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

ගරු සභාපතිතුමනි, අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති සහ මන්ත්‍රීවරුන් වෙනුවෙන් ඒ ඒ කමිටුවලට සහභාගී වීම සඳහා අපේ අනුමැතිය සමග ප්‍රාදේශීය සභාවල ප්‍රතිපාදනවලින් දීමනාවක් හැටියට රුපියල් 500/- ක් ලබා දීම පිළිබඳව මා බලවත් සේ සතුටු වෙනවා. කැලණිය ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක්, උප සභාපතිවරයෙක් වශයෙනුත් ඒ කාලේ ඉඳලා අපි නහපු හඬක්. ඒ වාගේම බස්නාහිර පළාත් සභාවේ අගලවත්ත වැනි විශාල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක ඉන්න මන්ත්‍රීවරයෙකුට ගමනාගමනය වෙනුවෙන් රුපියල් 500/- නොවෙයි, රුපියල් 1000/- කට එහා ඉන්ධන සඳහා වියදම් වෙනවා කියලා මට කියලා තියෙනවා. ඒ නිසා මේ යෝජනාව ඉතාමත්ම කාලෝචිතයි. මෙය පළාත් සභා සමගාමී විෂයයක් හැටියට පළාත් පාලන යථාවත් කිරීම වෙනුවෙන් එහි මන්ත්‍රීවරුන්ගේ, මහජන නියෝජිතයින්ගේ අදහස් හා කැපවීම මීට වඩා දායක වීම ඉතාමත්ම වැදගත්. ඒ වාගේම මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට දුරකථන දීමනාව, කමිටු සඳහා සම්බන්ධ වනකොට ලැබෙන දීමනාව වාගේම සමහර ප්‍රාදේශීය සභාවල මන්ත්‍රීවරු සිටිනවා - මම මේ සඳහා අවධානය යොමු කරනවා. අයවැය විවාදයේදීත් අපි කථා කරමු. අවුරුදු 15 ක 20 ඉන්න මන්ත්‍රීවරු ඉන්නවා. පුදුම විධියට කැප වෙන පක්ෂ විපක්ෂ සියලු දෙනාම. ඒ වෙනුවෙන් යම්කිසි විශ්‍රාම වැටුපක් දිය යුතුයි කියන ඉල්ලීම තිබෙනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානය මේ සඳහා යොමු කරමින් මේ යෝජනාවට හිස නමා අචාර කරමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුන් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ මුදල් පියවනවාද?

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

පොදු අරමුදලින් ගෙවන්න පුළුවන්. මේ ගැසට් එකේ පැහැදිලි කරලා තිබෙනවා මුදල් ගෙවන්න පුළුවන් ආකාරය පිළිබඳව. අපේ මන්ත්‍රීවරුන් මේ මුදල් ප්‍රමාණය වැඩි කරන්න කිව්වත් පළාත් සභා මන්ත්‍රීවරයෙකුට උපදේශක කාරක සභාවකට සහභාගී වෙනවාට ගෙවන්නෙත් රුපියල් 500/- යි. ඒක මාසයකට එක්වරක් පමණයි. නමුත් මෙතැනදී උපරිමය හතර පාරකට මේ මුදල ගෙවන්න පුළුවන්. ඒ කියන්නේ, ඒ අය සහභාගී වෙනවා නම්. පළාතම නියෝජනය කරන මන්ත්‍රීවරු රුපියල් 500/- ක් ගන්නකොට තමන්ගේ ප්‍රාදේශීය සභා කොටස නියෝජනය කරන කෙනෙකුට මේ මුදල ප්‍රමාණවත් කියන එක මම විශ්වාස කරන්නේ. ඒ වාගේම ගමන් වියදම් දීමනා පිළිබඳව දකුණු පළාත් සභාවේ - ගරු සභාපතිතුමා මාර්ගයෙන් මේ සභාව දැනුවත් කරන්න ඕනෑ. මුළු ලංකාවේම ප්‍රථම වතාවට මෝටර් සයිකලයක් හෝ වාහනයක් ලබා දෙන්න පොලී රහිත ණයක් සම්බන්ධ කරලා අපි කටයුතු කළා. මේ වනකොට මන්ත්‍රීවරු 150 කට වැඩි ප්‍රමාණයක් මේ ණය මුදල් ප්‍රමාණය අරගෙන තියෙනවා. ඒ වාගේම මීට පෙර ඒ අයගේ ගමන් වියදම් දීමනාවත් අපි වැඩි කළා. එතකොට ඒ අයට පුළුවන් මේ මුදල් පාවිච්චි කරලා මේ ණය මුදල ගෙවාගෙන කටයුතු කරන්න. ඒ කාරණාව කිව්වේ

ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණාවට අදාළව. ඒ වාගේම විශ්‍රාම වැටුප් පිළිබඳව, දීමනා පිළිබඳව මන්ත්‍රීවරු නොයෙක් නොයෙක් අදහස් සෑම කාලයකම වකවානුවෙන් වකවානුවට ඉදිරිපත් වෙනවා. මම හිතන්නේ පළාත් සභා ක්‍රමය ආරම්භ කරලා මේ වනකොට අවුරුදු 24 ක් වෙනවා. තවම පළාත් සභා මන්ත්‍රීවරුන්ටවත් ඒ වාගේ වරප්‍රසාදය ලබා දෙන්න ක්‍රමවේදයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මම හිතන්නේ මේ පිළිබඳව පළාත් මට්ටමෙන් කථා කරනවාට වඩා ජාතික මට්ටමෙන් කථා කරලා ගත යුතු තීන්දුවක් කියලයි මා විශ්වාස කරන්නේ. ඒ නිසා මේ දීමනාවල් ලබා දෙනකොට මේක ගැසට් පත්‍රයේ පැහැදිලිව, ඉතාමත් සරල ආකාරයෙන් කරන ක්‍රමවේදය පිළිබඳව දැනුවත් කරලා තිබෙනවා කියන කාරණය මතක් කරනවා ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. එතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ රීති යෝජනා තුනම මේ අවස්ථාවේදී සභා සම්මත වූ යෝජනා වශයෙන් ප්‍රකාශ කර සිටිනවා. ඒ වාගේම එම රීති බස්නාහිර පළාත් සභාව අනුමත කර, ඒ අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කළ දින සිට වලංගුතාවය පවතිනවා.

**ගරු යූ. ජෝර්  පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief  Opposition Whip

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් වාගේම වරප්‍රසාදයක්. අපේ එකට ඉන්න සහෝදර භාෂා පරිවර්තකයෙකු වන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා මේකෙන් පස්සේ ඔබතුමා කථා කරන්න. මීළඟට අද දින න්‍යාය පත්‍රය අනුව ශෝක ප්‍රකාශ යෝජනා දෙකක් තිබෙනවා. පළමුවෙන්ම සුනිල් ජයමිණි ගරු සභානායකතුමාට අවස්ථාව හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී කේ.ඒ. ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කිරීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට.

# ශෝක ප්‍රකාශ යෝජනාව I : ගරු කේ.ඒ. ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා

## MOTION EXPRESSING CONDOLENCES I : HON. K.A. PREMATHISSA PERER, MEMBER

**ගරු සුනිල් ජයමිණී** – සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ පළාත් සභාවේ දෙවන පළාත් සභාවට පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්ව වසර හතරක (04) පමණ කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද, හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී කේ.ඒ. ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ වියෝව පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි."*

ගරු සභාපතිතුමනි, කඳනආරච්චියේ බස්තියන් පෙරේරා මහතාටත්, එමානෝනා පෙරේරා මහත්මියටත් දාව 1926 මාර්තු මාසේ 27 වැනිදා ප්‍රේමතිස්ස පෙරේරා ගරු මන්ත්‍රීතුමා මෙලොව ජන්ම ලාභය ලැබුවා. සහෝදර සහෝදරියන් දෙදෙනෙකු සිටින පවුලක එතුමා කුඩා කල පටන් හැදිලා වැඩිලා ප්‍රදේශයේ තිබුණු ඉතාමත්ම ජනප්‍රිය පාසලක් වන පන්නිපිටිය ධර්මපාල මහ විද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා අංශයෙන් එතුමා තමන්ගේ අධ්‍යාපන කටයුතු ආරම්භ කළා. පාසල් අධ්‍යාපනය නිමවීමත් සමග මම හිතනවා එතුමාටම ගැළපෙන වෘත්තියක් එතුමා තෝරා ගත්තේ. එතුමා ටයිම්ස් පුවත්පතේ සෝදුපත් කියවන්නෙක් හැටියට තමන්ගේ රැකියා ආරම්භ කරනවා තරුණ ජීවිතයත් එක්ක. ටයිම්ස් සමාගමට බැඳීමත් එක්ක එතුමාගේ ජීවිත කාලය තුළ දකින්නට ලැබුණු විප්ලවකාරී හඬ, ඒ වාගේම ටයිම්ස් ආයතනයේ සේවක වෘත්තීය සමිතියක් පිහිටුවලා ඒ ටයිම්ස් ආයතනය තුළ සේවකයන්ට මූලිකව ලබා දෙන්න පුළුවන් සියල්ල ලබා දෙන්නටත්, අසාධාරණයට, අයුක්තියට එරෙහිව පෙනී සිටින්නත් එතුමා තමන්ගේ තරුණ කාලයේදීම කටයුතු කළා. එසේ කටයුතු කරන අවදියේ 1950 වර්ෂයේදී දෙපානම පදිංචි කුසුමාවතී පෙරේරා මෙනෙවිය සමග තමන්ගේ යුග දිවිය ආරම්භ කරලා, විවාහ වෙලා ඉන් පසු මේ රටේ කවුරුත් ඉතාම ආදරයෙන් ගෞරවයෙන් සලකපු දේශපාලන ව්‍යාපාරයට එතුමා දායක වුණා. එතුමාගේ දේශපාලන කථාව ආරම්භ වන්නේ 1953 හර්තාලයත් එක්ක. 1953 හර්තාලයේදී එතුමා මේ රටේ වමේ දේශපාලන නායකයොත් එක්ක, රොබට් ගුණවර්ධන මැතිතුමා, පිලිප් ගුණවර්ධන මැතිතුමා, ඒ වාගේම එන්.එම්. පෙරේරා මැතිතුමා, කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා, ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා, ඒ වාගේම චන්ද්‍රා ගුණසේකර වාගේ මහත්වරුත් එක්ක එතුමා වමේ දේශපාලනයට සම්බන්ධ වෙලා 1953 හර්තාලයේ කොට්ටාව, මාලඹේ හා ඒ ප්‍රදේශවල නොමැකෙන නමක් තියපු සැබෑ නායකයෙක් බවට එතුමා පත් වුණා. 1953 හර්තාලයේදි එදා තමන්ගේ කාර්ය භාරය හරියට ඉටු කළාය කියන එක අදටත් ඒ ප්‍රදේශවල ජනතාව කථා කරන කාරණාවක්. ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා 1953 හර්තාලය නිම වීමත් සමඟම එහි ජයග්‍රහණ ජනතාවට ලබා දෙන්න කටයුතු කළා වාගේම ඉන් පස්සේ ප්‍රදේශයේ සමාජ සේවා කටයුතුවලට නිරන්තරයෙන්ම දායක වුණා. පළමුවෙන්ම එතුමා 1962 දී සභිකයෙක් හැටියට අතුරුගිරිය ගම් කාරක සභාවට තරග කළා.

තමන්ගේ පළමුවෙනි මැතිවරණය ජයග්‍රහණය කළ එතුමා, 1965 දී අතුරුගිරිය ගම් කාරක සභාවේ උප සභාපති හැටියට පත් වුණා. අපි දන්නවා. කැලණිවැලි මිටියාවතේ තිබුණේ, සම සමාජ ව්‍යාපාරය. ඒ වාගේම වමේ දේශපාලනය බොහෝ සේ තිබුණේ. පිලිප් ගුණවර්ධන, රොබට් ගුණවර්ධන, චන්ද්‍ර ගුණසේකර, විල්බට් සේනානායක වගේ උදවියත් එක්ක එතුමා ගම් සභාවෙන් ආරම්භ කරපු දේශපාලනය දිගටම කරගෙන ගියා. එතුමා ගම් සභාවේ උප සභාපතිවරයා හැටියට කටයුතු කරන අවස්ථාවේ අපි දන්නවා. ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා කිව්වාම හතරමං හංදිය, ඒ වාගේම අතුරුගිරිය ප්‍රදේශයේ, ඒ වාගේම මාලඹේ ප්‍රදේශයේ, ඒ වාගේම කොට්ටාව විද්‍යාල හංදියේ, ඒ වාගේම පන්නිපිටිය, කොට්ටාව වාගේ ප්‍රදේශවල කිසිම දේශපාලඥයෙකුට එතුමා වාගේ නමක් රඳවාගන්න බැරි වුණා. එතුමා පාරවල් කපලා, මං මාවත් එළි පෙහෙළි කරලා, ජනතාවට ගමන් කරන්න පුළුවන් හොඳ මාර්ග පද්ධතියක් හදන්න දැඩි වෙහෙසක් දැරුවා. කොට්ටාව ප්‍රදේශයේ දේශපාලඥයන් අතර එවකට තිබුණු කොට්ටාව මැතිවරණ කොට්ඨාශය තුළ එතුමාට ප්‍රබල නමක් රඳවාගන්න ඒ කාලයේ තමන්ගේ දේශපාලන ව්‍යාපාරයත් එක්ක සමත් වුණා.

ඉන් පසුව එතුමා අවස්ථා ගණනාවකදි මහරගම, හෝමාගම වගේ ප්‍රදේශවල, නගර සභාවල, ප්‍රාදේශීය සභාවන්වල, මහජන නියෝජිතයෙක් හැටියට කටයුතු කළා. අපිට මතකයි පළාත් සභා ව්‍යාපාරය ආරම්භ වනවිට ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා, මේ පළාත් සභා ව්‍යාපාරය මේ රටේ ක්‍රියාත්මක කරන්න සමසමාජ පක්ෂයත් එක්ක දැඩි වෙහෙසක් දරපු සහෝදරයෙක්. ඉන් පසුව දෙවැනි පළාත් සභාවට එතුමා තරහ කළා. මට මතකයි, දෙවැනි පළාත් සභාවට තරහ කරලා එතුමාට මේ පළාත් සභාවට ඇතුළු වෙන්න මුල් අවස්ථාවේදී අවස්ථාව නොලැබුණත්, බර්නාඩ් සොයිසා මැතිතුමා පාර්ලිමේන්තුවට යාමත් එක්ක එතුමාට අවස්ථාව ලැබුණා, දෙවැනි පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට තේරී පත්වෙන්න. පළාත් සභාවේ ඉන්න ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරු දන්නවා, අපේ යූසුප් මන්ත්‍රීතුමා මම හිතන්නේ එතුමාත් එක්ක කාලයක් කටයුතු කළා. පළාත් සභාව තුළ කවියක් කියලා, සභාව රස ගන්වලා, තමන්ගේ කථාව කවියෙන් කරපු මන්ත්‍රීවරයෙක් ඉන්නවා නම්, ඒ ප්‍රේමතිස්ස පෙරේරා මන්ත්‍රීතුමා. සමහරදාට අපි දකිනවා අයවැය විවාදයේදී එතුමාගේ කථාව වෙලාවේදී එතුමා කවි කිහිපයක් ගයලා කථාව අවසාන කරනවා. මොකද කවිය පිළිබඳව, කලාව පිළිබඳව එතුමාට පුදුම දැනීමක් තිබුණා. ඒ නිසා දෙවැනි පළාත් සභාවේ එතුමා අපිත් එක්ක කටයුතු කළා. මේ පළාත් සභාව තුළ පළාත් සභා මතය ඉදිරියට ගෙනෙන්න දැඩි වෙහෙසක් දරපු හොඳ මන්ත්‍රීවරයෙක් කියන එක මම මේ සභාවේදී ගෞරවයෙන් මතක් කරනවා.

ඒ නිසා ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා මම මතක් කරන්න ඕනෑ එතුමාගේ ආදරණීය පුත්‍රයා, ආනන්ද තිස්ස පෙරේරා මැතිතුමා තාත්තාගෙන් පස්සේ පළාත් සභාවට තරග කළා. ආනන්ද තිස්ස පෙරේරා මැතිතුමා දෙපාරක් මේ පළාත් සභාව ජයග්‍රහණය කරලා, තාත්තාගේ අඩුව පිරෙව්වා. පස්සේ හදිස්සියේ ආනන්ද තිස්ස පෙරේරා මැතිතුමා නැතිවුණත් අපි මේ වෙලාවේ මතක් කරන්නේ, ඒ ගරු මන්ත්‍රීතුමා නැති වුණත් මේ තාත්තා තමයි ඒ ආනන්දටත් ඒ දේශපාලනය කියලා දුන්නේ. ආනන්ද දෙපාරක් පළාත් සභාවට ආවා. ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා එක පාරක් පළාත් සභාවට ආවා. අපි දන්නවා, අද එතුමාගේ පවුලේ දූ දරුවෝ අට දෙනෙක් ඉන්නවා. දැන් මේ සභාවට ඇවිත් ඉන්නවා විමලතිස්ස පෙරේරා මැතිතුමා. ඒ වගේම අපේ හිටපු නාගරික මන්ත්‍රීතුමා. එතුමා කලක් විදේශගතව හිටියේ. නමුත් අද මේ සභාවේ ශෝක ප්‍රකාශ කරන අවස්ථාවේ ඉන්නවා. ඒ පවුලේ උදවිය මේ සභාවේ ඉන්නවා. කොට්ටාව ප්‍රදේශයේ අපි දන්නවා. විශේෂයෙන්ම, හතරමං හංදියේ, විද්‍යාල හංදිය වගේ ප්‍රදේශවල තමන්ගේ දේශපාලන ව්‍යාපාර තුළින් සත පහක්වත් හරි හම්බ කරගන්නේ නැතුව තමන්ගේ සියලු දේ දේශපාලනයට කැප කරලා දේශපාලනය කරපු සැබෑ දේශපාලන නායකයෙක් කියන එක මම මේ වේලාවේ ගෞරවයෙන් මතක් කරනවා.

ඒ නිසා ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා ජීවත්ව සිටි කාල සීමාව තුළ එදා සූරියමල් ව්‍යාපාරයෙන් දේශපාලනය ආරම්භ කරලා, ඒ දේශපාලන ගමන ලංකා සමසමාජ පක්ෂයත් එක්කමයි අවසාන කළේ. තමන්ගේ ප්‍රතිපත්තිය කවදාවත් වෙනස් කළේ නැහැ. තමන් පරාජයට පත් වුණත් තමන් හිටපු පක්ෂය ආරක්ෂා කරගෙන එතුමා මැරෙන තුරාවට කටයුතු කළා. සමහර අය දේශපාලන පක්ෂ මාරු කරනවා. නමුත් ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා සමසමාජ පක්ෂය තුළ මියයන තුරුම ඒ පක්ෂය ආරක්ෂා කරගෙන තමන්ගේ දේශපාලනය කළාය කියන එක මම ගෞරවයෙන් මතක් කරමින්, මම මීට වඩා වැඩි කාල වේලාවක් ගන්නේ නැහැ. බස්නාහිර පළාත් සභාවේ අපත් සමඟ සහෝදර පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට මේ පළාත් සභාවට විශාල ආදර්ශයක් ලබා දෙමින් ගරු ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා කටයුතු කළා. ඒක පළාත් සභාවේ අනෙකුත් මන්ත්‍රීවරුන්ට ආදර්ශයක් කියන එක සඳහන් කරමින් ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමාගේ පවුලේ සියලු දෙනා වෙත අපේ පළාත් සභාවේ සංවේගය යළිත් පුද කරමින් එතුමාට අපි ප්‍රාර්ථනය කරන ආකාරයට සසර අවසානයේ දි ශාන්ත අමාමහ නිර්වාණ සම්පත්තිය ලැබේවා කියමින් මම නිහඬ වෙනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, අපිත් එක්ක පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක් හැටියට ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමාව මම අඳුනගත්තේ දෙවැනි පළාත් සභාවේදී. එතුමා දෙවැනි පළාත් සභාවට එන අවස්ථාව වන විට අපේ පාලන යුගයේ පොඩි වෙනසක් ඇති වුණා. ඒ යුගයත් එක්ක එතුමා පක්ෂයක් හැටියටත් ඉඳගෙන කටයුතු කරපු මන්ත්‍රීවරයෙක්. සභාවට ලොකු ආදර්ශමත් මන්ත්‍රීවරයෙක් බව සඳහන් කළොත් නිවැරදියි.

අද වගේ සභාවක් නොවෙයි එදා තිබුණේ. ඉතාමත් විනයගරුකව අර කලින් කථා කරපු භාෂාවල් නැතිව හැමෝම මූලාසනයේ ගරුත්වය ඇතුව කටයුතු කළේ. එවකට හදිස්සියෙන් වගේ චම්මි ගුණවර්ධන මන්ත්‍රීතුමා මූලාසනය ගත්තා නම් මාත් එක්ක හිටපු අනිත් මන්ත්‍රීවරු දන්නවා මේ සභාවේ කිසිම හඬක් නැහැ. සියලු දෙනාම ඉන්නවාද කියලාවත් හිතන්න බැරි තත්ත්වයක ඉතා විනයගරුක සභාවක් තුළ විනයගරුකව තමන්ගේ දේශපාලන ගමන් මාර්ගය ආරම්භ කරපු කෙනෙක් හැටියට එතුමා නිහතමානි දේශපාලන දර්ශනයක් තුළ කටයුතු කිරීමට ප්‍රබල හේතුවක් තියෙනවා.

එතුමා කොළඹ දිස්ත්‍රික්කයේ වුණත් එතුමා ඉපදුනේ ගම් පළාත තුළ. නාගරික පරිසරයෙන් තොරව ඉතා ග්‍රාමීය පරිසරයක තමයි එතුමා තමන්ගේ ජීවිතය ආරම්භ කළේ. ඒ ජීවිත ගමන එසේ ආරම්භ කරලා තමයි දේශපාලන කටයුතුවලට බැස්සේ. ඒ ගම්වල තිබුණ ගැමි ගතිය එතුමාට පුළුවන් වුණා ගැමි ජනතාව වෙනුවෙන් දවසින් දවස සේවාවකට සම්බන්ධවෙලා ඒ ගැමි සුවඳත් එක්ක ඇවිල්ලා මේ සභාවේ වාඩිවෙලා කටයුතු කරන්න. එහෙම කරන්න පුළුවන් හැකියාවක් එතුමා නිර්මාණය කරගත්තා. ඉතිං ග්‍රාමීය දේශපාලනයෙන් ඇවිල්ලා වරින් වර දේශපාලන අ යන්න කියවලා, ප්‍රාදේශීය මට්ටමෙන් දේශපාලනයට ආව නිසා තමයි එතුමාට ක්‍රම ක්‍රමයෙන් පළාත් සභාවට ඇවිදින් වාඩි වෙන්න හැකියාව තිබුණේ. ප්‍රේමතිස්ස පෙරේරා මන්ත්‍රීතුමා ඒ ගමන් මාර්ගය තුළ විවිධ හේතුන් ගණනාවක් සම්බන්ධව තමන්ගේ දේශපාලන ප්‍රතිපත්තිය පාවා දුන්නේ නැහැ. කිසිම හේතුවක් නිසා වාසියකටවත්. වාසියකට හැරුණු නැතිව එදා සමසමාජ පක්ෂය දරපු ඒ ස්ථාවරය, පළාත් සභා ක්‍රමය මේ රටේ පැවතිය යුතුයි කියන ස්ථාවරය තුළ එදා එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු කාලේ ගෙනාව ප්‍රතිපත්තියට,

[ ගරු ඒ.එම්. යූසුෆ් ]

නැත්නම් ඒ පනතට සහයෝගය දීලා සමසමාජ පක්ෂය මේ රටේ පළාත් සභාවට තරග කළා. ඒ නිසා චම්මි ගුණවර්ධන, ඒ වාගේම අනිල් මූණසිංහ, ඒ වාගේම බර්නාඩ් සොයිසා වැනි ප්‍රභූවරු මේ සභාව නියෝජනය කරන විට දෙවැනි පළාත් සභාවට එතුමාට නියෝජනය වෙන්න පුළුවන් වුණා. එහෙම නම් මේ මන්ත්‍රීතුමා සභාව තුළ ඉඳගෙන තමන්ගේ ප්‍රදේශයේ අඩුපාඩුකම් කථා කළා වගේම තමන්ගෙන් ඉටුවිය යුතු සේවාව ඉතාම නිහතමානීව ඉටුකරන්න තරම් දක්ෂයෙක් හැටියටයි මේ සභාව තුළ එතුමා කටයුතු කළේ. විශේෂයෙන්ම අර මම කලින් කියපු ගැමි ගතිය තිබුණු නිසා තමයි එතුමාට ගැමියා පිළිබඳව, මිනිස්සු පිළිබඳව හදවතට තේරුණ කෙනෙක් හැටියට එතුමාට පුළුවන් වුණා, මේ සභාව තුළ තම දේශපාලන චරිතය නිර්මාණය කරගෙන යන්න. සමසමාජ පක්ෂයේ එතුමා ආරම්භයේදී තරුණයෙක් හැටියට ඉන්න යුගයේදී, වමේ අදහස් අරගෙන වාමාංශික කණ්ඩායමත් එක්කාසු කරගෙන පැමිණි ඒ කාලය තුළදී තමන්ගේ ප්‍රතිපත්තිය වෙනස් කළේ නැහැ. ජීවිතයේ සැඳෑ කාලය අවසාන වනතුරු මෙතුමා තමන්ගේ ප්‍රතිපත්තිය, එකම ප්‍රතිපත්තිය හැටියට අනුගමනය කළා. පාඩු, ලාභ, දේශපාලන වාසි අවාසි, දේශපාලන ජය පරාජය, මේ සියලු දෙයම දරාගෙන එතුමාට මේ ගමන් මාර්ගය තුළ රැඳී ඉන්න පුළුවන් වුණේ ඒ නිසා තමයි. එතුමාගේ දර්ශනය කොට්ටාව ප්‍රදේශය, හෝමගම වැනි ප්‍රදේශවල සහ කොළඹ දිස්ත්‍රික්කය තුළ පවා තිබුණු නිසා තමයි එතුමාගේ පුත්‍ර රත්නය ආනන්ද තිස්ස පෙරේරා මන්ත්‍රීතුමාට මේ සභාව නියෝජනය වෙන්න, ඔහුව එවන්න පුළුවන් වුණේ. තාත්තාගේ දේශපාලන ගමන් මාර්ගය නිවැරදිව, සමාජයට අභියෝගයක් නොවන විධියට ඒ නිර්මාණය කළාම පුතාටත් මේ සභාව නියෝජනය වෙන්න පුළුවන් වුණා. මේක වර්තමාන දේශපාලඥයෙකුට අභියෝගයක් හැටියට නොවෙයි, ආදර්ශයක් හැටියට ගන්න ඕනෑ.

අද මේ සමාජයේ සිදුවන සිදුවීම් දිහා බැලුවාම වර්තමාන දේශපාලඥයෝ බොහෝ දුරට ග්‍රාමීය මට්ටමේ ඉඳලත් ගම් සභාවේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුත් තමන් ජනාධිපති වරම අරගෙන වගේ, තමන් රජෙක් වාගේ හිතලා තමයි කටයුතු කරන්නේ. රාජ්‍ය තන්ත්‍රය, රාජ්‍ය බලය තමන්ගේ අතට අරගෙන කටයුතු කරන ඒ අය අද සමාජය තුළ ඉතා කෙටි කාලයක් තුළ පිරිහීමක් වෙනවා. සමහර දේශපාලඥයින්ගේ ක්‍රියා කලාපයන් ගැන අපි ලැජ්ජ වෙන්න ඕනෑ. දේශපාලඥයෝ හැටියට අපට හිතන්න වෙනවා. සමහරු බලය නිලය හිතේ තියාගෙන රජෙක් හැටියට ඉඳලා බලය නැති වුණාම - අද අපි දකිනවා සමහර ප්‍රදේශීය දේශපාලඥයෝ නිකන් බලයෙන් පහ වුණ තත්ත්වයක සමාජයේ කැත විධියට ජීවත් වුණ උදවිය බව. ඒ නිසා ප්‍රේමතිස්ස මන්ත්‍රීතුමා තමන්ගේ දරු පවුල සමග ඉතා හොඳ සමඟියෙන් ජීවත්වෙලා සමාජයට ආදර්ශ දෙන කෙනෙක් හැටියට පෙන්නුම් කළා වගේම, එතුමා මේ සභාවේ ඉතාම නිහතමානීව කටයුතු කරපු කෙනෙක් හැටියටත් සිහිපත් කරන්න කැමැතියි. ඒ වාගේම සමහර අවස්ථාවලදී එතුමා මේ සභාව රසවත් කළ අවස්ථා බොහෝමයක් තිබෙනවා. නිහඬව ඉන්න සභාවට එතුමා නැගිට්ටයින් පස්සේ කවියෙන් සංග්‍රහ කරලා, සභාව රසවත් කරලා මේ සභාව ප්‍රාණවත් කරපු මන්ත්‍රීවරයෙක් හැටියට මම දකින බව සන්තෝෂයෙන් මතක් කරන්න ඕනෑ. එහෙමනම් එතුමාගේ මේ ශෝකය වෙනුවෙන් එතුමාගේ පවුලේ උදවියටත්, මම විරුද්ධ පක්ෂ කණ්ඩායමේ මන්ත්‍රීවරයෙක් හැටියට ශෝකය ප්‍රකාශ කරන ගමන්ම එතුමා විශ්වාස කරන එතුමාගේ ආගමේ හැටියට එතුමාට නිවන් සුව අත්වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමාගේ ශෝක යෝජනාවට වචන කිහිපයක් එක් කිරීමට අවස්ථාවක් කරගන්නවා. විශේෂයෙන්ම මහරගම ප්‍රදේශයේ ජීවත් වුණු පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් මේ ශෝක යෝජනාව අද එක්කහු කරලා තිබෙන්නේ, විශේෂයෙන්ම ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා

මහරගම, කොට්ටාව, අතුරුගිරිය ඒ බල ප්‍රදේශයේ 1953 ඉඳන් ඉතාමත් දැවැන්ත දේශපාලන අරගලවලට මැදිහත් වෙලා, ගුටි කාලා, වමේ දේශපාලනය වෙනුවෙන් නොයෙක් ගැහැටකම් විඳලා, නමුත් ප්‍රතිපත්ති පාවලා නොදී අවංක දේශපාලනයේ නියැලෙමින් මේ වාමාංශික ව්‍යාපාරය ඉස්සරහට තල්ලු කරන්න කටයුතු කරපු දේශපාලන නායකයෙක්. විශේෂයෙන් පිලිප් ගුණවර්ධන මැතිතුමා, රොබට් ගුණවර්ධන මැතිතුමා යන පතාක යෝධයින් මේ රට නිවැරදි මාර්ගයකට ගෙනයන්න කටයුතු කළ මොහොතක තමන්ගේ ශ්‍රමය ධනය මිල මුදල් සියල්ල කැප කරලා එතුමා දැවැන්ත මෙහෙවරක් රට වෙනුවෙන් කරලා තිබෙනවා.

ඒ නිසා එහි ප්‍රතිඵලයක් ලෙස තමයි එතුමා පළාත් සභාවට පත්වුණේ. ඒ වගේම එතුමාගේ පුතා ආනන්ද තිස්ස පෙරේරා මැතිතුමාත් පළාත් සභාවට පත්වුණේ. ඒ වාගේම රණතිස්ස පුතා මහරගම නගර සභාවටත් පත්වුණේ. මේ සියලු තනතුරු දැරුවත් අබමල් රේණුවක සතයක් හොරකම් කරන්නේ නැතුව තමන්ගේ දැතේ මඩ තවරාගන්නේ නැතුව ඉතාමත් නිර්ව්‍යාජ ලෙස දේශපාලනයේ නියැලුණු පරපුරක් මේ ප්‍රේමතිස්ස මැතිතුමාගෙන් ආරම්භ වුණේ. විශේෂයෙන්ම අදත් එතුමන්ලාගේ හිඩැස මේ කොට්ටාව ප්‍රදේශයේ තිබෙනවා. රණතිස්ස පුතා මන්ත්‍රීවරයා වෙලා මන්ත්‍රීකමෙන් ඉල්ලා අස් වෙලා එතුමා ගියා. මේ මඩ ගොහුරුවේ එරී එතුමා දිගටම හිටියේ නැහැ. මේ මනාප ක්‍රමය තරයේම ප්‍රතික්ෂේප කරලා මේ තනතුරු අතහැරීම පිළිබඳ කිසිදු ගැටලුවක් ප්‍රේමතිස්ස මැතිතුමාටවත් එතුමාගේ දරුවන්ටවත් තිබුණේ නැහැ. විශේෂයෙන්ම, අපි සැලකිය යුතුයි තමන්ගේ තනතුරුවලට වඩා මහජනතාව වටිනවා කියන ස්ථාවරයේ ඉඳගෙන තමයි කටයුතු කළේ. අද අය වාගේ සමසමාජ පක්ෂය මාරු කළා නම් ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමාලා අද මේ රටේ ඇමතිවරු. එවැනි තත්ත්වයකට යන්න තිබුණා. නමුත් තමන්ගේ ස්ථාවරය එලෙසම රැකගෙන තනතුරට වඩා තමන්ගේ ප්‍රතිපත්තිය උතුම්කොට තමයි එතුමා සැලකුවේ. ඒ නිසා විශේෂයෙන්ම එතුමා මාධ්‍යවේදියෙක් වශයෙන් සහ කවියෙක් වශයෙන් මේ රටට දැවැන්ත මෙහෙවරක් කරලා තිබෙනවා. එතුමාගේ කවීත්වය, මම හිතන්නේ වසර ගණනාවක් එතුමා ප්‍රකාශ කරපු කවි, එතුමාගෙන් සාහිත්‍යයට වුණු සේවය අමතක කරන්න පුළුවන්කමක් නැහැ. කවි පොත් ගණනාවක් ලැස්තිකරලා තිබෙනවා. මම හිතන්නේ එතුමා ඒ කියවපු කවි ඒ මැතිවරණ වේදිකාවල නොයෙක් අවස්ථාවලදී කියපු ඉතාමත් අලංකෘත සංස්කෘතික වටිනාකමකින් යුත් කවි විශාල ප්‍රමාණයක් තිබෙනවා. හිටිවන කවි කීමේ හැකියාවක් එතුමාට තිබුණා. එතුමා කවි පරපුරක් කොට්ටාවෙන් බිහි කළා. එතුමාගේ ගෝලයෝ ගණනාවක් අද ශිෂ්‍යයන් වශයෙන් කොළඹ කවි සමාජයේ සහ එතුමාගේ සමස්ථ ලංකා කවි සමාජයේ සිටිමින් අද මේ ලංකාවේ කවියට පණ දෙනවා. ඒ නිසා මේ සියල්ල කළේ ප්‍රේමතිස්ස මැතිතුමා.

විශේෂයෙන්ම මහරගම ජනතාව වශයෙන් අපි විශේෂයෙන්ම මතක් කළ යුතු සිද්ධියක් තිබෙනවා. එතුමා ජීවත් වුණු හංදිය, බාර් හංදිය, තැබැරුම් හංදිය කියලා තමයි සියලු දෙනා හැඳින් වුයේ. මේ තැබැරුම් හංදිය විද්‍යාල හංදිය කළේ මේ ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා. එය සදා අනුස්මරණීය සිද්ධියක්. මෙය අමතක කරන්න පුළුවන්කමක් නැහැ. තැබැරුම් හංදිය විද්‍යාල හංදිය බවට පරිවර්තනය කිරීමේ නියමුවා එතුමා. එතුමාගේ ඉඳන් එතුමාගේ ගෙදර භාර්යාව, එතුමාගේ දරු පරපුර සියල්ල සහ එතුමාගේ සාමාජිකයෝ සියල්ල එකතුවෙලා ඒ තැබැරුම හංදිය විද්‍යාල හංදිය බවට පරිවර්තනය කළා. ඒ පරිවර්තනය සඳහා තමන්ගේ තිබුණ මිල මුදල්, ඉඩම් කඩම්, යාන වාහන විකුණලා මේ විද්‍යාලය ගොඩනගන්න කටයුතු කළා. ඒ සඳහා අවශ්‍ය ඉඩම් පරිත්‍යාග කරලා මේ සියල්ල ධනස්කන්ධය කැප කළේ තමන්ගේ ජීවිතයම කැප කළේ මේ තැබැරුම් හංදිය විද්‍යාල හංදිය බවට පත් කරන්න. අද එතුමා සැනසුම් සුසුම් හෙලුවා. අවසාන වකවානුව තුළදී මේ තැබැරුම හංදිය අයින් වෙලා විද්‍යාල හංදිය කරලා, හොඳ පාසලක් ගොඩනගලා, ඒ පාසල අද ඉතාම විශිෂ්ට ගණයේ පාසලක් බවට පරිවර්තනය කරලා තිබෙනවා. ඒ දිහා බලාගෙන එතුමා කිව්වේ මට වෙන මුකුත් ඕනෑ නැහැ පුතේ. මේක දිහා බලාගෙන මට ඉන්න පුළුවන්. ඒක තමයි මගේ සැනසීම කියලා එතුමා පහුගිය වකවානුවේ ප්‍රකාශ කළා. අපේ ආනන්ද තිස්ස සහෝදරයා මැරුණ වේලාවේ අපි කථා කර කර හිටියා, එතුමා ඒ වෙලාවෙත්, තමන්ගේ පුතා මැරුණත් මගේ පුතා අවංකව ජීවත්වෙලා නැතිවුණේ කියලා එතුමා සැනසුම් සුසුම් හෙලුවා.

ඒ නිසා විශේෂයෙන්ම මේ සමසමාජ ව්‍යාපාරයේ පන්නරය ලබපු එහි අඩි තාලම හොඳින් වටහා ගත්ත මේ සමාජයට කළයුතු මෙහෙවර මොකක්ද? මේ සමාජය පවතින්නේ කෙසේද? යන්න පිළිබඳව ඉතාමත් ගැඹුරු අධ්‍යයනයක් සිදු කරලා, ඒ පිළිබඳව විමර්ශනය කරලා, මේ සියලු දේශපාලන නායකයින් සමග උරෙනුර ගැටී කටයුතු කරලා මේ රට වෙනුවෙන් සේවය කරපු එතුමාට ඉතාමත් ගැඹුරු විඥාණයක් තිබුණා කියන එකත් අපි පැහැදිලිව පිළිගන්න ඕනෑ. ඒ නිසා එතුමන්ලාගේ ආභාසය ලබා, එතුමාගේ උපදෙස් අරගෙන අපි එතුමන්ලාගේ අඩිපාරේ ගිහිල්ලා මේ දේශපාලනයට පළාත් සභාවට තේරෙන්න එතුමන්ලා අපට විශාල පිටිවහලක් වුණා. ඉතින් එතුමන්ලා කරපු සේවය මෙසේ කියලා අවසන් කරන්න පුළුවන්කමක් නැහැ. නමුත් කොට්ටාවේ, මහරගම ප්‍රදේශයේ ජීවත් වෙන මනුස්සයෙක් වශයෙන් මට යුතුකමක් තිබෙනවා මේ සියල්ල කෙසේ වෙතත් කිහිපයක් හෝ මතක් කරන්න. විශේෂයෙන්ම මේ කොට්ටාව හංදියේ ඉඳන් ඒ දවස්වල අපි කුඩා සංදියේවත් පාරවල් තිබුණේ නැහැ. මේ සියලු පාරවල් සංවර්ධනය කරන්න අද වාගේ කටයුතු කළා නම්, වන්දි ගෙවලා දහස් ගණන් කෝටි ගණන් මිල මුදල් වියදම් කරන්න වෙනවා. නමුත් ප්‍රේමතිස්ස මැතිතුමාලා ගෙයින් ගෙට ගිහිල්ලා ඒ ජනතාවත් එක්ක සුහදශීලීව කථා කරලා ඒ කොට්ටාව හංදියේ ඉඳන් විද්‍යාල හංදිය හරහා අතුරුගිරියට වනකල් ඒ පාර නිර්මාණය කළේ එතුමා. ඒවාට සත පහක්වත් වියදම් කරලා නොවෙයි, එතුමන්ලා පෞද්ගලිකව දායක වෙලා තමන්ගේ ඉඩම ඉස්සෙල්ලා දීලා ප්‍රදේශයේ අයත් සම්බන්ධ

කරගෙන එලෙස මේ පාරවල් පුළුල් කරලා අද මෙවැනි මහා මාර්ග පද්ධතියක් නිර්මාණය කළා. කොට්ටාව තිබුණේ නැහැ. කොට්ටාවේ නිර්මාතෘවරයා ඇත්තටම ප්‍රේමතිස්ස මැතිතුමා. අද ජනාධිපතිතුමා කොට්ටාවට ඇවිල්ලා තමන්ගේ 2005 නාම යෝජනා අත්සන් කරන කොට, මේ ප්‍රේමතිස්ස මහත්මයාලා ඉදිකරපු කොට්ටාවේ තමයි එතුමන්ලා ඇවිල්ලා ඒ නාම යෝජනා අත්සන් කළේ. එතුමා එලෙස දැවැන්ත ඉතාමත් දූරදර්ශී විඥානයකින් යුතුව කටයුතු කරලා තිබෙනවා. ඒ සියලු පැවරීම් කරලා මේ කොට්ටාව නිර්මාණය කරන්න අවශ්‍ය ඉඩම් සියල්ල නොමිලයේ තමයි ලබා ගත්තේ. මුදල් වියදම් කරලා නොවෙයි. සියලු දෙනාගේම කැමැත්ත අරගෙන කටයුතු කළේ. තමන් ඉස්සෙල්ලාම පරිත්‍යාග කරලා, තමයි අනෙක් අයගේ ඒවා එක්කාසු කරගත්තේ. එවැනි සුහදශීලී සමාජ සේවකයෙක් ලෙස කටයුතු කරලා, අනාගත කොට්ටාව ගොඩනගන්න අවශ්‍ය ඉඩකඩම් භූමිය ඉතුරු කරලා ඒ ගම් කාරක සභාවේ පටන් ඉතාමත් දූරදර්ශී සැලැස්මක් අනුව මේ කොට්ටාව නිර්මාණය කිරීමේ සැලසුම එතුමා ක්‍රියාත්මක කරලා තමයි අද අවසන් ගමන් ගිහිල්ලා තියෙන්නේ.

ඒ නිසා අනාගතයේ ලංකාවේ ප්‍රධානම නගරයක් වන කොට්ටාව, මහරගමට වඩා ජනප්‍රිය වන කොට්ටාවේ නිර්මාතෘවරයා හැටියට මේ ප්‍රේමතිස්ස මැතිතුමා ඉතාමත් අමිල මෙහෙවරක් කරලා තිබෙනවා. එතුමා දේශපාලනික වශයෙන් වාමාශික ව්‍යාපාරයට දැවැන්ත මෙහෙවරක් කරලා තිබෙනවා. සමාජීය වශයෙන් සමාජයේ යටිතල පහසුකම් ගොඩනගන්න දැවැන්ත මෙහෙවරක් කරලා තිබෙනවා. කවියෙක් වශයෙන් මේ කලාවට දැවැන්ත මෙහෙවරක් කරලා තිබෙනවා. පියෙක් වශයෙන් තමන්ගේ දූදරුවන්ටත් රටටත් ඒ ආදර්ශවත් දරුවන් බිහි කරලා දැවැන්ත මෙහෙවරක් කරලා තිබෙනවා. ඒ නිසා එතුමාගේ ජීවිතය සාර්ථක ජීවිතයක්. මේ සාර්ථක ජීවිතය ගෙවන්නට

[ ගරු සලෝචන ගමගේ ]

එතුමාට අත්වැලක් වූ ඒ භාර්යාව ඇතුළු ඒ දරුවන්ට එතුමාගේ අභාවය වෙනුවෙන් මේ පළාත් සභාවේ ශෝකයත් විශේෂයෙන්ම 1983 අපේ පක්ෂ නායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් එතුමා ඉතාමත්ම අමිල මෙහෙවරක් කළා. එතුමා තමයි මුලු කොට්ටාව කලාපයම භාර අරගෙන 1983 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවත් සමග උරෙනුර ගැටිලා ඒ සියලු සටන්වලට මුහුණ දීලා 1983 මහජන එක්සත් පෙරමුණේ නායක දිනේෂ් ගුණවර්ධන මැතිතුමාව බලයට පත් කෙරෙව්වේ. ඒ නිසා ඒ මහජන එක්සත් පෙරමුණත් සමග දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සමඟ අඛණ්ඩව එදා ඉඳන් අද වනතුරු වාමාංශික දේශපාලනයේ සහයෝගයෙන් ගමන් කරලා මහරගම ප්‍රදේශයත්, කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙනුත්, සමස්ත ලංකා වාසීන් වෙනුවෙනුත් කළ ඒ අමිල මෙහෙවර නැවතත් සිහිපත් කරමින්, එතුමාගේ මේ අභාවය සියලු දෙනාටම පාඩුවක්. එතුමා ඒ කළ අමිල මෙහෙවර නැවත වතාවක් සිහිපත් කරමින් මේ ශෝක යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින්, එතුමාට අමාමහ නිවන් සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති රංජිත් සෝමවංශ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේ රත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [රංජිත් සෝමවංශ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Ranjith Somawansa] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා වෙනුවෙන් ශෝක යෝජනාව ඉදිරිපත් කරන මේ අවස්ථාවේ එතුමා වෙනුවෙන් වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මුලින්ම ස්තුති කරනවා. ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා බස්නාහිර පළාත් සභාව ලංකා සමසමාජ පක්ෂයෙන් නියෝජනය කරපු මන්ත්‍රීවරයෙකු හැටියට එතුමා තමන් ජීවත් වුණ කොට්ටාව ප්‍රදේශයට, එම ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් අමිල සේවාවක් කළ මන්ත්‍රීවරයෙක් හැටියට අපට විශේෂයෙන්ම සඳහන් කරන්න වෙනවා. එතුමා මෙම පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් වීමට පෙර අතුරුගිරිය ගම් සභාව තුළ ගම්සභා නියෝජිතයෙක් හැටියටත් එහි උප සභාපතිවරයා හැටියටත් 60 දශකයේ කටයුතු කරමින් එම ප්‍රදේශයේ යටිතල පහසුකම්, ඒ වගේම මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ගත හැකි සියලු කටයුතුවලදී නායකත්වයක් අරගෙන කටයුතු කරපු මන්ත්‍රීවරයෙක් හැටියට අපට විශේෂයෙන්ම සඳහන් කරන්න පුළුවන් වෙනවා. මීට කලින්ද සඳහන් වුණා වගේ වෙනත් කථික මහතුන් මගින් එතුමන් තමන් ජීවත් වුණු කොට්ටාව ප්‍රදේශය, ඒ වගේම අතුරුගිරිය ප්‍රදේශය වෙනුවෙන් එම ප්‍රදේශයේ යටිතල පහසුකම් දියුණු කරන්න, ඒ වාගේම වෙනත් සමාජ සේවා කටයුතු වෙනුවෙන් විශේෂයෙන්ම කටයුතු කළ මන්ත්‍රීවරයෙක් වෙනවා. එතුමා එම අතුරුගිරිය ප්‍රදේශයේ, විශේෂයෙන්ම මාර්ග සංවර්ධනය කිරීමේදී විශාල කාර්ය භාරයක් කළා. කොට්ටාව ප්‍රදේශයේ නාන ළිං, පොකුණු, සුසාන භූමි වැනි මෙවැනි පොදු කටයුතුවලදී එතුමා එම ප්‍රදේශය වෙනුවෙන් විශාල සේවයක් කරන්නට යෙදුණු මන්ත්‍රීවරයෙක් හැටියට අපි විශේෂයෙන් සඳහන් කරන්න වෙනවා. ලංකා සමසමාජ පක්ෂය නියෝජනය කරපු රොබට් ගුණවර්ධන මැතිතුමන්, ඒ වාගේම චන්ද්‍රා ගුණසේකර මැතිතුමන් වැනි මන්ත්‍රීවරුන් සමග එකට එකතුව එම ප්‍රදේශයේ දියුණුව

වෙනුවෙන් එතුමා ඒ කටයුතුවලදී නායකත්වයක් අරගෙන කටයුතු කළා. ඒ වාගේම ලංකා සමසමාජ පක්ෂයේ නායකයින් සමග ආචාර්ය එන්.එම්.පෙරේරා, කොල්වින් ආර්. ද සිල්වා වැනි නායකයින් සමග කිට්ටු සම්බන්ධතාවයන් තබා ගනිමින් ඒ අයගේ මග පෙන්වීම්, ඒ අයගේ නායකත්වයන් යටතේ තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් නොසැලී කටයුතු කළ මන්ත්‍රීවරයෙකු හැටියට අපට එතුමාව සඳහන් කරන්න පුළුවන් වෙනවා. එතුමා විශේෂයෙන්ම අපේ සලෝචන ගමගේ මන්ත්‍රීතුමා කිව්වා වගේ තැබෑරුම් හංදිය නමින් තිබුණු ප්‍රදේශය, එම හංදිය විද්‍යාල හංදියක් බවට පත් කිරීමට කටයුතු කිරීම එතුමාගේ එම පොදු කටයුතුවලදී දක්වපු ඇල්ම, ඒවායේදී වඩාත් සදාචාරාත්මක විධියට, වඩාත් ගුණාත්මක විධියට කටයුතු කරන්නට දක්වපු උනන්දුව එයින් පෙන්නුම් කෙරෙනවාය කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න වෙනවා. කොට්ටාව උතුර ධර්මපාල විද්‍යාලය ආරම්භ කරන්න එතුමා කටයුතු කළා වගේම එම විදුහල අද එම ප්‍රදේශයේ වැදගත් පාසලක් බවට පත් කරන්නත් එතුමාගේ කාලය තුළ එතුමා විශේෂයෙන්ම උනන්දුවෙන් කටයුතු කළා.

ඒ වාගේම උප තැපැල් කාර්යාලය ආරම්භ කිරීමටත් එතුමා නායකත්වය දීලා කටයුතු කළ මන්ත්‍රීවරයෙක් හැටියට අපිට විශේෂයෙන්ම සඳහන් කරන්න පුළුවන් වෙනවා. එතුමා ප්‍රදේශයට සේවාවක් කරනවා වාගේම මේ රටේ කම්කරු පන්තිය, නිර්ධන පන්තිය වෙනුවෙන් තමන් විශ්වාස කළ දේශපාලනය වෙනුවෙන්, මෙම සභාවට එතුමාගෙන් පසු එතුමාගේ පුත් ආනන්ද තිස්ස පෙරේරා මැතිතුමාවත් පත් කර එවීමට ඒ ප්‍රදේශයේ ජනතාව එදා කටයුතු කරන්න යෙදුනා. ඒ ආකාරයට තමන්ගේ පමණක් නොවෙයි තමන්ගේ පවුලේ පුතුන් ඇතුළු සියලු දෙනාත් මෙන්ම පොදු කටයුතුවලදී ප්‍රදේශය වෙනුවෙන්, ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කටයුතු කළ මන්ත්‍රීවරයෙක් හැටියට විශේෂයෙන්ම අපි ගරු කරන්න අවශ්‍ය වෙනවයි කියන එක තමයි විශේෂයෙන්ම සඳහන් කරන්න වෙන්නේ. අපි දන්නවා පළාත් සභා ක්‍රමය දහතුන්වෙනි සංශෝධනයත් එක්ක මේ රටට ඉතා පහසුවෙන් ලැබුණු අවස්ථාවක් නොවෙයි. බලය බෙදීම තුළ, පහළට බලය ගලාගෙන ඒම තුළ, ජනතාවට වඩාත් සේවාවක් ඇති කරන්න ඒ වගේම ජාතික ගැටලුවට විසඳීමක් හැටියට ඇතිවුණ මෙම පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරන්න එතුමා විශේෂයෙන්ම කටයුතු කළ කෙනෙක් හැටියට අපි විශේෂයෙන් සඳහන් කරන්න වෙනවා. අද දවසේ වුණත් පළාත් සභා ක්‍රමය පිළිබඳව යම් යම් අදහස් - මේක වඩාත් සුදුසු වෙන්නේ නැතය, මේක අහෝසි වෙන්න ඕනෑය කියන මතවාදයන් ඉදිරිපත් වෙන අවස්ථාවකදී විශේෂයෙන්ම එතුමා මෙම පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරන්න, ඒ වගේම මේ හරහා වඩාත් ජනතාවට සේවය කරන්න පුළුවන් අවස්ථාවක් හැටියට මේ පළාත් සභාව සලකමින්, තමන්ගේ දේශපාලන කටයුතු ඉදිරියට ගෙන ගිය මන්ත්‍රීවරයෙක් හැටියට අපට සඳහන් කරන්න පුළුවන් වෙනවා. එතුමා ඉතා හොඳ දූ පුතුන් බිහිකරලා මේ සමාජයට වැදගත් සේවයක් කරන්න ඒ අයව යොමු කරපු මන්ත්‍රීවරයෙක්. ඒ වගේම කවියෙක්, කලාකරුවෙක් හැටියට එතුමා සමාජයට එම කලාව පැත්තෙන් ඒ වගේම සංස්කෘතිය පැත්තෙන් විශාල සේවයක් සමාජයට කරපු මන්ත්‍රීවරයෙක් හැටියට අපට සඳහන් කරන්න පුළුවන් වෙනවා. එතුමා වෙනුවෙන් මෙම ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවේ ලංකා සමසමාජ පක්ෂය වෙනුවෙනුත්, ඒ වගේම අපගේත්, මේ සභාවේත් ශෝකය එතුමන්ගේ පවුලේ සියලු දෙනාට ප්‍රකාශ කරමින් බෞද්ධයින් වූ අපි එතුමන්ට නිවන් සුව අත්වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි අතර කාලයක් අපේ බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කළ අපේ ප්‍රේමතිස්ස මන්ත්‍රීතුමා, ඒ වගේම ආර්.පී. විජේසිරි මන්ත්‍රීතුමා මේ දෙදෙනාගේ ශෝක යෝජනාව අනුව ප්‍රේමතිස්ස මන්ත්‍රීතුමා අපේ ගමේ ඉපදුණු කෙනෙක්. මම කුඩා කාලයේ අපේ සමසමාජ පක්ෂය, මහජන එක්සත් පෙරමුණ, ඒ වගේම කොමියුනිට්ස් පක්ෂය වැනි වමේ දේශපාලන පක්ෂවල නායකයෙක් හැටියට තමයි අපේ ප්‍රේමතිස්ස මැතිතුමා කටයුතු කළේ. එතුමා එදා අතුරුගිරිය ගම් සභාවේ සභිකයෙක් හැටියට දේශපාලනය ආරම්භ කරලා 1953 ඇතිවුණ හර්තාලයේ - 1953 අපි ඉපදිලා අවුරුදු දෙක තුනක කාලයක් පමණ වෙන්නේ. මගේ තාත්තා මට කියලා දුන්නා, 1953 හර්තාලයේ ප්‍රේමතිස්ස මැතිතුමා තමයි ඒ හර්තාලය මෙහෙයවලා තියෙන්නේ. හයිලෙවල් පාරේ දෙල්කඳ හංදියේ ඉඳලා ඒ හර්තාලය දිගටම ගෙන ගියා. එතුමා ගම් සභා කාලයේ ඉඳලා අපේ ගමේ පොදු වැඩක් කිව්වා නම් මරණ ගෙයක් කිව්වා නම්, මඟුල් ගෙයක් කිව්වා නම්, තොවිල් ගෙයක් කිව්වා නම්, එතුමා ගිහිල්ලා කවියක් කියලා ඒ මඟුල් ගෙදර කටයුතුවලදී පවා මූලිකත්වය ගෙන උපදෙස් දෙමින් කටයුතු කළ චරිතයක් තමයි අපේ ප්‍රේමතිස්ස මැතිතුමා. අපේ මළගෙයක් වුණා නම් ඒ මරණ ගෙදරට ගිහිල්ලා ඒ පවුල ගැන කථා කරලා ඒගොල්ලන්ගේ ගුණ වර්ණනා කරලා ඔවුන්ට ශක්තියක් වුණා. එතුමාට මහා පුදුම හැකියාවක් ඒකට තිබුණා. එතුමා ඒ විතරක් නොවෙයි. අපේ ප්‍රදේශවල තිබුණු පොදු වැඩ, ඒ දවස්වල අපේ පළාත්වල තිබුණේ අඩි දෙකේ තුනේ කුඩා පාරවල්. ඒකට තමාගේ ශක්තිය දාලා විශාල පාරවල් බවට පරිවර්තනය කරපු කෙනෙක් තමයි අපේ ප්‍රේමතිස්ස මන්ත්‍රීතුමා. එතකොට එතුමා විතරක් නොවෙයි. එතුමාගේ දූ දරුවෝ මේ සමාජයට විශාල මෙහෙවරක් කරනවා. අපේ ආනන්ද තිස්ස සහෝදරයාත් මේ පළාත් සභාවට ඇවිල්ලා ඒ තාත්තාගේම අඩි පාරේ ගිහිල්ලා මහා කැප කිරීමකින් සමාජ සේවයක් කරපු කෙනෙක්.

මට මතකයි මම මේ පළාත් සභාවට ඇවිල්ලා පොඩි පාරක් පුළුල් කරන්න කටයුතු කළා. පොඩි බෝ ගහක් තිබුණා. මෙම බෝ ගහ පිළිබඳව ප්‍රේමතිස්ස මන්ත්‍රීතුමාටයි මටයි පැමිණිල්ල කළාම, පාර පළල් කරලා දෙන්න අද ඔය සිරස තියෙන පාර - වෙලක් උඩින් යන්න ඕනෑ. ඒ බෝ ගහ කපන්න ගමේ ඔක්කොම අය භයයි. ඒකට මම මොකක්ද කරන්න ඕනෑ

කියලා උපදෙස් පැතුවා. ප්‍රේමතිස්ස මන්ත්‍රීතුමා මට එක පාරටම කිව්වා. මන්ත්‍රීතුමා භය වෙන්න එපා. මේක කපුටු බෝ ගහක් කියලා හොඳ පූජාවක් තියමු. ගමේ මිනිස්සු උපාසක අම්මලා ඔක්කෝම ගෙනැල්ලා, කිව්වා මේක කපුටු බෝ ගහක්. ඒ නිසා පූජාවක් තියලා කපමු කියලා. ඒ විධියට ඒ ගමේ මිනිස්සුන්ව හරවලා ඒ කටයුතු කළා. ඒ පාර අද බස් යන මාර්ගයක් බවට පරිවර්තනය වෙලා තියෙනවා. ප්‍රේමතිස්ස පෙරේරා මන්ත්‍රීතුමා ගැන ඉතිහාසයේ අමතක වෙන්නැති දෙයක් තමයි එය. එතකොට මෙතුමා මේ සභාව ඇතුළේ ඕනෑම වෙලාවක කවියක් කියලා, රස ගන්වලා, සභාව සිනස්සලා, කුල්මත් කරලා එතුමාගේ කටහඬ පුදුම විදියට අපට සභාව ඇතුළේ දෙදුරුම් කන්න පුළුවන් චරිතයක් බවට පරිවර්තනය කරපු කෙනෙක් තමයි අපේ ප්‍රේමතිස්ස මන්ත්‍රීතුමා. දැන් එතුමාගේ දරුවා ඇවිදින් ඉන්නවා. එතුමාගේ දරුවා විදේශගත කරලා උගත්කම අරන් දීලා හොඳ සමාජ සේවකයන් බවට පත් කරලා එතුමා තම පුතාටත් මන්ත්‍රීකම ගන්න හැකි වන පරිදි කටයුතු කරලා එතුමාටත් විශාල සේවයක් අපේ ප්‍රදේශවලට කරන්න පුළුවන්කම ලැබුණා. එම නිසා අපේ ප්‍රේමතිස්ස මන්ත්‍රීතුමාට විශේෂයෙන් අපේ මහරගම ජනතාවගේ ශෝකයත් ඒ වාගේම මහරගම අපේ නගර සභාවේ නගරාධිපතිතුමිය ඇතුළු මන්ත්‍රීවරුන්ගේත් අපේ ශෝකයත් පුද කරමින්, සංසාර ගමනේ එතුමාට තවත් කොහේ හරි හොඳ තැනක ඉන්නවා නම් මේ පිං බලය ලැබිලා තවත් එතුමාගේ ශක්තිය වැඩි වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ පළාත් සභාව තුළ මන්ත්‍රීවරයෙක් සම්බන්ධව ශෝක යෝජනාව ගෙනෙන වෙලාවේ, ඒ මන්ත්‍රීවරු අතර සුවිශේෂ වූ මන්ත්‍රීවරයෙක් හැටියට ප්‍රේමතිස්ස පෙරේරා මන්ත්‍රීතුමාව නම් කරන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි, ප්‍රේමතිස්ස පෙරේරා මන්ත්‍රීතුමා පළාත් සභාවකට සීමා වුණු

[ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ]

මන්ත්‍රීවරයෙක් විතරක් නොවෙයි. එතුමා මේ රටේ යම් පරිවර්තනයක් කිරීමේ කාර්ය භාරයක් ඉෂ්ට කළ, ප්‍රබල දායකත්වයක් ලබා දුන් පුද්ගලයෙක් හැටියට නම් කරනවා නම් මම හිතන්නේ ඒක හරි වැදගත් කියලා. මොකද, මේ රටේ 1953 හර්තාලයත් එක්ක මේ රටේ අධිරාජ්‍යවාදී බලවේගයන්ට එරෙහිව තමන්ගේ දේශපාලන ගමන ආරම්භ කරලා, ඒ තමන්ගේ දේශපාලන ප්‍රතිපත්තිය මියැදෙන තුරාවට වෙනස් නොකරපු සුවිශේෂ ගණයේ ප්‍රතිපත්ති ගරුක දේශපාලඥයෙක් හැටියටයි මම ප්‍රේමතිස්ස පෙරේරා මන්ත්‍රීතුමා දකින්නේ. බොහෝ අභියෝගකාරී අවස්ථාවන්, දුෂ්කර අවස්ථාවන් එතුමාගේ දේශපාලන ජීවිතය තුළ අපි දකිනවා. එතුමාට ඒ අභියෝගයන්ට නොසැලී මුහුණ දෙන්න ආත්ම ශක්තියක් තිබුණා. ඒ අභියෝගයන් හමුවේ තමන්ගේ දේශපාලන ප්‍රතිපත්ති වෙනස් නොකරපු, ඒ සමාජ පරිවර්තනයන් කිරීමට තමන්ගේ දේශපාලන බලය උපරිම ලෙස දායක කළ, සුවිශේෂ ගණයේ දේශපාලඥයෙක්. ඔහු පාරවල් හැදුවා කිව්වා. ඔහු විවිධ සංවර්ධන කටයුතුවලට දායක වුණා කිව්වා. ඊට එහා ගිය දැවැන්ත දේශපාලන පුරුෂයෙක් හැටියට ප්‍රේමතිස්ස පෙරේරා මන්ත්‍රීතුමාව අපට නම් කරන්න පුළුවන්. එතුමා 50 දශකයේ ඒ 60 දශකයේ හර්තාලයෙන් ආරම්භ කළ අධිරාජ්‍ය විරෝධී අරගලය තුළ මේ රටේ ප්‍රගතිශීලී කඳවුරු ශක්තිමත් කරමින් මේ රටේ ප්‍රගතිශීලී ජනතාව අපේක්ෂා කළ ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් තමන්ගේ වගකීම හරියාකාරව ඉටු කරපු දේශපාලන නියෝජිතයෙකු නිසා තමයි එතුමා මේ පළාත් සභාව නියෝජනය කරන්න, පළාත් සභා මන්ත්‍රී ධුරයකට යනකල් ගමනක් ආවේ.

විශේෂයෙන්ම 13 වන ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව රට තුළ විශාල සංවාදයක් පවතින යුගයක ප්‍රේමතිස්ස පෙරේරා මන්ත්‍රීතුමා වැනි මන්ත්‍රීවරු පිළිබඳව විශේෂයෙන්ම කථා කරන්න ලැබීම මම හිතන්නේ, මේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳවත් කෙරෙන කතිකාවතට යම් දායකත්වයක් ලැබෙනවායි කියලයි. මම විශ්වාස කරන්නේ. මොකද මේ පළාත් සභාව කියන 13 වන ව්‍යවස්ථා සංශෝධනය මේ රටේ මල් වට්ටියක තියලා ලබා දුන්න දෙයක් නොවෙයි. අද පළාත් සභාව තුළ මේ රටේ ජනතාවට යම්කිසි සේවාවක් කළාය කියලා අපි උදම් අණනවා නම්, පළාත් සභාවක් තුළින් මේ රටේ ජනතාවට යම් කිසි දෙයක් සිද්ධ වුණාය කියලා අපි විශ්වාස කරනවා නම්, මේ ක්‍රමය මේ සමාජය තුළ ස්ථාපිත කරන්න දායක වුණ, කැපවුණ, තමන්ගේ ජීවිතය උකස් කළ පුද්ගලයෙක් තමයි ප්‍රේමතිස්ස පෙරේරා මන්ත්‍රීතුමා කියන්නේ. මොකද, 1988 මැතිවරණය එතුමා තරඟ නොකළා වෙන්න පුළුවන්. නමුත් 1988 මැතිවරණයෙන් මේ පළාත් සභා ක්‍රමය තුළ - පළාත් සභාව පිහිටුවලා, පළාත් සභාව ස්ථාපිත කරමින් ඒ පළාත් සභාව සඳහා ප්‍රගතිශීලී කඳවුරේ නියෝජනයක් ලබා දෙන්නට අපේ සහෝදර දේශපාලන පක්ෂයක් හැටියට ලංකා සමසමාජ පක්ෂය එක්සත් සමාජවාදී පෙරමුණ හැටියට අපි එදා ගෙන ගිය ඒ මැතිවරණ ව්‍යාපාරයේ ප්‍රධාන සෙන්පතියෙක් වුණේ මේ හෝමගම, කඩුවෙල, කොට්ටාව, මහරගම, කියන ප්‍රදේශවල ලංකා සමසමාජ පක්ෂය වෙනුවෙන් එක්සත් සමාජවාදී පෙරමුණේ ශක්තිමත් නායකත්වයක් ලබාදුන් කෘතහස්ත දේශපාලඥයෙක් හැටියට මෙතුමා මට නම් කරන්න පුළුවන්. මොකද එදා විවිධ කඳවුරුවලින් බාධාවන්, තර්ජනයන්, ජීවිතය පිළිබඳව තර්ජනයන් තිබියදී ඒ සියලුම අභියෝගයන්ට මුහුණ දෙන්න ආත්ම විශ්වාසයක්, ආත්ම ශක්තියක් ප්‍රේමතිස්ස පෙරේරා මන්ත්‍රීතුමාට තිබුණා. එතුමාට ඒ සඳහා තරුණ ජවයක් තිබුණු තමන්ගේ පුතුන්ගේ සහාය ලැබුණා. ඒ නිසාම එතුමාගේ පුත්‍ර රත්නයක් වූ ආනන්ද තිස්ස පෙරේරා මන්ත්‍රීතුමාට මේ පළාත් සභාව නියෝජනය කරන්න හැකියාවක් ලැබුණා. මේ හැම කෙනෙක්ම මේ ප්‍රේමතිස්ස පෙරේරා මන්ත්‍රීතුමා තමන්ගේ වාම දේශපාලනය නිවැරදිව ප්‍රතිපත්ති ගරුකව මේ සමාජය තුළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල ගැන කථා කළා. එතුමා විසින් කරපු දෙයට පමණක් නොවෙයි, එතුමා සම්බන්ධ වෙලා, එතුමා දායක වෙලා මේ රටේ

ගත්තාවූ ප්‍රතිපත්තිමය තීන්දු මත අද රටේ ජනතාවට යම්කිසි වරප්‍රසාදයක්, සෙතක්, සේවයක් වෙනවා නම්, ඒ සියල්ලේම ගෞරවය ප්‍රේමතිස්ස මන්ත්‍රීතුමාත් ලැබිය යුතු කොටස්කරුවෙක් කියලයි මම විශ්වාස කරන්නේ.

ඒ නිසා ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා අපි විශ්වාස කරන ධර්මතාවයන්ට අනුව අපි කවුරුත් දන්නා දේ අනුව උපදින සෑම සත්වයෙකුටම උරුමවන මරණයට - ඒ සියලුම කටයුතු අවසන් කරලා වයෝවෘද්ධතාවයට පත් වුණාට පස්සේ එතුමාටත් ඒ ස්වභාවික මරණයට මුහුණ දෙන්නට සිද්ධ වුණා. හැබැයි මිනිස්සු උපදිනවා වගේම මිනිස්සු මැරෙනවා වගේම මිනිස්සු ජීවත්වෙලා ඉන්න කාලය තුළ මේ සමාජය තුළ යම් දෙයක් කරනවා නම්, ඒ මිනිසා නොමැරී ජීවත් වෙනවා කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා ප්‍රේමතිස්ස පෙරේරා මන්ත්‍රීතුමාගේ ජීවිතය අවසන් වුණත්, එතුමා මේ සමාජයට දෙන ලද මෙහෙවර අවසන් වෙලා නැහැයි කියන කාරණය මම මතක් කරලා කියන්න ඕනැ. මොකද එතුමා නවත්වපු තැන ඉඳලා ඉස්සරහටත් එතුමා ආරම්භ කරන්න දායක වුණු, එතුමා සේවය කරන්නට කැප වුණු ප්‍රතිපත්ති මාලාවන් ඉදිරියටත් ගෙනයමින් මේ රට තුළ යම් කාර්ය භාරයක් මේ වන විටත් සිදු වෙනවා. පළාත් සභාවන් තුළ යම් දෙයක් අපි කරනවා නම්, ඒ හැම දෙයකදීම මේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරන්න පිහිටුවන්න දායක වුණ හැම කෙනෙකුගේම දායකත්වය ඉතාමත් සුවිශේෂ වූ දායකත්වයක් කියලයි මම විශ්වාස කරන්නේ. ඒ නිසා එවැනි මහඟු දේශපාලනයකට දායක වුණු, ලංකා සමසමාජ පක්ෂය නියෝජනය කරමින් මේ සභාව අර්ථාන්විත සභාවක් කරන්න දායක වුණු ප්‍රේමතිස්ස පෙරේරා මන්ත්‍රීතුමාගේ අභාවය පිළිබඳව අපි ශෝක වෙනවා වගේම මම එතුමාගේ පවුලේ ඒ ආදරණීය බිරිඳ එම මැතිණිය ඒ වගේම ආදරණීය දරුවන් ඇතුළු පවුලේ සියලු දෙනාට මාගේ පෞද්ගලික ශෝකයත් මා නියෝජනය කරන ශ්‍රී ලංකා මහජන පක්ෂයේ ශෝකයත් ඔබතුමා මඟින් පුද කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අභාවප්‍රාප්ත ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමාගේ ශෝක යෝජනාව සාකච්ඡා කරන මේ වෙලාවේ එතුමාගේ පවුලේ අය වෙත ශෝකය ප්‍රකාශ කරන්නට මේ අවස්ථාව ලැබීම ගැන අපි විශේෂයෙන් සතුටු වෙනවා. සතුටු වෙන්න කාරණය තමයි මේ වගේ පොදුජන නායකයෙක් ගැන කථා කරන්න ලැබුණු එක දේශපාලඥයෙකුට වාසනාවක් වන නිසා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා, කැලණි මිටියාවතේ තමයි වාම දේශපාලනය මතු වුණේ. එදා හිරු නොබසින අධිරාජ්‍යය වෙව්ලුවාලන්නට හැකි වාම නායකයෝ කැලණි මිටියාවතෙන් තමයි බිහිවුණේ. වාමාංශික ව්‍යාපාරයේ තොටිල්ල විධියට එදා හැඳින්වුණේ බොරළුගොඩ ප්‍රදේශය. බොරළුගොඩින් මතුවුණ වාම නායකයෝ මේ රටේ අහිංසක දුක් විඳින මිනිස්සුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කළා විතරක් නොවෙයි, ලෝකයේ බොහෝ රටවල්වල තිබුණු අධිරාජ්‍ය විරෝධී අරගලවලට සම්බන්ධ වුණ නායකයෝ බවට පත් වුණා. එදා ඒ නායකයොත් එක්ක තමන්ගේ දේශපාලන දිවිය ආරම්භ කළ නායකයෙක් විධියට තමයි ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමාව අපි හඳුනා ගන්නේ. ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා වාම දේශපාලනයෙන් පන්නරය ලබපු කෙනෙක්. වාම දේශපාලනයේ අත් පොත් තැබූ කෙනෙක්. ඒ වාගේම සමාජ අසාධාරණය වෙනුවෙන් සටන් කිරීමේ දේශපාලන කලාව තමන්ගේ දේශපාලන න්‍යාය බවට පත් කරගත්ත කෙනෙක්. ඒ නිසා ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා වාගේ දේශපාලඥයෝ නැතිවෙන එක මම හිතන්නේ මේ රටේ අභාග්‍යයක්, අවාසනාවක් විදිහට තමයි අපි දකින්නේ.

එතුමා ඉපදුනේ 1926 මාර්තු මාසයේ 27 වෙනිදා. එතුමා අධ්‍යාපනය ලැබුවේ, පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ, ලංකාවේ කීර්තිමත් විද්‍යාලයක ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය හදාරලා තමයි එතුමා ටයිම්ස් පුවත්පතට සෝදුපත් කියවන්නෙක් විදියට එකතු වුණේ. මම හිතන්නේ, සෝදුපත් කියවන්නෝ විධියට එකතු වුණු මිනිස්සු භාෂාව ගැන හසල දැනීමක් තියෙන මිනිස්සු විධියට තමයි අපි හඳුනගෙන තියෙන්නේ. සෝදුපත් කියවන්නෙක් වෙන්න බැහැ භාෂාවක් අතපත ගාපු කෙනෙකුට. ඒ නිසා අපි විශ්වාස කරනවා ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමාට සිංහල භාෂාව වගේම ඉංග්‍රීසි භාෂාවෙත් හසල දැනුමක්, අත්දැකීමක් තිබුණ භාෂා විශාරදයෙක් බවට පත් වූ අයෙක් බව. එතුමන්ට ඒ නිසා තමයි එකල ජනමාධ්‍ය කලාවේ සෝදුපත් කියවන්නෙක් විධියට තමන්ගේ ජීවිතය ආරම්භ කරන්න පුළුවන් වුණේ. ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා ඉස්සෙල්ලාම අතුරුගිරිය ගම් සභාවට තමයි තේරී පත්වුණේ. අතුරුගිරිය ගම් සභාවේ නියෝජිතයෙක් විධියට, ඉතාම දුෂ්කරව තිබුණ ප්‍රදේශයක් අතුරුගිරිය ප්‍රදේශය. පාරවල් නැතුව, පාලම්, බෝක්කු, කාණු නැතිව ඉතාම දුෂ්කරව තිබුණ ප්‍රදේශයක් සංවර්ධනය කරන්න තමන් දුන් දායකත්වය මත ජනතා ප්‍රසාදයක් ජනප්‍රියත්වයක් අරගෙන තමයි එතුමා පළාත් සභාවට එන්න අවස්ථාව උදා කර ගත්තේ. 1988 පළාත් සභාව බිහි වුණු යුගය ගැන රේණුක පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා. ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා එදා දේශපාලනය කළේ, ඒ දේශපාලන පරිසරය තුළ. 1988 පළාත් සභාව මේ රටේ පිහිටුවන කොට අපි දන්නවා රටේ තිබුණ දේශපාලන වාතාවරණය මොකක්ද කියලා. එදා පළාත් සභාවට තරඟ කළ අය, පළාත් සභාවට ඡන්දය දීපු අය, පළාත් සභා මැතිවරණයට සහයෝගය දුන් දේශපාලන ක්‍රියාකාරීන්ට, සියලු දෙනා මරණ වරෙන්තුව අතේ තියාගෙන තමයි දේශපාලන කළේ. ඔබතුමා දන්නවා ඒ පිළිබඳව. ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා මේ අභියෝගයන් සියල්ල අතේ තියාගෙන තමයි දේශපාලනය කළේ.

1988 එතුමාට තරඟ කරන්න බැරි වුණා. නමුත් 1993 පළාත් සභා මැතිවරණයට තරඟ කළාට එතුමා 1993 වසරේ පළාත් සභාවට තේරුණේ නැහැ. එතුමාට සිද්ධ වුණා බර්නාඩ් සොයිසා

මැතිතුමා පළාත් සභාවෙන් එළියට ගියාට පස්සේ ඒ පුරප්පාඩු හරහා පළාත් සභාවට එන්න. 1988 ත් 1993 ත් තිබුණු පළාත් සභා දෙක පළාත් සභා ඉතිහාසයේ ස්වර්ණමය යුගය විධියට තමයි අපි දකින්නේ. ඒ පළාත් සභා නියෝජනය කළ ජනතා නායකයෝ මේ පළාත් සභාව, ලාංකීය දේශපාලනය, ඒ වගේම පළාත් සභාව හරහා ජනතාවට අත්වෙන්න තියන වරප්‍රසාද අත් කරලා දෙන්න මහන්සි වුණු දේශපාලන නායකයෝ. ඒ අයට වෙන න්‍යාය පත්‍ර තිබුණේ නැහැ. ඒ අයට දේශපාලනමය න්‍යාය පත්‍රයක් තිබුණේ. ඒ අයට ජනතා සේවය මිසක වෙනත් සේවාවන් පිළිබඳ අපේක්ෂාවක් තිබුණේ නැහැ. ඒ නිසා ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා එදා 1993 පිහිටුවපු දෙවන පළාත් සභාවේ ඉතාම කෘතහස්ත, පරිනත දේශපාලඥයෙක් විධියට තමන්ගේ දේශපාලන වගකීම ඉෂ්ට කරනු ලැබුවා. ඒ වගේම එතුමා ඉතාම වැඩදායී දරුවෝ අට දෙනෙක් සමාජයට දායාද කළා. ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා ඉතාම වටිනා දරුවෙක් හැදුවා, ආනන්ද තිස්ස පෙරේරා මැතිතුමා. එතුමාත් මේ පළාත් සභාව කාලයක් නියෝජනය කළා.

ඒ නිසා ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා තමන්ගේ වගකීම හමාර කරලා ඒ සමාජ වගකීම තව ඉස්සරහට ගෙනයන්න පුළුවන් දූ දරු පරම්පරාවකුත් හදපු දේශපාලන නායකයෙක්. ඒ වගේම ඒ අයටත් තමන්ගේ දේශපාලන ප්‍රතිපත්තිය, තමන්ගේ දේශපාලන සම්ප්‍රදාය, තමන්ගේ දේශපාලන සටන් ක්‍රම විධි සියල්ල දායාද කරලා දුන්නා. ඒ අය කවදාවත් පක්ෂය මාරු කළේ නැහැ. පිළ් මාරු කළේ නැහැ. තමන්ගේ දේශපාලන දර්ශනය පාවලා දුන්නේ නැහැ. ඒ නිසා තමයි මේ ප්‍රතිපත්ති ගරුක දේශපාලඥයෝ රටට ඉන්න එකේ වැදගත්කම තියෙන්නේ. අද අපේ රටේ දේශපාලනය ගැන කථා කරන කොට තමයි මෙවැනි දේශපාලඥයින්ගේ අඩුව අපට දැනෙන්නේ. මේ රටේ දේශපාලනය අද කොයි තරම් පහළට ගිහින්ද කියලා දේශපාලනය ගැන ගවේෂණය කරන මිනිස්සු හඳුන ගන්නවා. මොනතරම් පල්ලෙහාට දේශපාලනය ගිහිල්ලද? කිසිම ප්‍රතිපත්තියක් නැතුව මුදලට තමන්ගේ පක්ෂය මාරු කරලා දේශපාලනය මාරු කරලා, ඒක හරහා සමස්ත රටට සමාජයට

[ ගරු මහේෂ් අල්මේදා ]

අත්කරලා දෙන ශෝක ජනක ඉරණම රටකට කොයි තරම් අභාග්‍යයක්ද කියන එක අපි මේ කාලයේ අත් විඳිනවා, අපේ රටේ දේශපාලනයෙන්. එවැනි පරිසරයක තමයි ප්‍රේමතිස්ස පෙරේරා වාගේ දේශපාලඥයන්ගේ වටිනාකම රටට දැනෙන්නේ. ඉපදෙන මිනිස්සු මැරෙනවා තමයි. හැබැයි මේ වගේ වටිනා මිනිස්සු මැරෙන එක සමාජ ඛේදවාචකයක්. ඒ නිසා ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමාගේ අභාවය අපි විශ්වාස කරන්නේ, සමාජයට අත් වුණු ඛේදවාචකයක් විධියටයි. මේ සමාජයට අවශ්‍යම කරන වේලාවක දේශපාලනය තේරෙන අහිංසක දුක්විඳින මිනිස්සු වෙනුවෙන්, කථා කරන්න මිනිස්සු නැති යුගයක, එවැනි වේදිකාවක් හදාගන්න බැරි යුගයක ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා වගේ දේශපාලඥයින්ගේ සේවය මේ රටට අවශ්‍ය වෙනවා. එවැනි කාලයක තමයි එතුමා සමුගන්නේ. ඒක තමයි ඒ මරණය හමුවේ තිබෙන ශෝකය. නමුත් අපි විශ්වාස කරන්නේ ප්‍රේමතිස්ස මැතිතුමා තමන්ගේ සමාජ වගකීම හමාර කරලා තමයි ජීවිතයෙන් නික්ම යන්නේ. ඒ නිසා අපට සතුටු වෙන්න පුළුවන්. ජීවත් වුණු කාලය තුළ සමාජ අසාධාරණය වෙනුවෙන් කටයුතු කරලා, සටන් කරලා, අරගල කරලා මිනිස්සුන්ගේ අයිතිවාසිකම් දිනා දෙන්න කටයුතු කරලා, තමන්ගේ සමාජ වගකීම හමාර කරලා තමයි ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා සමාජයෙන් නික්මෙලා යන්නේ. ඒ නිසා ඒ සතුට අපට භුක්ති විඳගන්න පුළුවන්කම තියෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වෙලාවේ ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමාගේ අභාවය වෙනුවෙන් විශේෂයෙන් අපි නියෝජනය කරන ශ්‍රී ලංකාවේ කොමියුනිට්ස් පක්ෂයේ ශෝකයත් සමස්ත පළාත් සභාව තුළ ජීවත්වන සියලු දෙනාගේ ශෝකයත් ඒ පවුල වෙත එකතු කරමින්, අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තූතියි. මම හිතන්නේ අපි අද ඉතාම කෘතහස්ත ඒ වගේම මේ සභාව තුළත් විශේෂයෙන් කොට්ටාව ප්‍රදේශයේ විතරක් නොවෙයි, මම හිතන්නේ අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ කැළණි මිටියාවතේ, ඒ වගේම හේවාගම් කෝරළයේ ඉතාම ජනාදරයට පත්වුණු ප්‍රේමතිස්ස පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ ශෝක යෝජනාව අද දවසේ ගැනුනේ. විශේෂයෙන්ම මම ස්තූතිවන්ත වෙනවා, අපේ ගරු සභානායක සුනිල් ජයමිණි මැතිතුමාට. ඒ වාගේම රේණුක පෙරේරා අපේ ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට. ඒ වාගේම උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාට. ඒ වාගේම ප්‍රේමතිස්ස පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ සමකාලීනයෙක් බදු ඒ.එම්. යුසුප් ගරු මන්ත්‍රීතුමාට. ඒ වාගේම සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාට. ඒ වාගේම ලංකා සමසමාජ පක්ෂය නියෝජනය කළ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාට. ඒ වාගේම අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට. මේ සියලු දෙනා ඉතාම වැදගත් අදහස් රාශියක් මේ සභාවට යොමු කළා. මම හිතන්නේ එතුමාගේ ජීවිතයේ අද දවසේ බස්නාහිර පළාත් සභාවේ ගෞරවය හා ශෝකය පළ කරන වෙලාවේ එතුමා වෙනුවෙන් අපේ සියලු දෙනාටම අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව නොලැබුණත්, අප සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා හදවතින් එතුමාගේ මේ ගෞරවය හා ශෝකය පළ කරන අවස්ථාවට එක් වුණා. ඒ නිසා එතුමාගේ ප්‍රවේණිය දේශපාලන ගමනේ ඉස්සරහට ගෙනයන්න එතුමාගේ පුත්‍ර රත්නයන් කිහිපයක්ම සිටිනවා. විශේෂයෙන් අද දවසේ නම් විමලතිස්ස පෙරේරා මන්ත්‍රීතුමා ඇතුළු දූ දරුවන් වෙත මේ වෙලාවේ අපේ බස්නාහිර පළාත් සභාවේ ශෝකය පළ කරමින් විශේෂයෙන් ප්‍රේමතිස්ස මැතිනිය, විමලතිස්ස පෙරේරා මැතිනිය, ඒ වාගේම අපේ විමලතිස්ස පෙරේරා ගරු මන්ත්‍රීතුමා සහ දූ දරුවන් සියලු දෙනාටම බස්නාහිර පළාත් සභාවේ ශෝකය යළිත් ඉතාම හදවතින්ම පළ කර සිටිනවා. ඒ වාගේම අපේ සභා ලේකම්තුමාට මම දැනුම් දෙනවා බස්නාහිර පළාත් සභාවේ

ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ ශෝකය, මේ වාර්තාව එතුමන්ලාගේ පවුල වෙත ලැබෙන්නට සලස්වන ලෙස. බොහොම ස්තුතියි.

ඊළගට විශේෂයෙන්ම මෙතුමාගේ සමකාලීන දේශපාලඥයෙක් වූ අපේ කළුතර දිස්ත්‍රික්කයේ ජ්‍යෝෂ්ටතම පළාත් සභා ක්ෂේත්‍රයේ දේශපාලඥයෙක් හැටියට බොහොම ගෞරවයෙන් ආදරයෙන් අපේ මතකයට නැගෙන ගරු මන්ත්‍රීතුමෙක් තමයි ඩබ්.කේ.විජේසිරි මැතිතුමා. පළාත් සභාව බිහිවුණේ, මම හිතන්නේ ස්වර්ණමය ඵලකයක් තුළින් ආව ගමනකින් නොවෙයි කියලයි අපි දන්නේ. ඒ නිසාවෙන් ලෙයින්, කඳුලෙන්, කැපවීමෙන්, උන්නතිකාමීත්වයෙන්, ප්‍රතිපත්ති ගරුකත්වයෙන්ම ගොඩනැගුණු පළාත් සභාවට 1988 බස්නාහිර පළාත් සභාවට තේරී පත්වෙලා කළුතර දිස්ත්‍රික්කයෙන් පළාත් සභාව තුළ වසර 12 ක් ඉතාම අමිල මෙහෙවරක් ඉෂ්ට සිද්ධ කළා වූ අපේ ඩබ්.කේ.විජේසිරි මන්ත්‍රීතුමාගේ ශෝක යෝජනාවයි මීළගට සභාවට ගැනෙන්නේ. මම ගරු සභානායක සුනිල් ජයමිණි මැතිතුමාට ඇරයුම් කරනවා, ශෝක යෝජනාව ඉදිරිපත් කරන ලෙස.

# ශෝක ප්‍රකාශ යෝජනාව II : ගරු ඩබ්ලිව්.කේ. විජේසිරි මැතිතුමා
## MOTION EXPRESSING CONDOLENCES II : HON. W.K. WIJESIRI, MEMBER

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රථම පළාත් සභාවට එක්සත් සමාජවාදී පෙරමුණ නියෝජනය කරමින්ද දෙවන හා තෙවන පළාත් සභාවන්ට පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින්ද කළුතර පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්ව වසර දොළහක (12) පමණ කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද, හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී ඩබ්ලිව්.කේ. විජේසිරි මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ වියෝව පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි."*

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඩබ්.කේ.විජේසිරි මැතිතුමා පිළිබඳව ඔබතුමා හොඳ පූර්විකාවක් සලසලා දුන්නා. ඩබ්.කේ.විජේසිරි මැතිතුමා 1946 පෙබරවාරි මාසයේ 27 වෙනිදා මෙලොව උපත ලැබුවා. හොරණ ප්‍රදේශයේ ඉතාමත් වැදගත් පවුලක ඩබ්.කේ.මෙන්ඩිස් මැතිතුමාගේත්, ස්ටෙලා පෙරේරා මැතිනියගේත් ආදරණීය පුතණුවන් හැටියට තමයි එතුමා මෙලොවට දායාද වුණේ. ඒ පවුලට හිටපු එකම පිරිමි දරුවාත් විජේසිරි මැතිතුමා පමණයි. තවත් සහෝදරියන් දෙදෙනෙක් එතුමාට හිටියා. හොරණ කවුරුත් ඉගෙන ගන්න ප්‍රධාන පාසල වන හොරණ තක්ෂිලා මහා විද්‍යාලයෙන් එතුමා අධ්‍යාපනය හදාරලා, පාසල් අධ්‍යාපනය නිම වුණාට පසුව අපි දන්නවා, එතුමා ජීවත්ව සිටි කාල සීමාව තුළම ගණන්වලට ඉතා ප්‍රියකරපු කෙනෙක්. මේ පළාත් සභාවේ ඉන්නා විටත් එතුමා ගණන් තමයි හදන්නේ. ගණකාධිකාරි වරයෙක් හැටියට ඩිප්ලෝමාවක් ලබා ගත්තා. ඒ ඩිප්ලෝමාව ලබාගෙන එතුමා ඒ කටයුතු කරන අතරතුර තමයි සමාජ සේවයට ක්‍රමක්‍රමයෙන් තමන්ගේ ප්‍රදේශයට දායක වෙන්නේ. සමාජ සේවා කටයුතු සඳහා තරුණ විජේසිරි මැතිතුමා හොරණ ප්‍රදේශයේ ප්‍රකට සමාජ සංවිධානයකට සම්බන්ධ වෙලා, ඒ ප්‍රදේශයේ දේශපාලනය කරන අතරතුර තමයි අපි දන්න, මේ පළාත් සභාව නියෝජනය කරපු, එතුමා ජීවත්ව සිටි කාලෙම මේ පළාත් සභාව නියෝජනය කළ එතුමාගේ ආදරණීය නෝනා මහත්මිය හමුවෙන්නේ. විජේසිරි මැතිතුමා ගණකාධිකාරි වෘත්තිය කරන අතරේ මියුලින්නෝනා මැතිනියගේත්, ජී.ඩී.පී.පෙරේරා මහතාගේත් ආදරණීය දියණිය වුණ සිරිමතී ගමගේ මෙනවිය සමහ විවාහ වෙලා, එතුමියත් සමහ විවාහ ජීවිතය ආරම්භ කරනවා. විජේසිරි මැතිතුමාට දියණියන් තිදෙනෙක් දරුවන් හැටියට මෙලොව එළිය ලබනවා. එතුමා ගණකාධිකාරීවරයෙක් හැටියට මම හිතන්නේ, වසර විසිපහක් තිහක් සේවය කරලා ඒ තෘප්තිය ලබමින් ඉන්පස්සේ මම දන්නවා, එතුමා පෞද්ගලිකව ගණකාධිකාරී වෘත්තිය කළා. ඒ ඉන්න අතරේ තමයි එතුමා 1972 දී පළාත් පාලන මැතිවරණයට මහජන නියෝජිතයෙක් හැටියට ඉදිරිපත් වෙන්න අවස්ථාව සඳහා උරගා බලන්නේ. නමුත් එතුමා 1972 පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වුණාම එතුමා ඒ තරගයෙන් පරදිනවා. නමුත් මම පැරදුණා කියලා එතුමා ඒකෙන් පස්සට යන්නේ නැහැ.

එතුමා ඉන් පස්සේත් තමන්ගේ ජනතාවට සේවය කරන්න දේශපාලනයම තෝරා ගනිමින්, ඒ දේශපාලනය තුළ හොරණ ප්‍රදේශයේ කටයුතු කරනවා. ඉන් පස්සේ එතුමා නියෝජනය කළ දේශපාලන දර්ශනයට මේ රටේ පාලනයට සම්බන්ධ වෙන්න බැරිවෙන කොට එතුමා ඊට එහාට ගිය ගමනක් පිළිබඳව නිතරම හිතනවා. දැන් මෙතන ඉඳලා මම හරියන්නේ නැහැ. මම මගේ දේශපාලන ගමන ගෙනයන්න වෙනත් දේශපාලන පක්ෂයක් තෝරාගන්න ඕනෑය කියලා එතුමා නිරන්තරයෙන්ම හිතපු කෙනෙක්. මොකද අපිත් එක්ක එකට සභාවේ අවුරුදු 12 ක්ම කටයුතු කළා. මට යාබදව සිටිමින් එකට ආශ්‍රය මන්ත්‍රීවරයා හැටියට සභාවේ ඉන්නකොට නිතර ඕපාදූප කියනවා. එතුමා අපට කියන කථා බොහොම රසවත්. ඒ ඉන්න අතරේ තමයි 1988 දී දිනක් එතුමාට විජය කුමාරතුංග මැතිතුමා මුණ ගැහෙන්නේ. විජය කුමාරතුංග මැතිතුමා මුණගැහෙන කොට කරුණාසේන ජයලත් මැතිතුමාගේ නම කියන්නම වෙනවා. ප්‍රවීන ලේඛක කරුණාසේන ජයලත් මැතිතුමා, විජේසිරි මැතිතුමා සමග හොරණ ප්‍රදේශයේ ජීවත් වුණ උදවිය. විජයට කරුණාසේන ජයලත් මැතිතුමා හමුවීමත් සමහ මෙතුමා විජය කුමාරතුංග මැතිතුමාව හමු වෙනවා. විජය කුමාරතුංග එක්ක මෙතුමාට

මේ රටේ සුවිශේෂී චරිතයක් ආශ්‍රය කරන්න පෙළඹෙනවා. ඒ තමයි බස්නාහිර පළාතේ හිටපු ප්‍රධාන ඇමතිතුමිය, පසු කාලයක අගමැතිවරිය, ඊට පසු මේ රටේ ජනාධිපතිවරිය වන චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය. අපේ විජේසිරි මැතිතුමාට එතුමියව ආශ්‍රය කරන්න ලැබෙන්නේ විජය කුමාරතුංග මැතිතුමාගේ ආශ්‍රයත් එක්කයි.

එදා අර කලින් කථාවේදී මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ රටේ වමේ දේශපාලනය යම් ප්‍රමාණයකට බිඳ වැටිලා තිබුණ වේලාවේ ඒ දේශපාලන පන්නරය ඉදිරියට ගෙන එන්න විජය කුමාරතුංගලා, ඔසී අබේගුණසේකරලා, ලෙස්ලි ගුණවර්ධනලා, විවියන් ගුණවර්ධනලා, බර්නාඩ් සොයිසලා, ඒ වාගේම කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන නායකත්වය පීටර් කේනමන් සහෝදරයලා, වාගේ මේ ප්‍රදේශවල දේශපාලන නායකයෝ උත්සාහ ගන්න විට පළාත් සභා කියන සංකල්පය මේ රටේ බිහි වෙන්නේ අන්න ඒ කාලේ. නමුත් පළාත් සභා සංකල්පය බිහි වුණාට අද වාගේ මෙහෙම ඉඳලා සනීපයට කථා කරලා, මෙහෙම ඉඳලා සනීපයට දේශපාලනය කරලා ගෙදර යන්න පුළුවන්කමක් එදා තිබුණේ නැහැ. ඒ නිසා විජේසිරි මැතිතුමාට ආරාධනාවක් ලැබෙනවා විජය කුමාරතුංග මැතිතුමාගෙන් හොරණ ප්‍රදේශය නියෝජනය කරමින් කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයෙක් හැටියට ඉදිරිපත් වෙලා පළාත් සභාවට තරග කරන්නය කියලා. එදා විජේසිරි මැතිතුමා තමන්ගේ ජීවිතය පිළිබඳ තිබෙන ආශාව පැත්තකට දාලා ඒ ආශාව ගැන හිතන්නේ නැතුව, තමන්ගේ ආදරණීය භාර්යාව, දරුවෝ තුන්දෙනාව පොඩ්ඩක් පැත්තකින් තියලා හොරණ නගරයේ ඉඳගෙන පළාත් සභාවට ඉදිරිපත් වෙනවා. එතුමා ඉතා විශිෂ්ට ජයග්‍රහණයක් ලබනවා පළාත් සභා මැතිවරණයේදී. ප්‍රථම පළාත් සභාවට හොරණ ආසනය නියෝජනය කරමින් කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට එදා අපේ ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමාත් එක්ක එකට පත්වෙන්නේ විජේසිරි මැතිතුමා. අපි දන්නවා 1988 විජේසිරි මැතිතුමා පත්වෙලා එතුමා මේ පළාත් සභාවේ අර බොහෝ රළු, බොහොම කටුක, බොහොම දුෂ්කර දේශපාලන ජීවිතයක් එතුමා ගත කළා. අපි එක්ක පහුගිය කාලේ කියලා

[ ගරු සුනිල් ජයමිණි - සභානායකතුමා ]

තියෙනවා, මාත් එක්ක හිටිය අහවලාට වෙඩි තිබ්බේ මෙහෙමයි. මම දේශපාලනය කරපු අහවලාව මට්ටු කළේ මෙහෙමයි, යම් යම් දේශපාලන පක්ෂ. ඒ නිසා විජේසිරි මැතිතුමා අන්න ඒ දේශපාලන ගමන තමයි 1988 ආරම්භ කරන්නේ. ඉන් පස්සේ 1993 චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ නායකත්වයෙන් මේ පළාත් සභාව සඳහා තරග වදින කොට එදත් විජේසිරි මැතිතුමාට ආරාධනාව ලැබෙනවා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගෙන් මේ පළාත් සභාවට තරග කරන්න කියලා. එදත් විජේසිරි මැතිතුමා ඒ ආරාධනය පිළිඅරගෙන පළාත් සභාවට තරග කරනවා. පළාත් සභාවට තරග කරලා පළාත් සභාවට තේරී පත් වෙනවා. එදා චන්ද්‍රිකා කුමාරතුංග මහ ඇමතිතුමියත් එක්ක බොහොම සමීපව කටයුතු කරලා මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට විජේසිරි මැතිතුමා ඉතා විශාල සේවයක් මේ පළාත් සභාවට කළා. ඉන් පසුව මට මතකයි 1998 පළාත් සභාව තිබුණ වෙලාවේ එදත් තරග කරනවා. එදත් එතුමා 1999 ජයග්‍රහණය කරනවා. කෙනෙක් පිට පිට තුන්පාරක් පළාත් සභාව ජයග්‍රහණය කරන්න එතුමාට ජනතා ප්‍රසාදය බොහෝ ඉහළින් තියෙන්න ඕනෑ. එතුමාට ඒ ප්‍රසාදය තිබුණා. ඒ නිසා තමයි විජේසිරි මැතිතුමා හොරණ ප්‍රදේශයේ සැබෑ මහජන නියෝජිතයෙක් හැටියට වමේ දේශපාලන පක්ෂ නියෝජනය කරමින් මේ සභාවට ඇවිල්ලා ඒ හඬ නගන්නට එතුමාට ශක්තිය ලැබෙන්නේ.

ඒ නිසා බස්නාහිර පළාත් සභාවේ අපිත් එක්ක වසර ගණනාවක් එතුමා කටයුතු කළා. විජේසිරි මැතිතුමා බොහොම අව්‍යාජ මනුස්සයෙක්. මොකද මම එහෙම කියන්නේ, සමහර අය මන්ත්‍රී ධූරයට පත්වුණාට පස්සේ ඒගොල්ලෝ හිතනවා තමන් බොහොම ඉහළ කෙනෙක් කියලා. නමුත් විජේසිරි මන්ත්‍රීතුමා කවදාවත් එහෙම හිතුවේ නැහැ. බොහොම සාමාන්‍ය කෙනෙක් හැටියට එතුමා මේ පළාත් සභාවට එනවා. පළාත් සභාව නියෝජනය කරනවා. හැබැයි, අපේ අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය දන්නවා, එතුමා තනතුරක් භාර ගත්තොත් ඒ භාරගත්ත තනතුරේ වගකීම අකුරටම ඉටුකරපු මන්ත්‍රී කෙනෙක් ඉන්නවා නම් ඒ විජේසිරි මන්ත්‍රීතුමා බව. දැන් අද අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය, අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා නියෝජනය කරන පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ එතුමා කටයුතු කළා. ඒ කාලේ එතුමා හැමදාම නියමිත වේලාවට ඇවිල්ලා පළාත් සභාව තුළ පළාත් සභාවට ලබා ගන්න පුළුවන් සියලු දේ ලබා ගන්න එතුමා කටයුතු කළා. මම හිතනවා අවුරුදු 12 ක් පළාත් සභාවේ හිටියා. මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකුගේ පැමිණීමේ ලේඛන බලන්න පුළුවන් නම් ඒ අවුරුදු 12 ට එක දවසක් හැර අනික් සියලු දවස්වල පළාත් සභාවට පැමිණි එකම මන්ත්‍රීවරයා තමයි විජේසිරි මන්ත්‍රීතමා විතරයි කියන එක ඉතා නිර්භයව මම මේ සභාවේ සඳහන් කරනවා. කවදාවත් මේ සභාවේ සභා රැස්වීමක්, තමන්ගේ කොමිටි රැස්වීමක් එතුමා මඟ අරියේ නැහැ. කවදත් තමන්ගේ දායකත්වය ලබා නොදුන්නේ නැහැ. හැමදාම එනවා එතුමා. අසනීප වෙලාත් එනවා. එක දවසක්ද කොහෙද මට මතකයි මා එක්ක කිව්වා මම ඇවිල්ලා නැත්තේ එක දවසක් ඒත් මොකක්දෝ ලොකු ප්‍රශ්නයක් හින්දා කියලා. ඒ ඇරෙන්න විජේසිරි මන්ත්‍රීතුමා හැමදාම මේ සභාව වෙලාවට ඇවිල්ලා අවසන් වනතුරු ඉන්නවා. කලින් යන්නේ නැහැ. පටන් ගත්තද අවසන් වනතුරු සභාවේ ඉඳලා තමන්ගේ දායකත්වය සභාවට නිසි සේ ලබා දුන් මන්ත්‍රීවරයෙක් කියන එකත් මම මේ වෙලාවේ ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ.

ඒ නිසා අද පළාත් සභාවේ ඉන්න මහජන නියෝජිතයින්ට, පළාත් සභාවට පත්වෙන්න ඉන්න නියෝජිතයින්ට විජේසිරි මන්ත්‍රීතුමා ජීවත්ව ඉන්න කාල සීමාව තුළ ලොකු ආදර්ශයක් ලබා දීලා තියෙනවා. ඒ තමයි මහජන නියෝජිතයෙක් හැටියට පත්

වුණාට පස්සේ තමන් ගත කරන්න ඕනෑ ජීවිතය මොකක්ද? ඒ වාගේම පත් වුණාට පස්සේ තමන් දරන තනතුරේ වගකීම දරන්න ඕනෑ කොහොමද කියන එක මේ පළාත් සභාවට හොඳින් කියලා දීපු මන්ත්‍රීවරයෙක් කියන එක මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. විජේසිරි මන්ත්‍රීතුමාට බාධා කරදර තිබුණා. නොතිබුණා නොවෙයි. තමන්ගේ දේශපාලන ලෝකය තුළ එතුමාට බොහෝ සේ බාධා කරදර තිබුණා. තමන්ගේ ආසනයේ කටයුතු කරද්දී සමහර අපේම බලවේග එතුමාට විරුද්ධව නොයෙකුත් කටකථා, නොයෙකුත් ආරංචි, හිත රිදෙන දේවල් කළා. නමුත් ඒ කිසි දේකින් එතුමා කළකිරුනේ නැහැ. ඒ හැම දේකටම එතුමා මුහුණ දීලා කටයුතු කළා. ඒ නිසා මම කාල වේලාව දිහා බලලා වැඩි වේලාවක් ගන්නේ නැහැ. විජේසිරි මන්ත්‍රීතුමා පිළිබඳව කථා කරනවා නම් මේ සභාවේ ඕනෑ තරම් කථා කරන්න පුළුවන්. ඒ නිසා අයවැය විවාදවලදී, පළාත් සභා විවාදවලදී, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ ප්‍රශ්නවලදී, සභා කටයුතු කාරක සභාවේදී, ගෘහ කාරක සභාවේදී මේ සභාවේදී තමන්ගේ දායකත්වය තමන්ගේ වචනවලින් ඒ සියලුදේ මේ සභාවට එතුමා ලබා දුන්නා.

ඒ නිසා මේ වෙලාවේ මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි එතුමාගේ ආදරණීය නෝනා මහත්මිය විජේසිරි මන්ත්‍රීතුමාගෙන් පස්සේ මේ පළාත් සභාව නියෝජනය කළේ සිරිමතී ගරු මන්ත්‍රීතුමිය. එතුමිය මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කළා. විජේසිරි මැතිතුමා අසනීප වුණාට පස්සේ පළාත් සභාවට තරග කරලා එතුමාගේ නෝනා මහත්මියත් මේ පළාත් සභාවේ මන්ත්‍රීවරියක් හැටියට කටයුතු කළා. අද සභාවේ එතුමිය ඉන්නවා මම දැක්කා. ඒ වාගේම ආදරණීය දියණියන් තිදෙනා ඉන්නවා මම දැක්කා. ඒ නිසා පළාත් සභාවට තමන්ගේ පවුලේ උදව්ය, අර කලින් අපේ සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ තමන්ගෙන් ඒ සේවය අවසන් කළේ නැහැ. තමන්ගේ නෝනා එතැනට ගෙනැල්ලා ඒ නෝනාට පළාත් සභාවට එන්න අවස්ථාව ලබා දීලා විජේසිරි මැතිතුමා අසනීපව ගෙදරට වෙලා ඉන්න වෙලාවේ බොහොම සතුටින් බලා ගෙන හිටියා මගේ දේ දැන් මගේ නෝනා කරනවයි කියලා. අපි බලන්න ගියාම අපි එක්ක කියනවා. කථා කරන්න බැරි වුණත් එතුමා අතින් හරි කියනවා, නෝනා පළාත් සභාවේ ඉන්නවයි කියලා. ගරු මන්ත්‍රීතුමා ඒක එදා බොහොම ගරුත්වයෙන් කථා කළා. ඒ නිසා සිරිමතී මහත්මිය තමන්ගේ යුතුකම් කොටසත්, තමන්ගේ මහත්තයා වෙනුවෙන් මේ පළාත් සභාවට ඉටු කළාය කියන එක මම මේ වේලාවේ ගෞරවයෙන් මතක් කරනවා. ඒ නිසා පළාත් සභාව තුළ තමන්ගේ යුතුකම් කොටස ඉටු කළ මන්ත්‍රීවරයෙකුටයි අපි මේ ගරුත්වය දක්වන්නේ. ඒ නිසා විජේසිරි මැතිතුමා මන්ත්‍රීවරයෙක් හැටියට පත් වෙලා ඒ ලබා දිපු සියලු දේ යළිත් සිහිපත් කරමින් එතුමා හොරණ ප්‍රදේශයේ ජනතාවට, විශේෂයෙන්ම ඈත දුෂ්කර පළාත්වල ජනතාවට කරපු සේවය පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට අගය කරනවා. මේ වෙලාවේ මම මීට වඩා වැඩි වේලාවක් ගන්නේ නැහැ. ඒ පවුලේ සියලු දෙනා වෙත, හිටපු අපේ මන්ත්‍රීතුමියට, ආදරණීය දියණියන් තිදෙනාට මේ වෙලාවේ ශෝකය පළ කරමින් බස්නාහිර පළාත් සභාව තුළ ඉතා ගෞරවණීය නමක් දිනා ගෙන හිටපු විජේසිරි මැතිතුමාට බෞද්ධ ආගමේ හැටියට අප බලාපොරොත්තු වන සසර අවසානයේ ශාන්ත අමා මහ නිර්වාණ සම්පත්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාත් එක්ක 1988 ඉඳලා අවුරුදු දොළහක් මේ සභාව තුළ කටයුතු කළ මන්ත්‍රීවරයෙක් වෙනුවෙන් අද ශෝකය ප්‍රකාශ කරන්න ලැබීම ගැන එක පැත්තකින් සතුටු වෙනවා. අනෙක් පැත්තෙන් කනගාටු වෙනවා. විජේසිරි මන්ත්‍රීතුමා පිළිබඳව ගරු සභානායකතුමා ඉදිරිපත් කළ සියල්ල අනුමත කරමින් එතුමා මේ සභාව තුළ සිටි නිහඬ මන්ත්‍රීවරයෙක්. ඒක කියන්න වෙනවා. සභාව තුළ සිටි ලස්සනම මන්ත්‍රීවරයෙක්. එතුමාගේ ඡායාව මට දැන් වාඩි වෙලා ඉන්න කොට පේනවා. එතුමා හැමදාම Gold Colour වාගේ Kit එකක් ඇඳලා ලස්සනට පස්සට කොන්ඩේ පිරලා. කණ්ණාඩිය Gold Colour Prame එකක්. ඒ තුළ හිනා වෙන කොට රත්තරන් පාට දතකුත් එළියට එනවා. ඒක කියන්න වෙනවා. මේ එතුමාගේ චිත්‍රය. එවැනි පුද්ගලයෙක් තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් තමන් ඉගෙන ගත්ත දේ උපයෝගී කර ගෙන තමන්ගේ ජීවිකාව, වෘත්තිය ලෙස ගණකාධිකාරිවරයෙක් හැටියට ඇවිල්ලා, එතුමා ඒ පිළිබඳව පෞද්ගලිකවත් කටයුතු කර ගෙන ඇවිල්ලා ඊට පස්සේ එතුමා ආදායම් බදු උපදේශකවරයෙක් වුණා. ගණන් හදන්න එතුමා ඒ පළාතේ හිටපු දක්ෂයෙක්. පොත් සෙට් බර ගානක් තිබුණා. සමහර වෙලාවට මම අහනවා විජේ කොහොමද මේවා කරන්නේ කියලා. කොහොම හරි නෝනාගේ සහයෝගයත් –

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උපදේශක ආයතනයක් පිහිටෙව්වා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

උපදේශක ආයතනයකුත් තියා ගෙන කරන කොට අධික දුම් බීමකුත් තිබුණා. මම සමහර වෙලාවට අහනවා, මේ වාගේ දේවල් අපරාදේ ඇති කර ගන්නේ කියලා. එතුමා කියන්නේ, මේ සිගරට් එක බීපුවම තමයි මගේ ඔලුවට එන්නේ, මේ වැඩය ගැන කියලා. එවැනි තත්ත්වයක් තුළ තමන්ගේ ජීවිතය නිර්මාණය කර ගෙන හොඳ පවුල් ජීවිතයක් ගත කරලා හොරණ ප්‍රදේශයේ අවුරුදු විස්සකට එහා පැත්තේ කථා කරනවා නම්, එතරම් දියුණු පළාතක් හැටියට නොවෙයි තිබුණේ. දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශයක්. ඒ නගරයේ ජීවත් වුණත් ඒ අවට ජනතාව වෙනුවෙන් ඉතාම දුෂ්කර දේශපාලන ගමන් මාර්ගයක ගියේ. හොරණ ආසනය කිව්වාම කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන අගලවත්ත ආසනය වාගේම ඉතාම දුෂ්කර ආසනයක්. කඳු පල්ලම් තිබුණු, වැහි කාලයට යන්න බැරි කුඩැල්ලන්ගෙන් පිරුණු වතුවලට ගිහිල්ලා එහි ජීවත් වන මිනිස්සුත් සමග එකට ඉඳලා තමයි,

එතුමා වැනි පුංචි මනුස්සයෙකුට 1988 අවුරුද්දේ මේ පළාත් සභාව නියෝජනය කරන්න අවස්ථාවක් ලැබුණේ. ඒ නියෝජිතත්වයේ ගරුත්වය තියා ගෙන මේ සභාව තුළත්, ඒ වාගේම සමාජය තුළත් තමන්ගේ ගමේ ජනතාවට කරන්න පුළුවන් උපරිම සේවය කළා.

ඒ සේවාව තුළ එතුමා ඉතාමත් නිහතමානීව ගොඩ නගා ගත් ගමන් මාර්ගය පිළිබඳව විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනැ. එතුමා පළාත් සභාව තුළ ජනතාව වෙනුවෙන් කථා කරන්න පුළුවන් දේවල්, ඒ වාගේම ක්‍රියා කරන්න පුළුවන් දේවල්වලට සම්බන්ධ වෙලා කටයුතු කළා වාගේම, එතුමාට පළාත් සභාවේ ගිණුම් කාරක සභාව නියෝජනය වෙන්න අවස්ථාව ලැබුණා. මම එතකොට ගිණුම් කාරක සභාවේ සාමාජිකයෙක් හැටියට හිටියා. ඊට පස්සේ තමයි අනෙක් සාමාජිකයන් ටික එකතු වුණේ. එදා ඉඳල මේ ගිණුම් කාරක සභාව නියෝජනය වන මන්ත්‍රීවරයෙක් හැටියටත්, එතුමා ගිණුම් කාරක සභාවේ මූලාසනයේ වාඩි වුණාට පස්සේ අනම් මනම් මොකවත් බැහැ. ඒ රාජකාරිය තමයි හරියටම අකුරට කළේ. ප්‍රශ්න අහලා, විගණන විමසුමේදීම මතු වුණු කරුණ මේක වංචාවක්ද? එහෙම නැත්නම් මේක හිතාමතා කරපු දෙයක්ද? එහෙම නැත්නම් සද්භාවයෙන් කරපු දෙයක්ද කියලා විනිශ්චය කරන්න තරම් එතුමාට ශක්තිය තිබුණා. ගිණුම් කාරක සභාව තුළ වාඩි වුණාම හවස තුන විතර වෙන කල් නැගිටින්නේ නැහැ. සේවයට කැපවුණු මන්ත්‍රිවරයෙක්. එතුමා අප අතරින් නැති වුණත්, එතුමාගේ සේවය ගැන අපට මේ සභාව තුළ කථා කරන්න පුළුවන් වෙලා තිබුණේ, ඒ කථා කරන්න අවස්ථාව ලැබිලා තියෙන්නේත් අන්න ඒ නිසයි. හැමෝටම අපි කථා කරනවා. නමුත් මෙවැනි මන්ත්‍රීවරයෙක් පිළිබඳව කථා කරන්න ලැබීම මේ සභාවට ලොකු ගෞරවයක්. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මම කනගාටුවෙන් හරි මතක් කරන්න වෙනවා. සභානායකතුමාත්, ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත් මෙයට ඇහුම්කන් දෙනවා නම් වඩාත් හොඳයි කියලා මා හිතනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විජේසිරි මන්ත්‍රීතුමා අවුරුදු ගණනාවක් තිස්සේ අසනීප වෙලා හිටියා. නමුත් අද ශෝක යෝජනාව ඉදිරිපත් කළත්, පළාත් සභාවක් හැටියට ඒ මන්ත්‍රීවරු

[ ගරු ඒ.එම්. යූසුෆ් ]

වෙනුවෙන් අපෙන් ඉටු විය යුතු යුතුකම් ඉෂ්ට කළේ නැහැ. 1988 කාලයේ පළාත් සභාවක ජනතා සේවයට ඇවිල්ලා කොන්ත්‍රාත් කළේ නැහැ. හම්බ කළේ නැහැ. එවැනි පුද්ගලයෙක් රෝගාතුරව ඉන්න කාලය තුළදී බෙහෙත් පෙත්තක් දෙන්න තරම් සභාව ශක්තිමත් වුණේ නැහැ. මට මතකයි, මේ සභාවේ මන්ත්‍රීතුමියගේ සහෝදරයා නැති වුණු අවස්ථාවේ මේ සභාව තුළ දේශපාලන අර්බුදයක් බවට පත් වෙලා - මිණීමැරුමකට සම්බන්ධ වුණු මන්ත්‍රීතුමා. රාගම පැත්තේ මම හිතන විදියට. නම නම් මට අමතක වුණා. සභාවේ වාද විවාද වුණා. නමුත් එදා මහ ඇමතිතුමා යම් තීරණයක් ගත්තා. එතුමා වෙනුවෙන් අපි දස ලක්ෂයක් දෙන්න ඕනැ. ලක්ෂ 10 ක් වන්දියක් හැටියට නොවෙයි, ගෙවන්න ඕනැය කියලා. ඒ අවස්ථාවේදී මේ සභාවේ ඒ විවාද වේලාවේ මා නැගිටලා යෝජනා කළාම, ඒ යෝජනාවේ ප්‍රතිඵලයක් හැටියට තමයි - මම එදත් කිව්වා. මේ මන්ත්‍රීවරු අසරණ වෙනවා. ඒ වාගේ ගම්පහ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකුගේ කකුල් කැපුණා. අසනීප තත්ත්වයේ ආබාධිත තත්ත්වයේ ජීවත් වුණු කොටසක් ඉන්නවා. නමුත් ඒ අය ගැනවත් හිතන්න ඕනැය කියලා හිතලා මේ සභාවේ මම යෝජනා කළා. ගරු කරන්න ඕනැ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට. මාත් එක්ක ආණ්ඩුකාරතුමා සමග සාකච්ඡාවකට සහභාගි වෙලා එදා අපි තීරණයක් ගත්තා. විශේෂයෙන්ම මන්ත්‍රීවරු වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ආරම්භ කරන්න ඕනැය කියලා. ඒ රක්ෂණ ක්‍රමය තුළ අදත් හදිස්සියක්, ආපදාවක් වුණා නම් ඒ රුපියල් ලක්ෂ දහයක යම් මුදලක් ගෙවන්න තිරණය වුණා. නමුත් ඒ එක පැත්තක්. මම මේ සභාවේ මේ ස්ථානයේ ඉඳලා මම කථා කරපු එක එදා - නමුත් අපට ඒ එලදායිතාවට එන්න පුළුවන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා දන්නවා.

අදත් මේ සභාවේ අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රිතුමිය වාගේ, මම වාගේ තවත් මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා. අපි සදාකාලිකව මේ සභාව තුළ ජීවත් වෙන්න ඇවිල්ලා නැහැ. අපි අසනීප වුණු අවස්ථාවල, - රක්ෂණය නිසා පසුගිය මාසයේ පවා මට රක්ෂණයෙන් ආවරණය කර ගන්න පුළුවන් වුණා. ඒක හැමදාම බැහැ. අශෝක ලංකාතිලක ගරු මන්ත්‍රීතුමියට ඇති වුණු අසනීප නිසා එතුමියට යම් හයියක් ලැබුණා. එතුමිය විශ්වාසය දිනා ගත්තු ඇමතිවරයෙක් නිසා. නමුත් මේ සභාවට අපි ඇවිල්ලා තියෙන්නේ Pension ගන්න නොවෙයි. ජනතා සේවයට කැප වුණා. විජේසිරි මන්ත්‍රීතුමාට තමන්ගේ රැකියාවෙන් පවා අවසාන මොහොත වන විට පාඩු විඳින්න සිද්ධ වුණා. ඔබතුමාටත් මේ ස්ථානයට වඩා ඉහළ මට්ටමින් ඉන්න පුළුවන් හොඳ උගත් පුද්ගලයෙක්. ඉන්න තිබුණා. ඒවා ඔක්කොම අතපසු කර ගෙන ආවේ අපිත් සමාජ මෙහෙවරක් කරන්න ඕනැය කියලා. මේ සභාවේ කිත්සිරි මන්ත්‍රීතුමා කථා කළා. ලෝරන්ස් මාදිවෙල හිටපු ඇමතිතුමා තවමත් කථා කරනවා. ජනාධිපතිතුමාට ලිපියක් පවා යවලා තියෙනවා මේ මන්ත්‍රීවරු සම්බන්ධව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කුමන අර්ථ නිරූපණයක් තිබුණත් ඒ හැකියාව තිබෙද්දිත් අපි යෝජනා කරන්නේ අසරණ වුණු මන්ත්‍රී කොටසක් හැටියට මේ උදවිය ගැනත් මේ සභාවට යම් තීරණයක් ගන්න පුළුවන්. මට මතකයි, මා එක්ක මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගියා. අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය ගියා. අපි උත්තර ප්‍රදේශයේ ගිය ගමනේදී ඒ පාලනය තුළ සභාව විසින්ම විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කරලා තියෙනවා. ඒ විශ්‍රාම වැටුප් ක්‍රමය අදාළ මන්ත්‍රීතුමා නැති වුණාට පස්සේ එතුමාගේ භාර්යාවට පවා ගෙවන්න පුළුවන්. සභාවෙන් හදා ගෙන තියෙන්නේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කුමක් වුවත්, මේ සභාවට ප්‍රඥප්ති පැනවීමේ අයිතිය තියෙනවා. බදු පැනවීමේ අයිතිය තියෙනවා. එහෙනම් මන්ත්‍රීවරුන්ගේ සුභසාධනය වෙනුවෙන් යම්කිසි යෝජනාවක් මේ සභාවේ සම්මත වෙනවා නම් - ඒකයි අපි කියන්නේ. අසරණ වුණු තත්ත්වයට පත් වුණු දවසකට කාත් කවුරුවත් නැති වුණාට පස්සේ නිකම් මැරිලා යන්න ඉඩ දෙන්න එපාය කියන එකයි මම මතක් කරන්නේ. විජේසිරි මන්ත්‍රීතුමා දීර්ඝ කාලයක් ආබාධිත තත්ත්වයට පත් වෙලා හිටියා. විශාල මුදලක් වැය කරන්න සිද්ධ වුණා. නමුත් තමන්ගේ වෘත්තීය අංශය දුර්වල වුණා. එතුමාගේ භාර්යාවට කර ගන්න දෙයක් නැහැ. දියණියකට පමණක් රක්ෂාවක් ලැබුණා. ඒවායින් ජීවත් වෙන්න බැහැ. නමුත් ඔවුන්ගේ පවුල් ජීවිතය ගැන හිතන්න ඕනෑ. විසිහතර වන අවුරුද්ද පහු කරමින් යන මේ සභාව. එහෙම නම් අතේ පයේ හයිය තියෙනවා නම්, අද සල්ලි හම්බ කරලා සල්ලි තිබුණාට ජීවිතේ අවසාන සැඳෑ භාගය වන විට වෙන්නේ මොකක්ද කියන එක ගැන හිතන්න වෙනවා. මේ සභාවේ මන්ත්‍රීවරු මනුෂ්‍යයන් හැටියට හිතන්න ඕනෑ. කොපමණ සල්ලි තිබුණත් - මම දැකලා තියෙනවා මීට වඩා ෆලීල් හජ්ජියාර්ලා වාගේ උදවියට සල්ලි තිබුණා, මුස්ලිම් ජාතිකයෙක් හැටියට. දාස මුදලාලිලා හිටියා. ඒ වාගේ ලොකු ව්‍යාපාරිකයෝ හිටියා. හොඳ හොඳ සල්ලිකාරයෝ හිටියා. අවසානයට නට්ටන් වෙලා. එක්කෝ ලෙඩ රෝග නිසා. තමන්ගේ අවසාන ජීවිතය ඉතා දුක්බර විධියට ගත කරන්න සිදු වුණා.

ඒ නිසා මේ සභාවේදී අද ඔබතුමාට මතක් කරනවා. විජේසිරි මන්ත්‍රීතුමා මුල් කර ගෙන මම මතක් කරනවා. එතුමාගේ ජීවිතය දුක්බර ජීවිතයක් හැටියට ගෙවන්න මේ පළාත් සභාව ඉඩ දුන්නා. අඩු තරමින් අපට මේ සභාවේ විශේෂ යෝජනාවක් ගෙනැල්ලා හරි සාකච්ඡා කරන්න තිබුණා. මෙවැනි දේවල් කළ මහජන නියෝජිතයෙක් හැටියට අපි යම් කිසි අරමුදලක් එතුමා වෙනුවෙන් - ආණ්ඩුකාර අරමුදල තියෙනවා. හදිසියට අවිනිශ්චිත අරමුදලක් තියෙනවා. එහෙම නැත්නම් සුභ සාධනයක් හැටියට මේ සභාවේ සිදුවන නාස්තිය හා වෙනත් දේවල් බලන විට විජේසිරි මන්ත්‍රීතුමා වෙනුවෙන් යම්කිසි මුදලක් දීලා එතුමා ජීවතුන් අතර ඉන්න කොට එතුමාට මානසික තෘප්තියක් ලබා දෙන්න පුළුවන් වුණා නම් අදත් එතුමා තව කෙටි කාලයක් හරි ජීවතුන් අතර ඉන්නවා. මානසික වේදනා, දුක, වේදනා මේ තුළ තමයි පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ ජීවිතයේ අවසාන කාලය ගෙවන්න සිද්ධ වෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා විජේසිරි මන්ත්‍රීතුමා උදාහරණයක් කරමින් මම සඳහන් කළේ, මේ පළාත් සභාවේ සිටි ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් හැටියට ඒ වාගේම පළාත් සභාවේ සිටි ඉතාමත් අඩු ආදායම්ලාභී මන්ත්‍රීවරයෙක් හැටියට - ඒ වාගේම මගේ සහෝදරයෙක් ඉන්නවා. අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඉන්නවා. නැතුවා නොවෙයි. අපි හිතන්න ඕනෑ. රේණුකත් ඒ තත්ත්වයේ තමයි ඉන්නේ. අපේ සංවිධායකතුමා. අපි හිතන්න ඕනෑ. හිතලා සුභසාධන වැඩ පිළිවෙළක් හදා ගෙන මන්ත්‍රීවරුන්ට යම් විපතක් වුණා නම්, උදව් කරන්න මෙය අවස්ථාවක් හැටියට යෝජනා කරමින්, විජේසිරි මන්ත්‍රීතුමා අපිත් එක්ක හිතවත්ව හිටියා. එතුමා දීර්ඝ කාලයක් ජනතා සේවයට කැප වුණා. අවංකව සභාව තුළ හිටියා. ආදර්ශවත් මන්ත්‍රීවරයෙක් හැටියට හිටියා. එතුමාගේ සේවය අගයමින් එතුමාගේ භාර්යාව ඇතුළු පවුලේ උදවියට එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායමේ හා විපක්ෂයේ කණ්ඩායමේ ශෝකය ප්‍රකාශ කරමින්, එතුමා බෞද්ධයෙක් හැටියට ජීවත් වුණා. එලෙස ජීවත් වුණු එතුමාට නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දිනයේ අපි ශෝක යෝජනා විවාදයන්ට සහභාගි වන්නේ, සුවිශේෂී වූ දේශපාලන චරිතයක් පිළිබඳව. මේ පළාත් සභා ඉතිහාසය ගත්තාම, ඒ පළාත් සභා ඉතිහාසය පුරා මන්ත්‍රීවරු ඉඳලා තියෙනවා. මන්ත්‍රීවරු ඉන්නවා. මන්ත්‍රීවරු මිය ගිහිල්ලා තියෙනවා. ඒ වුණත්, ඒ අතරතුර අද ඉන්න සමහරක් මන්ත්‍රීවරුන් අතරත් නොකියවෙන තරම් කීර්තිමත් නමක් හිමි කර ගත්, පළාත් සභාව වෙනුවෙන් යම් කාර්ය භාරයක් කළ ගරු මන්ත්‍රීවරයෙකුගේ ශෝක යෝජනාවක් තමයි අද අපි සාකච්ඡාවට භාජනය කරන්නේ. විජේසිරි මන්ත්‍රීතුමා දේශපාලන වශයෙන් විශාල ප්‍රතිරූපයක් උරුම කර ගත්ත පුද්ගලයෙක්. හැබැයි පුද්ගලයෙක් හැටියට මම හිතන්නේ බොහොම පුංචි මනුස්සයෙක්. දේහ ලක්ෂණවලින් ඉතාම පුංචි මනුස්සයෙක්. හැබැයි ඔහු ළඟ තිබුණු දේශපාලන විඥානය, මහ සුවිශාල වූ දේශපාලන දැනුම් සම්භාරයක් ඔහු සතුව තිබුණා කිව්වොත් නිවැරදියි.

ඒ නිසාම තමයි 1977 ආණ්ඩු පෙරළියත් එක්ක මේ රටේ ඇති වුණු සමාජ විරෝධී කටයුතු සම්බන්ධව ඔහු තුළ කැකෑරෙමින් තිබූ අදහස් එළිදක්වන්නට පුළුවන්කමක් නොමැති වටපිටාවක් තුළදී මේ රටේ නව දේශපාලන පක්ෂයක් හැටියට ශ්‍රී ලංකා මහජන පක්ෂය බිහි වෙන කොට එහි ආරම්භක සාමාජිකයෙක් හැටියට විජේසිරි මන්ත්‍රිතුමා මහජන පක්ෂයේ සාමාජිකත්වය ලබා ගන්නේ. ජනතා විමුක්ති පෙරමුණේ සාහසිකයන් විසින් ඝාතනය කරන ලද පොහොද්දරමුල්ලේ ප්‍රේමාලෝක හාමුදුරුවන්ගේ අනුශාසකත්වයෙන් මහා ගත්කරු කරුණාසේන ජයලත් මැතිතුමාගේ මග පෙන්වීමෙන් විජේසිරි මැතිතුමා දේශපාලන ගමන ශ්‍රී ලංකා මහජන පක්ෂයත් සමග ආරම්භ කළා. ශ්‍රී ලංකා මහජන පක්ෂයේ දේශපාලනය ඉතාම සුන්දරම දේශපාලන යුගයක් කියලා ඒ පක්ෂයේ හිටපු හැම කෙනෙක්ම අද කොතැන හිටියත් මහා ගෞරවයකින් වර්ණනාත්මකව කථා කරනවා. අද තමන් යම් යම් තැන්වල මොන තනතුරු හෙබවුවත්, ඒ තමන්ගේ දේශපාලන ජීවිතයේ සුන්දරම අවධිය 1984 ශ්‍රී ලංකා මහජන පක්ෂයෙන් ආරම්භ කරපු දේශපාලන ගමනෙයි කියලා අද කැබිනට් මණ්ඩලයේ අමාත්‍ය ධුරයන් හොබවන ගරු අමාත්‍යවරු පවා වරින් වර ප්‍රකාශ කරනවා. ඇයි ඒ? ඒ පක්ෂය තුළ මහා

ගුණාංග රාශියක් තිබුණා. ඒ තමයි එකිනෙකා පරයා නොයාම. සියළුම දෙනා සාමූහිකව වැඩ කිරීම.

ඒ වාගේම පොදු අරමුණක් උදෙසා පෙනී සිටීම කියන කාරණාව අපේ සියලුම දෙනා අතර තිබුණු උතුම්ම ගුණාංගය හැටියට මම දකිනවා. එහිදී විජේසිරි මන්ත්‍රීතුමා ඒ වෙනුවෙන් මේ රටේ මතු වුණු දේශපාලන වටපිටාවත් එක්ක, ඒ සමාජ විරෝධී පාලන තන්ත්‍රය වෙනස් කිරීමත්, ඒ වාගේම මේ රටේ ජීවත් වුණු අනෙකුත් ජනතාවට ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීමත් කියන කාරණා පදනම් කර ගෙන ප්‍රතිපත්තිමය දේශපාලනයක හිඳිමින් එතුමා මහජන පක්ෂය තුළ තමන්ගේ දේශපාලන ක්‍රියාවලිය ක්‍රියාත්මක කළා. ඒ නිසාම තමයි 1987, 1988 ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කරන වෙලාවේ ඒ හරහා බිහි වෙන පළාත් සභාව ස්ථාපිත කරමින්, එය ශක්තිමත් කිරීම සඳහා ගිනි අවි අමෝරා ගෙන ආ සමාජ වටපිටාවක් තුළ නිර්භය මිනිසකු හැටියට, ඒ පුංචි මිනිසා කළුතර දිස්ත්‍රික්කයේ නායකත්වයට ඉදිරිපත් වුණේ. එදා හොරණ ආසනය කේන්ද්‍රකර ගෙන කළුතර දිස්ත්‍රික්කයේ එතුමා ආරම්භ කරපු ඒ දේශපාලන ව්‍යාපාරය නිසා, එදා පැවතුනු රජයට විරුද්ධව මේ රටේ යම් සමාජ පෙරළියක් ඇති කරන්න ගමනක ආරම්භයක් එදා ඒ විජේසිරි මන්ත්‍රීතුමාලා දුන්න නායකත්වය තුළ ඇති වුණා.

1993, 1994 මේ රටේ සමාජ පෙරළිය ඇති කරන්න පිටිවහලක් වුණේ, එදා 1988 දී ආරම්භ කළ ඒ ගමනෙයි කියන කාරණය මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. අපේ ඒ.එම්. යුසුප් ගරු මන්ත්‍රීතුමා මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික ජීවිතය පිළිබඳව කථා කළා. ඒක සත්‍යයක්. හැබැයි, විජේසිරි මන්ත්‍රීතුමා මේ පිළිබඳව පශ්චාත්තාප වුණු මන්ත්‍රීවරයෙක් නොවෙයි. මට ලැබෙන්නේ මොනවාද? නොලැබෙන්නේ මොනවාද කියන කාරණය නොවෙයි. රුපියල් 98000 කට දුන්න පැජරෝ ජීප් රථය සියලුම දෙනා විකුණද්දි විජේසිරි මන්ත්‍රීතුමා ඒක මහජනතාවට දුන්නු නිල රථයක් හැටියට භාවිතා කරමින් තමන්ගේ මන්ත්‍රී ධුරය දරන තාක් කල් ඒ වාහනය පාවිච්චි කළයි කියන එක එතුමාට ගෞරවයක් හැටියට මම මේ සභාවේදී කියන්නට ඕනෑ. එදා එතුමා ඒ වාහනය පාවිච්චි කළේ, එතුමාගේ බිරිඳගේ, එතුමාගේ දරුවන්ගේ සුඛ විහරණය සඳහා නොවෙයි. එතුමා ඒක පාවිච්චි කළේ, කළුතර දිස්ත්‍රික්කයේ තමන්ව මහජන නියෝජිතයකු හැටියට තෝරා පත් කරපු ඒ අහිංසක ජනතාවගේ සේවය වෙනුවෙන් කටයුතු කරන්නයි. විජේසිරි මන්ත්‍රීතුමා මහා

[ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ]

ආදර්ශවත් ප්‍රතිරූපයක් ඇති මන්ත්‍රීවරයෙක් හැටියට එලෙස තමන්ගේ මෙහෙවර ඉෂ්ට කළාය කියන එක එතුමාට ගෞරවයක් වශයෙන් මේ සභාවේ කියන්නට ඕනෑ.

විශේෂයෙන් එතුමා මේ පළාත් සභාව තුළ නිවැරදි පාලන ක්‍රමයක් ගෙන යාම සඳහා ගිණුම් කාරක සභාව ඉතාමත් අර්ථාන්විත ගිණුම් කාරක සභාවක් බවට අද පරිවර්තනය වුණා නම්, ඒකේ යම්කිසි මග පෙන්වීමක් කරපු පුරෝගාමියා විජේසිරි මන්ත්‍රීතුමයි කියන එක අද ගිණුම් කාරක සභාව නියෝජනය කරන සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා මාත් සමග එකඟ වෙනවා ඇතැයි කියා මා විශ්වාස කරනවා. මොකද, මේ සභාවේ මූල්‍ය රෙගුලාසි නිසියාකාරව ක්‍රියාත්මක කරවිය යුතුයි කියන දැඩි ස්ථාවරයේ සිටිමින්, සියලුම ආයතනවල ගිණුම් කටයුතු පිළිබඳ එතුමාට තිබුණ හසල දැනුම භාවිතා කරමින්, එතුමා මේ බස්නාහිර පළාතේ මුදල් අරපිරිමැස්මෙන් ජනතා සේවය සඳහා යෙදවිය යුතුයි කියන මූලික සිද්ධාන්තයේ හිඳිමින් එතුමා ඒ සියල්ල නිසියාකාරව ඉෂ්ට කළයි කියන කාරණය කියන්නට ඕනෑ. සභාවේ කුමන කාරක සභාවක් තිබුණත්, එතුමා ඒ කාරක සභාවක් නියෝජනය කළා නම් එතුමා ඒ කාරක සභාව නිසියාකාරව නියෝජනය කළා. ඒක නාමිකව නියෝජනය කළා නොවෙයි. එතුමා ඒ කාරක සභාවේදි තමන්ගේ වගකීම් කොටස, තමන්ගේ යුතුකම් කොටස මනාව ඉටු කළා. මේ බස්නාහිර පළාතේ ජනතාව වෙනුවෙන් එතුමාගේ බුද්ධිය පාවිච්චි කරමින්, එතුමාගේ කාලය කැප කරමින් ඒ සියල්ල වෙනුවෙන් එතුමා නිසියාකාරව කැපවීමක් කළ ගරු මන්ත්‍රීවරයෙක්. එය වර්තමානයේ පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට ආදර්ශවත් චරිතයක් හැටියට මා නොබියව කියනවා. විජේසිරි ගරු මන්ත්‍රීතුමා වැනි මන්ත්‍රීවරයෙකුගේ කර්ය භාරය පිළිබඳව අධ්‍යයනය කරනවා නම්, විජේසිරි මන්ත්‍රීතුමා, ඒ පුංචි මිනිසා තමන්ගේ දැනුම් සම්භාරය තමන්ගේ දිස්ත්‍රික්කයේ ජනතාවට විතරක් නොවෙයි, පළාත් සභාව නිවැරදි දිසාවට ගෙන යන්නට තමන්ගේ ගිණුම් කටයුතු පිළිබඳව ඇති හසල දැනුම භාවිතා කරමින් මේ බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය රෙගුලාසි නිසියාකාරව නිසි මගට ගෙනයන්නට කැප වුණු ගරු මන්ත්‍රීවරයෙක් කියන කාරණය කියන්නට ඕනෑ.

ඒ වාගේම, එතුමා මහජන පක්ෂය තුළ සිටිමින් ඒ තමන්ගේ යුග කාර්ය මෙහෙවර ඉටු කරමින් එතුමා තමන්ගේ යුතුකම් කොටස ඉටු කළා වාගේම, 1994 මේ රටේ සමාජ පෙරළිය ඇති කිරීමත් එක්ක, ඒ සමාජ වෙනසත් එක්කම සක්‍රීයව තමන්ගේ ජනතාවට ඒ සේවාව ලබා දෙන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගැන එතුමා නිරෝගීව ඉන්න මුල් කාලය තුළම කටයුතු කළා. එතුමා රෝගී වුණාට පස්සේ එතුමාගෙන් කරන ලද ඉල්ලීමක් අනුව එතුමාගේ ආදරණීය බිරිඳ ඒ මැතිනිය මේ සභාව නියෝජනය කළා. එතුමියත් විශේෂයෙන්ම දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් - මා දන්නවා. එතුමා එක්ක කථා කරන බොහෝ අවස්ථාවල එතුමා දරුවන්ගේ දහම් අධ්‍යාපනය සඳහා වැඩි අවධානයක් යොමු කළා. දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධව, දහම් අධ්‍යාපනය සම්බන්ධව, ප්‍රදේශයේ දිළිඳු ජනතාවගේ පෙර පාසල් අධ්‍යාපනය සම්බන්ධව මේ කාරණා සම්බන්ධව එතුමා විශාල අවධානයක් යොමු කරලා මේ පළාත් සභාව අර්ථාන්විත පළාත් සභාවක් කරන්න, අද මේ පළාත් සභාව මේ තැනට ගේන්න 1988 පිහිටුවන කොට මේක සුදු අලියෙක්ය කියලා විවිධ අර්ථ කථනයන් දෙද්දි ඒ සියල්ලම බැහැර කරමින් මේක අර්ථාන්විත ආයතනයක්, පළාත් සභාව තුළින් ජනතාවට විශාල මෙහෙවරක්

කරන්න පුළුවන්ය කියන කාරණය ජනතාවට අතරට සපථ කරන්න පුරෝගාමී වුණු මන්ත්‍රීවරයා හැටියට විජේසිරි මන්ත්‍රීතුමාව සඳහන් කරන්න පුළුවන්. මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාගේ පෞද්ගලික ශෝකයත්, එතුමා මහජන නියෝජිතයෙක් හැටියට මේ පළාත් සභාව නියෝජනය කරපු ශ්‍රී ලංකා මහජන පක්ෂයේ ශෝකයත්, මා මේ අවස්ථාවේ ඔබතුමා මගින් ඒ පවුලේ උදවිය වෙත පුද කරමින් එතුමාගේ නිර්මල දේශපාලන ගමන් මග ඉදිරියට ගෙන යන්න එතුමාගේ පවුලේ දරුවන්ටත්, ආදරණීය බිරිඳටත් ආරාධනය කරමින් විජේසිරි මැතිතුමාට නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දිවංගත විජේසිරි මන්ත්‍රීතුමාගේ ශෝක යෝජනාව කථා කරන වෙලාවේ රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා වාගේම අද දවසේ අපට කථා කරන්න සිද්ධ වුණේ ලාංකීය දේශපාලන තලය තුළ ඉතාම කීර්තිමත් දේශපලඥයෝ දෙන්නෙක් ගැන. විජේසිරි මන්ත්‍රීතුමාත්, අපේ රටේ විනය ගරුක ගුණගරුක දේශපාලඥයන් සුළුතරය අතර වැජඹුණු කෙනෙක් බව කලින් කථා කළ සියලු දෙනා කිව්වා. අපි දන්නවා අපේ රටේ ජනමූල නායකයෝත් මනිමූල නායකයෝත් කියල දේශපාලන නායකයෝ දෙවර්ගයක් බලයට පත් වෙනවා. අපේ රටේ ඉතාම අඩුවෙන් බලයට පත් වන්නේ ජනමූල නායකයෝ. ජනතා ප්‍රසාදය දිනා ගෙන ජනතාවගේ කර පිටින් ජනතා සහයෝගය මත බලයට එන නායකයෝ ඉතාම ස්වල්පයක් තමයි ලාංකීය දේශපාලනයේ අද දවසේ ඉන්නේ. හැබැයි මනිමූල දේශපාලනඥයෝ ඕනෑතරම් ලංකාවේ ඉන්නවා. අපි දන්නවා විජේසිරි මන්ත්‍රීතුමා දේශපාලනය කරන්න පටන් ගත්තේ විජය කුමාරතුංග මැතිතුමාත් එක්ක. ශ්‍රී ලංකා මහජන පක්ෂයෙන් තමයි එතුමා ඉස්සෙල්ලාම පළාත් සභාවට තරග කරන්න ආවේ. 1988 එක්සත් සමාජවාදී පෙරමුණ පිහිටවූවාට පස්සේ සමසමාජ පක්ෂයත්, කොමියුනිස්ට් පක්ෂයත්, මහජන පක්ෂයත් එකතු වෙලා හදපු එක්සත් සමාජවාදී පෙරමුණෙන් තමයි එතුමා දේශපාලනයට ආවේ. එදා දේශපාලනයට එන කොට අපි කලින් කිව්ව ප්‍රේමතිස්ස පෙරේරා මැතිතුමා දේශපාලනයට එනවා වාගේම, දේශපාලනය කරන්න වුණේ ඉතාම අමාරු තත්ත්වයන් යටතේ. ඉතාම අභියෝගයන් යටතේ. ඒ අභියෝගය ත්‍රස්තවාදීන්ගෙන් එල්ල වුණා වාගේම, ඊළඟට තිබුණු අභියෝගය තමයි මේ තරගයේදී තමන් තමන්ගෙන් හයියෙන් ජනප්‍රියතම මන්ත්‍රීවරයෙක් වෙන්න ඕනෑ කොහොමද කියන එක. ඒකේදී ජනතාවගේ මන්ත්‍රීවරයා කරන සාධකය බවට පත් වුණේ, ජනතාවගේ තිබුණු ඇල්ම ආදරය වාගේම, ජනතාව අතර වැඩ කරලා පැතිරිලා ජනතාව මත ගොඩ නගා ගත්ත දේශපාලනය තමයි තමන් මහජන නියෝජිතයෙක් පත් කරනවාද කියන සාධකය බවට පත් වුණේ. විජේසිරි මන්ත්‍රීතුමාට මේ හැකියාව, දක්ෂතාවය මේ පරිසරය නොඅඩුව තිබුණු නිසා තමයි එතුමා එදා මහජන නියෝජිතයෙක් විධියට පත් වෙලා මේ පළාත් සභාවට ආවේ. 1988 පළාත් සභාව වාගේම 1993 පළාත් සභාවත් විජේසිරි මන්ත්‍රීතුමා නියෝජනය කළා. 1993 පළාත් සභා මැතිවරණයෙන් පස්සේ ලාංකීය දේශපාලනයේ හැරවුම් ලක්ෂ්‍ය නිර්මාණය වුණා කියන කාරණය අපි දන්නවා.

1993 දකුණේ පළාත් සභාව තරමක් වේලාසනින් තිබ්බා. දකුණේ පළාත් සභාව ඉතාමත් ප්‍රජාතන්තවාදීව පොදුජන එක්සත් පෙරමුණ දිනා ගත්තාට පස්සේ එදා දකුණේ මහ ඇමති බවට පත් වෙන්න වැඩිම ඡන්ද ගත්ත අමරසිරි දොඩංගොඩ මැතිතුමාට පළාත් සභාවේ බලය පිහිටුවන්න එක්සත් ජාතික පක්ෂය ඉඩ කඩ දුන්නේ නැහැ. ඒ නිසාම විශාල දේශපාලන හැරවුම් ලක්ෂ්‍යයක් දකුණු පළාත් සභාව හරහා නිර්මාණය වුණා. එදා දකුණු පළාත් සභාවට තරග කළ ප්‍රැන්සිස්කු මැතිතුමාව උස්සා ගෙන ගිහිල්ලා - දේශපාලඥයන් උස්සන්න ලාංකීය ඉතිහාසයේ පළමුවැනි අවස්ථාව බවට පත් වුණේ මෙය කියලා අපි විශ්වාස කරනවා. උස්සාගෙන ගිහිල්ලා හංගලා තියල ඡන්දයක් අඩු කරලා පළාත් සභාව පිහිටුවන්න දෙන්නේ නැතිව තිබුණු වෙලාවේ විශාල අරගලයක් කරලා තමයි දකුණු පළාත් සභාව 1993 පිහිටෙව්වේ. ඊට පස්සේ තමයි, බස්නාහිර පළාත් සභා මැතිවරණය තිබ්බේ. ඒ ආශ්වාදය, ඒ ලබා ගත්ත හයිය ඒ සියල්ල පාවිච්චි කරලා තමයි චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය බස්නාහිර පළාත් සභාවේ 1993 පළාත් සභා මන්ත්‍රීවරිය මහ ඇමතිවරිය බවට පත් වන්නේ. ඒ ගමන තමයි ලාංකීය දේශපාලන ඉතිහාසය වෙනස් කරලා අවුරුදු 17 ක් තිබුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව අයින් වෙලා අපට සමාජවාදී නැඹුරුවක් තිබෙන රාජ්‍යයක් නිර්මාණය කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා ඒ පළාත් සභාවේත් විජේසිරි මන්ත්‍රීතුමා කටයුතු කරන්න පටන් ගත්තා. එතුමා අවුරුදු දොළහක විතර කාලයක් අඛණ්ඩව බස්නාහිර පළාත් සභාව නියෝජනය කළා.

මම හිතන්නේ විජේසිරි මන්ත්‍රීතුමා පළාත් සභාවේ ඉන්න කාලයේ කරපු ලොකුම සේවය තමයි ගිණුම් කාරක සභාව ශක්තිමත් කරන එක. පළාත් ගිණුම් කාරක සභාව කියලා කියන්නේ පළාත් මූල්‍ය විනය පවත්වා ගෙන යන්න සහයෝගය දක්වන, ඒ වාගේම මූල්‍ය අකටයුතුකම් ගැන සොයා බලන, ඒවා නිවැරදි මගට ගෙන යන්න නායකත්වය දෙන ආයතනය. ගිණුම් කාරක සභාව නිවැරදිව ක්‍රියාත්මක වුණේ නැත්නම් පළාත් සභාවක, ගිණුම්කරණය පිළිබඳව බරපතල ප්‍රශ්නයකට මැදිහත් වෙලා පළාත් සභාව කඩා වැටෙන්න ඉඩ තියෙනවා. බස්නාහිර පළාත් ගිණුම් කාරක සභාව ශක්තිමත් කරන එක, ඒක නිවැරදිව ගොඩ නගන එක, ඒකට නිලධාරීන් කැන්දවන එක, නිලධාරීන්ට නිවැරදිව නියෝග දෙන එක සහ නිවැරදි ගමන් මගකට නිලධාරීන් අරන් යන එක මේ ගිණුම් කාරක සභාවක් හරහා කරන එක පටන් ගත්තේ විජේසිරි මන්ත්‍රීතුමා. එතුමා ගිණුම්කරණය පිළිබඳ රජයේ ගිණුම්කරණ ආයතනයේ ඩිප්ලෝමාවක් ලබා ගත් කෙනෙක්. අවුරුදු විස්සක් විතර

ප්‍රායෝගික ගිණුම්කරණය අත්හදා බලපු කෙනෙක්. ඒ සියලු අත්දැකීම්, එතුමාගේ දැනුම පළාත් ගිණුම් කාරක සභාව ඇතුළේ පළාත් සභාවේ යහපත පිණිස පාවිච්චි කළ ගරු මන්ත්‍රීවරයෙක් විධියට තමයි විජේසිරි මන්ත්‍රීතුමා අපට හඳුන්වා දෙන්න පුළුවන්කම ලැබෙන්නේ. 1999 තමයි අපි පළාත් සභාවට තේරිලා ආවේ. 1999 පළාත් සභාවේත් විජේසිරි මන්ත්‍රීතුමා කළුතර දිස්ත්‍රික්කයෙන් විශාල ජයග්‍රහණයක් ලබා ගෙන පළාත් සභාවට ආවා. අපි පෞද්ගලිකව එතුමා ආශ්‍රය කරන්න පටන් ගන්නේ 1999 තුන්වන හතරවන පළාත් සභාවේ ඉඳලා. ඒ පළාත් සභාවේදී තමයි අපි විජේසිරි මන්ත්‍රීතුමා පෞද්ගලිකව හඳුනා ගන්නේ. ඔහු කොයිතරම් ක්‍රියාශීලී මන්ත්‍රීවරයෙක්ද? ජනතාවට ආදරය කරන මන්ත්‍රීවරයෙක්ද? තමන්ගේ මන්ත්‍රීකම ජනතාවගේ සුභසිද්ධිය වෙනුවෙන් කැප කරන මන්ත්‍රීවරයෙක්ද? කියන කාරණය අපි ඒ පළාත් සභාව තුළදී හඳුනා ගන්නවා. විජේසිරි මන්ත්‍රීතුමා මා හිතන්නේ අසනීප නොවුණා නම් තවත් කාලයක් මේ පළාත් සභාව නියෝජනය කරාවි. එහෙම හැකියාව, දක්ෂකම ජනතා ප්‍රසාදය සියල්ල නොඅඩුව විජේසිරි මන්ත්‍රීතුමාට තමන්ගේ දේශපාලනය අසනීප තත්ත්වය නිසා හමාර කරන කල්ම තිබුණා.

අපේ ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, එතුමා අසනීප වුණාට පස්සේ පළාත් සභාවේ අවධානය යොමු නොවුණත්, පෞද්ගලිකව අපි එතුමා අසනීප වුණාට පස්සෙත් නිවසට ගිහිල්ලා බලන කටයුත්ත කළා. මම ඇමතිවරයෙක් වශයෙන් සිටිද්දී සමාජ සේවා ඇමතිවරයා විධියට මම ගිහිල්ලා එතුමා අවස්ථා ගණනාවකදී මුණ ගැසුනා. ඔහු ඉතාම ප්‍රීතියට ප්‍රමෝදයට පත් වුණා, පළාත් සභාවේ අය ගිහිල්ලා ඔහුව බලන කොට ඔහුගේ සෝ දුක් හොයලා බලන කොට. විජේසිරි මන්ත්‍රීතුමා, රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා වාගේ තමන්ගේ අසනීප තත්ත්වය නිසාවත් තමන්ට පළාත් සභාවෙන් යම් උදව් උපකාර නොකළා කියලාවත් තමන්ගේ ජීවිතය ගැන පසු තැවුණ කෙනෙක් නොවෙයි. එතුමාට ලොකු හයියක් තමන්ගේ ජීවිතයේ අන්තිම වෙන කල් තියා ගන්න පුළුවන්කම තිබුණා. මම හිතන්නේ සමාජ පරිචය, අත්දැකීම් සියල්ල මත, ඔහු ජීවිතයේ ලෙඩ වෙලා වුණත් මනසින් වැටෙන්නේ නැතුව ඉන්න පුළුවන් හැකියාව ශක්තිය එතුමාට තිබුණා. ඒ නිසා එතුමා ශක්තිමත් දේශපාලනඥයෙක්. බොහොම ආදර්ශවත් දේශපාලඥයෙක්. ඒ වාගේම විනය ගරුක දේශපාලඥයෙක්. ඒ වාගේම ඉතාම සංවරකමක් තිබුණු දේශපාලඥයෙක්. සත පහක ජනතා මුදලක් හොරා කාපු නැති

[ ගරු මහේෂ් අල්මේදා ]

දේපාලඥයෙක්. මුදල් හම්බ කරපු නැති දේශපාලඥයෙක්. ඒ නිසා සමාජ සේවකයෙක් විධියට, මහජන නියෝජිතයෙක් විධියට ලාංකීය දේශපාලන තලයේ වැජඹෙන්න අවශ්‍ය කරන සියලු සුදුසකම් සපුරා තිබුණු දේශපාලඥයෙක්. ඒ නිසා අපි කලින් කිව්වා වාගේම මෙවැනි දේශපාලඥයෝ අහිමි වෙන එක තමයි රටකට තිබෙන පාඩුව. ඒ නිසා විජේසිරි මන්ත්‍රීතුමාගේ මරණයත් මම හිතන්නේ දේශපාලන තලයටත් සමාජ සංවර්ධනයටත් වුණු පාඩුවක්, බාධාවක් විධියට තමයි අපි දකින්නේ. මේ වෙලාවේ විජේසිරි මන්ත්‍රීතුමාගේ පවුලේ සියලු දෙනාට පළාත් සභාවේ ශෝකය එකතු කරන ගමන්, පෞද්ගලිකව අපගේ ශෝකයත්, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ශෝකයත් එකතු කරමින් නිහඬ වෙනවා. ඔබතුමාට ස්තුතියි.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඩබ්ලිව්.කේ. විජේසිරි මන්ත්‍රීතුමා වෙනුවෙන් ශෝක යෝජනාවට කථා කරන්නට කැමතියි. මොකද, ඩබ්ලිව්. කේ විජේසිරි ගරු මන්ත්‍රීතුමා පළාත් සභාව ආරම්භයේ සිට තුන්වැනි පළාත් සභාව වෙන කල් පළාත් සභා ක්ෂේත්‍රය තුළ විශාල වැඩ කොටසක් කරපු බොහොම අභිමානයක් ඇතිව ජීවත් වුණු මන්ත්‍රීවරයෙක් හැටියට මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා. ඒ නිසා අපට කිසිම බයක් සැකක් නැතිව එතුමා ගැන කථා කරන්න පුළුවන් තත්ත්වයක් තියලයි අද එතුමා අභාවප්‍රාප්ත වෙලා තියෙන්නේ. අද දේශපාලඥයන් කියන නම සමහර දේශපාලඥයන්ගේ ක්‍රියාකලාපය නිසා ජනතාව පිළිකුලෙන් හෙළා දකිනවා. සමහර අවස්ථාවලදී දේශපාලඥයා පිළිබඳව කථා කරන කොට අපිත් දේශපාලඥයෝ නේද කියල මදි පුංචිකම අපේ සිතට ඇති වෙනවා. ඒ වාගේ විවිධ තරාතිරමේ දේශපාලනඥයෝ අද මේ රටේ ඉන්නවා. නමුත් විජේසිරි මන්ත්‍රීතුමා ගැන කථා කරන කොට අපේ සිතට එහෙම දෙයක් දැනෙනනේ නැහැ. අපිට ලොකු අභිමානයක් දැනෙනවා. ලොකු සතුටක් දැනෙනවා. එතුමා අපට විශාල ආදර්ශයක්, විශාල මාර්ගෝපදේශයක් ලබා දුන්න පුද්ගලයෙක් හැටියට සඳහන් කරන්න කැමතියි. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා වාගේම මාත් එතුමාව හොඳින් හඳුනා ගත්තේ 1999 තුන්වැනි පළාත් සභාවට අපි පත් වෙලා ආවාට පස්සේ. වඩාත් කිට්ටුවෙන් අපට ඇසුරු කරන්න ලැබුණේ, ගිණුම් කාරක සභාවට අපි සියලු දෙනාම එකට පත් වුණු නිසා. ප්‍රධාන ඇමතිවරයා ගිණුම් කාරක සභාවේ සභාපතිවරයා වශයෙන් නිල වශයෙන් පත් වුණත් බොහෝ විට අපි අපේ කණ්ඩායම තුළින් වැඩ බලන සභාපතිවරයෙක් පත් කර ගෙන තමයි ඒ කටයුත්ත කර ගෙන යන්නේ. මොකද, මහ ඇමතිවරයෙකුට තියෙන විශාල වැඩ කොටසත් එක්ක සතියකට වරක් මේ වාගේ දෙයකට මිඩංගු කරන්න අපහසුයි කියන එක අපි හොඳින් දන්නවා.

මම හිතන්නේ හිටපු මහ ඇමතිවරුන්ගේ ගෞරවය ආරක්ෂා කරමින් 1999 ඉඳලා එතුමා දෙවරක් ගිණුම් කාරක සභාවේ වැඩ බලන සභාපතිවරයා හැටියට විශාල කාර්ය භාරයක් ඉටු කළා. එතුමා තමන්ගේ නිලයේ ගෞරවය ඒ ආකාරයෙන්ම රැක්කා විතරක් නොවෙයි, අපි වාගේ ආධුනිකයන්ට ඒ ගෞරවය රැක ගෙන වැඩ කරන හැටි හැම විටම කියලා දුන්නා. එතුමා ආදර්ශයක් වුණා. වෙලාවට ගිණුම් කාරක සභාවට සහභාගි වෙන්න එන එතුමා, එය ඒ දවස තුළ දිගටම කර ගෙන ගියා. අතරමගදී කිසිම දවසක නැගිටලා වෙන කෙනෙකුට ඒ කාර්ය

භාරය පවරලා ගියේ නැහැයි කියන එක මම හොඳින් දන්නා කාරණයක්. ඒ වාගේම ගිණුම් කාරක සභාවක් තුළ මුදල් රෙගුලාසි පිළිබඳව හොඳ අවබෝධයක් ඇතිව එතුමා වැඩ කළා. ඒ එන හැම කෙනෙක් තුළම බිය සම්ප්‍රයුක්ත ගෞරවයක් එතුමා ඇති කරලා තිබුණා. එතුමා ගිණුම් කාරක සභාවට අයිති හැම අංශයක් කෙරෙහිම අවධානය යොමු කළා. බැරි වෙලාවත් නොදන්නා කමට හෝ යම් කිසි නිලධාරියෙක් නියමිත නිල ඇඳුමින් ආවේ නැත්නම් එතුමා කිසිම වෙලාවක පසුබට වුණේ නැහැ, ඒක පෙන්නලා දීලා ඒ අය එතැනින් ඉවත් කරන්න කටයුතු කළා. ඒ නිසා තමයි එතැන ගෞරවය රැකුණේ. ටයි පටිය ඇඳලා අත් දිග කමිසය ඇඳලා ඒ ගෞරවය ආරක්ෂා වන විධියට හැම නිලධාරියෙකුටම ඒකට සහභාගි වෙන්න පුළුවන් ආදර්ශයක් එතුමා ලබා දුන්නා. බැරි වෙලාවත් කෙනෙක් ඒ විධියට එන්නේ වත් නැහැ. මොකද, ආවොත් නැවත හරවා අරින්නට සිද්ධ වෙන බව දන්නා නිසා. ඒ නිසා එහෙම එන්නේවත් නැති ගතියක් තිබුණා.

ඒ වාගේම එතුමා මේ පිළිබඳව හොඳින් හදාරලා තිබුණා. ඒකට ලොකු පහසුවක් වුණා, එතුමා ගණකාධිකාරිවරයෙක් හැටියට ඒ සම්බන්ධව පුළුල් දැනුමක් ලබා තිබීම. ඒ වාගේම ආදායම් බදු හදන්නෙකු හැටියට කළමනාකරණය කරන කෙනෙක් හැටියට ඒ පිළිබඳව ලොකු දැනුම් සම්භාරයක් තිබීම මේ කටයුතු ඉතා හොඳින් කරන්නට පුළුවන්කම තිබුණා. දේශපාලනය විනෝදයෙන් කරන්න පුළුවන් කාලයක නොවෙයි එතුමා දේශපාලනයට ප්‍රවිෂ්ට වුණේ. මහා විශාල මිනිස් සංහාර වෙද්දි, දේශපාලනය කරන අයට මරණය හිමි වෙද්දි, නොයෙකුත් දේශපාලන ව්‍යාකුලතාවයන් රටේ තියෙද්දි එතුමා නිර්භයව වාමාංශික කඳවුරු වෙනුවෙන් පෙනී සිටියා. එතුමා මන්ත්‍රීවරයෙක් වුණා වාගේම, ඒ කාර්ය භාරය අවංකව කළා. කිසි කෙනෙකුට ඇඟිල්ල දික් කරලා පෙන්නන්න බැහැ එතුමා මුදල් රෙගුලාසි අයුතු විධියට ක්‍රියාවට නැගුවා කියලා. එහෙම නැත්නම් කාගෙන්හරි සංතෝසමක් ගත්තයි කියලා. එහෙම නැත්නම් වැරදි විධියට මුදල් හම්බ කළා කියලා. කිසිම කෙනෙකුට එහෙම කියන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. පළාත් සභාවේ ගෞරවය වාගේම තමන්ගේ ආදරණීය බිරිඳගේ ගෞරවය දරුවන්ගේ ගෞරවය, තමන්ගේ පවුලේ අනාගත පරම්පරාවේ ගෞරවය තියලයි එතුමා හැම වැඩක්ම කළේ. අනාගතයේ එතුමාගේ දරු මුණුබුරෙකුට හරි තමන්ගේ මුත්තා නැත්නම් තමන්ගේ සීයා ඉතාමත් ආදර්ශවත් දේශපාලඥයෙක් හැටියට මේ රටේ ජීවත් වුණා. මේ මඩ ගොහොරුවේ ඒ මඩ ගාගන්නේ නැතුව පිපිණු නෙළුම් මලක් වාගේ, පියුමක් වාගේ මේ දේශපාලන ලෝකයේ ජීවත් වුණයි කියන ආදර්ශය එතුමා තමන්ගේ පරම්පරාවට තිව්වා නේද කියලා ආඩම්බර වේවි. ඒ නිසා අපි කාටත් එතුමා ගැන භය නැතුව සැක නැතිව කථා කරන්න පුළුවන්. ඒ ප්‍රදේශයේ දේශපාලන කටයුතු ඉතාම හොඳින් කළා. ඒ වාගේම ඒ දේශපාලන කොටස්වලට අවශ්‍ය ආදර්ශය සපයලා දුන්නා.

ඒ වාගේම එතුමා හොඳ තාත්තා කෙනෙක්. හොඳ ස්වාමි පුරුෂයෙක්. යම් පුද්ගලයෝ දේශපාලනය කරන කොට තමන්ගේ පවුල් ජීවිතය ගැන හිතන්නේ නැහැ. තමන්ගේ බිරිඳ ගැන හිතන්නේ නැහැ. තමන්ගේ දරුවෝ ගැන හිතන්නේ නැහැ. ඒක විනෝදාංශයක් බවට පත් කරමින් ඒ මත්තේම ඉන්නවා මිසක්. නමුත් ඔහු හරියට දේශපාලනය කළා වාගේම තමන්ගේ බිරිඳට ආදරණීය ස්වාමි පුරුෂයෙක් වුණා. එතුමිය පළාත් සභා මන්ත්‍රීවරියක් හැටියට මාත් එක්ක දීර්ඝ කාලයක් කටයුතු කළා. බොහොම කිට්ටුවෙන් එතුමියත් මාත් ආශ්‍රය කළා. ඒ කාලයේදී එතුමිය විජේසිරි මන්ත්‍රීතුමා ගැන මගෙත් එක්ක ගුණ කියපු හැටි මට අද වාගේ මතකයි. ඔහු අසනීප වුණු දා ඉඳලා ස්වාමි දියණියකගෙන් විය යුතු සියලු සහයෝගය, හොයා බැලීම්, සැලකිලි එතුමිය ලබා දුන්නා වාගේම එතුමිය තමන්ගේ ස්වාමි පුරුෂයා ගැන බොහොම හොඳ දැක්මකින් ජීවත් වුණා. ඒ වාගේම විජේසිරි මන්ත්‍රීතුමා දරුවන් ගැන කථා කළා. දරුවන් ආදර්ශවත්ව හැදුවා. දරුවෝ සමාජයට ඉදිරිපත් කළා. මේක තාත්තා කෙනෙකුගෙන් විය යුතු යුතුකමක් හැටියට එතුමා හැම තිස්සේම හිතුවා. ඒ නිසා ඒ පැත්තෙනුත් සාර්ථක පුද්ගලයෙක් හැටියට මම විජේසිරි මන්ත්‍රීතුමාව දකිනවා. මේ වාගේ පුද්ගලයෝ ගැන අපට බය නැතුව ලජ්ජාවක් නැතුව, හොර බොරුවක් නැතුව ඕනෑම සභාවක ඉඳ ගෙන කථා කරන්න පුළුවන්. ඇත්තෙන්ම අද දිගටම කථා කළත්, එතුමා පිළබඳව කථා කරලා ඉවරයක් කරන්න බැරි බව මම දන්නවා. ඒ නිසා මේ ආදර්ශ සම්පන්න, කැපවීමෙන් කටයුතු කළ ආදර්ශවත් දේශපාලඥයාට නිවන් සම්පත් ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඩබ්ලිව්.කේ. විජේසිරි මන්ත්‍රීතුමා පිළිබඳව මේ සභාවේ අද දීර්ඝ වශයෙන් එතුමා කළ සේවාව එතුමා සභාවට සහ සමාජයට කරන ලද සේවාවන් පිළිබඳව, එතුමාට ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ අපේ මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළා විතරක් නොවෙයි, අද පළාත් සභාව තුළ මේ මොහොතේ මේ තත්ත්වය නොතිබෙන්න පළාත් සභාව නියෝජනය කරන බොහෝ මන්ත්‍රීවරු පිරිසක් අද බලාපොරොත්තුවෙන් සිටියා, ඩබ්ලිව්. කේ. විජේසිරි මන්ත්‍රීතුමා පිළිබඳව තමන් ශෝක ප්‍රකාශ කිරීමේ අවස්ථාවට ඉන්න ඕනෑය කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මතක් කරනවා, අද මේ අවස්ථාවේ මූලාසනයේ ඉන්න නියෝජ්‍ය සභාපතිතුමාත්, විජේසිරි මන්ත්‍රීතුමාත් පළාත් සභාව නියෝජනය කළේ කළුතර දිස්ත්‍රික්කය තුළ ඉතාමත්ම සමීප, ඉතාමත්ම හිතවත් සහෝදර දෙපළක් වශයෙන්. සමහර විට ඔබතුමා මූලාසනයේ ඉන්න ගමන් දුක් වෙනවා ඇති, මම මූලාසනයේ නොවෙයි මේ මොහොතේ සභාව තුළයි ඉන්න ඕනෑ කියන එක පිළිබඳව. දැන් මොහොතකට කලින් ඔබතුමා එය මාත් එක්ක කිව්වා.

මම අද පළාත් සභාව නියෝජනය කරන්නේ විජේසිරි මන්ත්‍රීතුමාගේ ගෝලයා නැත්නම් - විජේසිරි මන්ත්‍රීතුමා තමයි මගේ දේශපාලනයේ ගුරුවරයා. මම දේශපාලනය පටන් ගත්තේ එතුමාත් එක්ක. එතුමා ප්‍රාදේශිය සභාවට මාව අතින් අල්ලා ගෙන අරගෙන ගිහිල්ලා ප්‍රාදේශීය සභාවේ දේශපාලනය ආරම්භ කළා කිව්වොත් නිවැරදියි. ඒ වාගේම දැන් මොහොතකට කලින් මෙතැනින් ගියා බණ්ඩාරගම ආසනය නියෝජනය කරන නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමා. එතුමා යන්න කලින් මට කිව්වා, කෝරළේ මන්ත්‍රීතුමා ඔබතුමාගේ කථාවේදී කියන්න -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා මොහොතකට අසුන් ගන්න. ගරු සභානායකතුමාට අවස්ථාව සභාවේ කාලය දීර්ඝ කිරීමට.

# රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 30

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"අද දින වැඩ කටයුතු අවසන් වන තුරු සභාවේ කාලය දීර්ඝ කළ යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමා කිව්වා, යසේ, ඔබ විජේසිරි මන්ත්‍රීතුමාගේ දේශපාලන ගෝලයා. මගේ ව්‍යාපාරවල ගුරුවරයා විජේසිරි මන්ත්‍රීතුමා කියන එක මේ සභාවට කියන්න කියලා. මම පෞද්ගලිකව දන්නවා. බොහොම සද්භාවයකින් අද මන්ත්‍රීවරයෙක් වශයෙන් හොඳ ව්‍යාපාරිකයෙක්ව ඉන්න නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමාට ව්‍යාපාර ජීවිතය ආරම්භ කරන්න පාර පෙන්නුවේ විජේසිරි මන්ත්‍රීතුමා. ඒ නිසා මම ඒ තත්ත්වය පොඩ්ඩක් මතක් කරන්න ඕනෑ. පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් බොහොම ආඩම්බරව, බොහොම ගෞරවාන්විතව පළාත් සභා මන්ත්‍රී ධූරය හෙබ වූ ආකාරය අපි හොඳින් දන්නවා. එතුමා ලඟින් හිටපු ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් එහෙම නැත්නම් ළඟම ඉන්න පුද්ගලයෙක් වශයෙන් මම දන්නවා,

[ ගරු යසපාල කෝරළගේ ]

එතුමා මේ මන්ත්‍රී ධූරයට කොයිතරම් සැලකුවාද? මේ සභාවට කොයිතරම් ගරුත්වයක් දුන්නාද? එතුමා පැමිණීමේ වේලාව, අඳින ඇඳුමේ ස්වභාවය, මේ සියල්ල සභාවේ මන්ත්‍රී ධූරයේ ගරුත්වය ආරක්ෂා වන ආකාරයෙන් තමයි මේ පළාත් සභා මන්ත්‍රී ධූරය එතුමා අරගෙන ආවේ. ඒ වාගේම මම දන්නවා, අර මීට පෙර කථා කළ කථාවලදී පෙන්වා දුන් ආකාරයට පළාත් සභා මන්ත්‍රී ධූරයෙන් එහා ගිය සභාවේ ගිණුම් කාරක සභාව පවත්වන්න ඒකට අදාළ පොත් පත් හා නීති රීති, ඒ රෙගුලාසි සියල්ලක් එතුමාගේ අතේ තිබුණා. වාහනයේ පැත්තක ඒ පොත් පත් ටික තබා ගෙන තමයි එතුමා සභාවට හැමදාම එන්නේ. නැත්නම් අහවල් පොත, අහවල් ලියවිලි අමතක වුණා කියලා කවදාක්වත් අහලා නැහැ. ඒ පොත් පත් අරගෙන, සභාවේ ලිපිලේඛන අරගෙන ගිහිල්ලා කාර්යාලයේ ඒවා තැන්පත් කර තිබෙනවා. කාටවත්, කාර්ය මණ්ඩලයේ කෙනෙකුටවත්, ගෙදර නෝනා මහත්මිය ඇතුළු දරුවන්ටවත් ඒවා ඕනෑ ඕනෑ තැන්වල තියන්න අදින්න පුළුවන්කමක් නැහැ. ඒ ආකාරයෙන් තමයි පළාත් සභාවේ ගරුත්වය රැක්කේ.

දියණියන් තුන් දෙනෙකු සහ ඒ භාර්යාවත් හවුල් කර ගෙන තමන්ගේ ගණකාධිකාරි ව්‍යාපාරය පවා නොසලකා හරින මට්ටමකට පත් වෙලා දේශපාලනයට සකස් වුණු ආකාරය අපි හොඳින් දන්නවා. ඒ දේශපාලනය කරන කාලසීමාව තුළ විපක්ෂයේ දේශපාලනයට වඩා ආණ්ඩු පක්ෂයේ තම පක්ෂයෙන්ම ආපු ගල් මුල් වලට සහ ඒ බාධකවලට ඉතාමත් ශක්තිමත් ආකාරයෙන් මුහුණ දීලා ජනතා ප්‍රසාදය ලබා ගන්න එතුමාට පුළුවන්කමක් ඇති වුණේ, මේ පළාත් සභා මන්ත්‍රී ධූරයට එහා ගිය මනුස්සකමක් සහ ජනතා ලෙන්ගතු කමක් එතුමාගේ ජීවිතය පුරා තිබුණු නිසයි. මට මතකයි. කළුතර දිස්ත්‍රික්කයේ පෙර පාසල් සම්බන්ධව කථා කරනවා නම් අදත් විජේසිරි මන්ත්‍රීතුමා පිළිබඳව ඕනෑම පෙර පාසල් පාලිකාතුමියක්, පෙර පාසලක් එතුමා ගැන කථා කරනවාට නිසැකයි. ඒ පෙර පාසලට තෑගි භෝග අරගෙන තමන්ගේ අතින්ම බෙදන්න තිබුණු ආශාව. බුලත්සිංහල, අගලවත්ත වාගේ, කෙලින් කන්ද, උඩුගල කන්ද, මෝල්කාව වාගේ ඉතා දුෂ්කර පළාත්වල තියෙන පෙර පාසල් සොයා ගෙන ගියා. ඒවාට වාහනයේ යන්න බැහැ. තමන්ගේ ජීප් රථයේ යන්න බැහැ. මග නවත්වලා තමනුත් ඒවායින් කොටසක් කරේ තියා ගෙන ගිහිල්ලා පෙර පාසලට බඩු ටික භාර දීලා හති ඇරලා ආයේ කථාවක් කරනවා. තමන් ඉගෙන ගත්ත ආකාරය, දුක් වින්ද ආකාරය ගැන කථා කරලා අර මානසිකත්වයෙන් වැටිලා ඉන්න දෙමව්පියන්ව තමන්ගේ දරුවන් ඉදිරියේ බොහොම ශක්තිමත් බවට පත් කරනවා, තමන්ගේ කථාවෙන්. පෙර පාසල් අධ්‍යාපනය කරන්න ඕනෑ කොහොමද කියල හොඳාකාරව විග්‍රහයක් කරලා තමයි ඒ පෙර පාසලට බඩු බාහිරාදිය බෙදා දුන්නේ.

මට මතකයි එක අවුරුද්දක් පෙර පාසල් බඩු දීගන්න බැරුව අර නිමල් මන්ත්‍රීතුමාත් එක්ක කර ගෙන ආපු ව්‍යාපාරයට සම්බන්ධ වෙලා තිබුණු ලොරි රථයක් විකුණුවා. ඒ විකුණලත් මුදල් දැම්මේ පෙර පාසල්වලටට. ඒ ආධාර දෙන්න. මෙන්න මේ ආකාරයෙන් සමාජ තලය මත පාසල් පද්ධතියට, දහම් පාසල් පද්ධතියට අති මහත් සේවාවක් අපේ ආසනයේ සහ අපේ පළාත්වල කළා. ඒ ආකාරයෙන් විශාල සේවාවක් කරපු නිසා එතුමා පළාත් සභා ධූරය තුළ බොහොම තෘප්තිමත්ව ආසාවෙන් තමයි ඒ තනතුර

හෙබවුයේ. ඒ නිසා අද මම සතුටු වෙනවා එක පැත්තකින්. මම එතුමාගේ අඩි පාරේ ආපු නැත්නම් එතුමාගේ ගෝලයක් වශයෙන් නැත්නම් මගේ ගුරුවරයා වශයෙන් දේශපාලනයේ - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ ඉතාමත් කල්‍යාණ මිත්‍රයා වශයෙන් අපි සතුටු වෙනවා. අපේ දිස්ත්‍රික්කය, අපේ ආසනය තුළ එතුමාගේ ප්‍රතිරූපය පළාත් සභාව තුළ කොයි ආකාරයෙන් තිබුණද කියන එක පිළිබඳව, අපේ ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමන්ලා, රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාලා, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාලා මේ සභාව තුළ තමන්ගේ අදහස් ඉදිරිපත් කළ ආකාරය දැක්කාට පස්සේ තේරුණා. ඒ නිසා මම කාලවේලාවත් එක්ක මීට වඩා කථා කරන්නේ නැහැ.

කෙසේ වෙතත්, විජේසිරි මන්ත්‍රීතුමා පිළිබඳව එතුමාට ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ අපට පැය ගණනක් කථා කරන්න පුළුවන්, කථා කරනවා නම්. එතුමා කරපු සේවාව, එතුමාගේ ගතිගුණ සහ ක්‍රියා කරපු ආකාරය පිළිබඳව. ඒ කෙසේ වෙතත්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගුරුවරයා වූ, අපේ මිත්‍රයා වූ විජේසිරි මන්ත්‍රීතුමා දීර්ඝ කාලයක් අසනීප තත්ත්වයෙන් ඉඳලා එතුමා අප අතරින් වියෝ වුණා. නමුත් ඒ අසනීපයෙන් හිටපු කාලසීමාව තුළදී එතුමාගේ භාර්යාව සිරිමා විජේසිරි මැතිනිය මේ සභාව නියෝජනය කළ මන්ත්‍රීවරියක් වශයෙන්, ඒ දූලා තුන් දෙනා, බෑනණ්ඩුවන්ලා පුදුමාකාර විධියට ඒ සත්කාර උපකාර කරලා ඒ දැක්වූ සහයෝගයටත් අපි ඒ සියලු දෙනා සිහිපත් කරමින් එතුමාට නිවන් සුව කෙසේ වෙතත්, ඉදිරි භවයකදී අප අතරම ඉපදිලා මේ සමාජය තුළ අපත් එක්ක එකට ඉන්න අවස්ථාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හොරණ ප්‍රදේශයෙන් බස්නාහිර පළාත් සභාව නියෝජනය කරපු ඉතාම අවංක ගුණ යහපත් මන්ත්‍රීවරයෙක් හැටියට සේවය කරපු විජේසිරි මන්ත්‍රීතුමා වෙනුවෙන් ගුණකථන පවත්වන මේ අවස්ථාවේ වචන කිහිපයක් කථා කිරීම මගේ වගකීමක් හැටියට මා සලකනවා. විජේසිරි මන්ත්‍රීතුමා දේශපාලන කරලියට ආවේ, නැත්නම් පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වුණේ, ප්‍රජාතන්ත්‍රවාදය අතුගා දමන්න හදන අවස්ථාවක. එදා අපට මතකයි යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ජනතා විමුක්ති පෙරමුණේ තුවක්කුකරුවන්ට භයේ පක්ෂවල සමහර අපේක්ෂකයෝ ඉදිරිපත් වුණේ නැහැ. ඉදිරිපත් වූ සමහර අය ඉල්ලා අස් වුණා. එවැනි අවධියක ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් තමන්ගේ ජීවිතය පරදුවට තියලා තමන්ගේ භාර්යාව හා දරුවන් ගැන බලන්නේ නැතුව අභීත පියවරක් අරගෙන එතුමා එදා ඉදිරිපත් වුණා. ඉදිරිපත් වෙලා ජයග්‍රහණය කරලා හොරණ ප්‍රදේශයට නොවෙයි, කළුතර දිස්ත්‍රික්කයටම ඉමහත් සේවයක් කළා. විජේසිරි මන්ත්‍රීතුමා මන්ත්‍රීවරයෙක් හැටියට ජීවත් වුණු කාලය තුළ හොරණ ප්‍රදේශයේ අධ්‍යාපනය වෙනුවෙන් විශේෂ උනන්දුවක් දක්වපු මන්ත්‍රීවරයෙක්. ළදරු පාසල් අධ්‍යාපනය වාගේම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සෑම අවස්ථාවක්ම හොයා බලලා, එතුමා ඒ ප්‍රදේශය භාර ගෙන ඉතාම සැළසුම් සහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා හොරණ ප්‍රදේශයේ අධ්‍යාපනය නගා සිටුවන්න, කළුතර දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය නංවන්න, දුප්පත් පවුල්වල දරුවන්ට අවස්ථාවක් සලසා දෙන්න එතුමා බොහොම කැපවීමෙන් කටයුතු කළා. ඒ වාගේම අපේ කම, ගමේ කම අත් නොහරිපු මන්ත්‍රීවරයෙක්. ප්‍රාදේශීය සභාවට, පළාත් සභාවට ආවා කියලා නොවෙයි, එතුමා කවදාවත් ගමේ කම අත් හැරියේ නැහැ. අපේ කම අත්හැරියේ නැහැ. එතුමා ඒ කටයුතු කිරීම සම්බන්ධව දුන් වැදගත් ආදර්ශයක් හැටියට මා දකිනවා. එතුමා ඕනෑම වේලාවක නිර්භයව කටයුතු කළා. මොන තර්ජනයක් ආවත් පාරට බැහැලා අවශ්‍ය තැනදි රුස්වීම් තියලා සමහර අවස්ථාවල එතුමා යන තැන්වලදී තවත් අපේක්ෂකයෙක් මරලා දාපු අවස්ථා අපි දැක්කා. ඒවාට බිය වෙන්නේ නැතුව එතුමා, එතුමා යන ගමන ගියා. නිර්භීත එවැනි මන්ත්‍රීවරු නොසිටියා නම්, එදා පළාත් සභා පවත්වන්න නොහැකි තත්ත්වයක් තිබුණේ. එවැනි අවධියක ඉදිරිපත් වෙලා පළාත් සභාව ජයග්‍රහණය කළේ. ඒ ජයග්‍රහණය කරලා එතුමා සමාජයට විශාල සේවයක් කළා. ඒ සේවය කිරීමේදී එතුමා බොහොම අවංකව නීත්‍යානුකූලව කටයුතු කරපු කෙනෙක්. බොහොම නීතියට ගරු කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම එතුමාව සලකනවා.

එතුමා දේශපාලන ක්ෂේත්‍රයේ පමණක් නොවෙයි. අපේ ප්‍රදේශයේ සිංහ සමාජය තුළින් හොරණ ප්‍රදේශයට විශාල සේවයක් කළා. සිංහ සමාජයට සම්බන්ධ වෙලා දුගී දුප්පත් ජනතාවගේ දරුවන්ට ඇස් කණ්ණාඩි නැති අයට, ඇවිදින්න බැරි අයට, අනෙකුත් මාර්ග සංවර්ධනයට, නිවාස හදන්න ආදී ව්‍යාපෘති ආරම්භ කරලා හොරණ ප්‍රදේශයේ සිංහ සමාජය තුළ විශාල වැඩ කොටසක් කරපු කෙනෙක් හැටියට එතුමා මේ අවස්ථාවේදී හඳුන්වන්න පුළුවන්.

ඒ වාගේම එතුමා ආදායම් බදු උපදේශකවරයෙක් වශයෙන් කටයුතු කළා. විශාල පිරිසකගේ ආදායම් බදු උපදේශක කාර්ය භාරයක් භාර අරගෙන තිබුණේ. දේශපාලනයට එන කොට යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ. ඒවා ඔක්කොම අත්ඇරලා දේශපාලනයට ආවාම සම්පූර්ණයෙන්ම දේශපාලනය කරට අරගෙන කටයුතු කළා. සම්පූර්ණ කාලය මිඩංගු කළේ ඒ වෙනුවෙන්. ඒ තුළින් විශාල මෙහෙවරක් කළා. එතුමා ඒ කාලය තුළ ගත්ත උත්සාහයේ ප්‍රතිඵලයක් තමයි ජනතා ප්‍රසාදය. එතුමාගේ භාර්යාව ඊට පස්සේ ඡන්දය ඉල්ලපු වෙලාවේ එතුමියට ජයග්‍රහණය කරන්න පුළුවන්කම ලැබුණේ විජේසිරි මැතිතුමා කරපු සමාජ මෙහෙවරේ ජනතාවගේ ප්‍රසාදය නිසයි කියන එකයි මම මතක් කරන්න කැමතියි. එවැනි අවස්ථාවකට කටයුතු කරන්න පුළුවන්කම ලැබුණේ එතුමා ගේ කටයුතු අනුව. එතුමා ශ්‍රේෂ්ට මනුස්සයෙක්. අවංකව කටයුතු කරපු කෙනෙක්. දේශපාලනයෙන් අබමල් රේණුවක වංචාවකට ලක්

වුණේ නැහැ. ගෞරවයට පාත්‍ර වුණා විතරයි. ඒකත් සමාජයේ දුර්ලභ අවස්ථාවක් හැටියට අපට හුවා දක්වන්න පුළුවන්කම තියෙනවා.

මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. තව කිහිප දෙනෙක් කථා කරන්න ඉන්නවා. අපේ විජේසිරි මන්ත්‍රීතුමා පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කළත්, එතුමා ගෙනාපු දක්ෂතාවයෙන් එතුමාට සමීප වුණු ජනතාව දිහා බැලුවාම එතුමා නවතින ගමනක් නොවෙයි ආවේ. යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, එතුමා අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තුව නියෝජනය කරන්න හිටපු කෙනෙක්. නමුත් එතුමාට එතුමාගේ පැත්තෙන්ම යම් යම් බාධක හා කැපිලි ආවා. නැත්නම් අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තුව දක්වා යන්න තිබුණා. ඒ තරම් හැකියාවක්, දක්ෂතාවයක් සහ ජනතා සමීප සම්බන්ධතාවයක් ගොඩ නගා ගෙන කටයුත කරපු මන්ත්‍රීවරයෙක් හැටියට හඳුන්වන්න පුළුවන්.

දේශපාලන ජීවිතය වාගේම සමාජ සේවයට එවැනි දේවල් උපයෝගී කර ගත්තා. මා ඉස්සෙල්ලා කිව්ව සිංහ සමාජය තුළින් වාගේ. ඒ ව්‍යාපෘතිවලටත් සම්බන්ධ වෙලා මහජන සේවයට කැප වෙලා වැඩ කිරීමේ වුවමනාවක් හැඟීමක් තිබුණු කෙනෙක් හැටියට මට හඳුන්වන්න පුළුවන්. එතුමා කෙටි කාලයක් තුළ මේ ගමන එද්දි අසනීප තත්ත්වයට පත් වුණා. එතුමා අසාධ්‍ය තත්ත්වයට පත් වුණු වෙලාවේ විශාල කාර්ය භාරයක් එතුමාගේ භාර්යාව ඇතුළු දරුවන් භාර අරගෙන තිබුණා. ඇත්ත වශයෙන්ම අවංකව කිව්වොත් එතුමාට දීර්ඝ කාලයක් ජීවත් වෙන්න පුළුවන්කම ලැබුණේ ඒ භාර්යාව සහ දරු පිරිස එතුමාට සලකපු සත්කාර කරපු ආකාරය නිසයි. විශාල කැපවීමකින් එතුමා රට, ජාතියට වැඩ කළා. ඒ වාගේම තමන්ගේ දරුවන්ට භාර්යාවට වැඩ කළා වාගේම දරුවන්ගෙන් සහ භාර්යාවගෙන්, හිතවතුන්ගෙන් උපකාර ලබන්න අවස්ථාව සැලසුනා. එතුමා දීර්ඝ කාලයක් රෝගාතුරව සිටියා. ඒ අය බොහොම හොඳින් බලා ගත්ත නිසා තමයි මෙපමණ කාලයක් ජීවත් වෙන්න පුළුවන්කම ලැබුණේ. මම හිතනවා එතුමා අප අතරින් වෙන් වෙලා ගියත්, මතු භවයේදී සමාජ සේවය කරන්න පළපුරුද්දක් හා වුවමනාවක් තිබුණු කෙනෙක් හැටියට එතුමා අප අතර ඉපදිලා සමාජ සේවය කරලා අප අදහන ආගමට අනුව අවසානයේ නිවන් සුව සාක්ෂාත් කර ගන්න වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරන අතර, මගේ ශෝකය ඔබතුමාගේ මාර්ගයෙන් පවුලේ අයට දන්වන අතර එතුමාට මතු භවයේදී නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පුරා දශකයකට අධික කාලයක් බස්නාහිර පළාත් සභාව නියෝජනය කරමින්, අති මහත් දැවැන්ත ජනතා මෙහෙවරක යෙදුනු කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කළ අපේ දයාබර හිතවතෙක් හැටියට ඩබ්ලිව්.කේ. විජේසිරි මැතිතුමන් පිළිබඳ ගුණ සිහිපත් කරන මේ මොහොතේ, එතුමා වෙනුවෙන් වචනයක් කථා කරන්න අවස්ථාව සලසා දීම සම්බන්ධයෙන් ගරු ඔබතුමාට මගේ ප්‍රශංසාව පළමු කොට පුද කරන්න කැමතියි. 1988 ඒ වාගේම 1993 සහ 1999 කියන මේ පළාත් සභාවන් තුනේම ගරු මන්ත්‍රීවරයෙකු හැටියට තේරී පත් වෙලා එතුමා කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවට පමණක් නොවෙයි, සමස්ත බස්නාහිර පළාත් සභාවට කළ අනුපමේය සේවය පිළිබඳව මම හිතන්නේ අද දවසේ කළුතර දිස්ත්‍රික්කය පමණක් නොවෙයි, බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන විශාල මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් කරුණු පැහැදිලි කළා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මනුෂ්‍යයින් මේ ලෝකයේ බිහි වුණාට පසුව ඔවුන් විවිධ කුසලතාවයන් මත විවිධ ක්ෂේත්‍ර කරා හඹා යනවා. ගරු විජේසිරි මන්ත්‍රීතුමා ගිණුම්කරණයේ දක්ෂයෙකු හැටියට තමන් සහජයෙන් ලබපු ඒ විශේෂ දැනුම පොදුවේ තමාගේ ජීවන වෘත්තිය හැටියට කරගෙන යාමට අමතරව, සමස්තමය පළාත් සභාව වෙනුවෙන් එය පරිහරණය කරමින් කළ ඒ අනුපමේය සේවය පිළිබඳව මම හිතන්නේ අපි කවුරුත් අගය කොට සැලකිය යුතුයි. පසුගිය ගිණුම් වාර්තා පිළිබඳව ගිණුම් කාරක සභා වාර්තා පරීක්ෂා කර බැලුවොත් ඉතිහාසයේ විජේසිරි මන්ත්‍රීතුමා ගිණුම් කාරක සභාවේ සභාපතිවරයා හැටියට ක්‍රියා කළ වකවානුව තුළ ඔහු විසින් කළ සේවය පිළිබඳව හොඳින් පැහැදිලි වෙනවා. මොකද, ඒ තරම් පිරිසිදු ගිණුම්කරණ වාර්තා මේ පළාත් සභාවේ පුස්තකාලය තුළ තවත් නැතුවා ඇති. වැරදි දුටු කළ කවදාවත් ඔහුගෙන් සමාවක් තිබුණේ නැහැ. මා දන්නා විධියට. ඔහු තමා ඉතා නිවැරදිව ජීවත් වෙන්න උත්සාහ කරනවා වාගේම, සමහරෙක් තුළ යම්කිසි වැරැද්දක් දුටුවොත් ඒ වැරැද්ද ඉතා නිවැරදිව අවබෝධ කර ගෙන ඊට අවශ්‍ය නිසි දඬුවම පැමිණවිය යුතුයි කියන මතය තුළ දැඩිව ක්‍රියා කළ කෙනෙක්. ඒ වාගේම අපේ අබේරත්න ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, රෝසමල් යහනාවකින් දේශපාලනයට ප්‍රවේශ වුණු කෙනෙක් නොවෙයි. තමන්ගේ දේශපාලන මතය ප්‍රකාශ කරන කොට ඒකට ගිනි අවියෙන් පිළිතුරු දෙන යුගයක ඒ ගිනි අවියේ අභියෝගයට මොහොතකටවත් පසුබට නොවී ඉතාමත් අභීතව තමන් විශ්වාස කරන දේශපාලන මතය වෙනුවෙන් පෙනී සිටි ශ්‍රේෂ්ට නායකයෙක් හැටියට අපි එතුමාට අති මහත් වූ ගෞරවයක් තිබෙනවා.

කෙසේ වෙතත්, ගරු නියේජ්‍ය සභාපතිතුමනි, ජීවත් වන අප කවදා හෝ යා යුතු ගමනක එතුමා අද අප අතරින් වෙන් වී ගොස් තිබෙනවා. අද ශ්‍රේෂ්ටත්වය පිළිබඳ අපට යමක් කථා කරන්න අවශ්‍ය පසුබිම එතුමා ජීවත් වුණු වසර 66 ක පමණ ඉතිහාසය පුරා එතුමා ඉතාමත් සශ්‍රීකව වපුරා තිබීම තමයි අපට එතුමා පිළිබඳව ඉතාමත් ස්වාධීනව සහ හෘද සාක්ෂියට දැනෙන්න කථා කරන්න පුළුවන්කම තිබෙන්නේ. බොහෝ විට මෙවැනි අවස්ථා අපට ඉදිරිපත් වුණාට පස්සේ අපි කථාවන් කරනවා. නමුත් සමහරක් විට කථා කරන වචන කථා කරන්නේ ආයාසයෙන්. නමුත් අද දවසේ විජේසිරි ගරු මන්ත්‍රීතුමාගේ මේ ගුණ සිහිපත්

කරන මොහොතේ මේ කථා කරන හැම වචනයක්ම කථා කරන්නේ ඉතාමත් සැහැල්ලුවෙන් සහ හදවතේ ඉතාමත්ම නිරවද්‍ය භාවයකින් යුක්තවයි. ඔබතුමා ඇතුළු මා ඒ පිළිබඳ බොහෝ දේ දන්නවා. ඔබතුමාත් එතුමාත් අතර කල්‍යාණ මිත්‍ර භාවය පිළිබඳවත් අපි බොහෝ විට දන්නවා. යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමා ඉතාමත් අව්‍යාජව ප්‍රකාශ කළා, මම විජේසිරි මන්ත්‍රීතුමාගේ ගෝලයෙක් කියලා. මම ස්තුතිවන්ත වෙනවා එතුමාට.

ඇත්ත වශයෙන්ම ඒක ඉතා නිවැරදියි. ඔහු වාසනාවන්තයි. තමන්ගේ දේශපාලන කටයුත්ත කරන අතරතුර තමන් නැති කළ ඒ අසිපත ඉස්සරහට අරන් යන්නත් කවුරු හරි කෙනෙක් හදන්න පුළුවන් නම් කෙනෙකුට ඒක ඉතාමත් ශ්‍රේෂ්ට ක්‍රියාවක්. ඔහු ඒ සියලු යුතුකම් නිවැරදිව ඉෂ්ට කරපු නායකයෙක්. මට මතකයි විජේසිරි ගරු මන්ත්‍රීතුමා පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් සේවය කරමින් සිටියදී රෝගාතුර භාවයට පත් වුණෙත් කොළඹ දී. එතුමා රෝගාතුර භාවයට පත් වුණාට පස්සේ රෝහල්ගතව ඉඳලා නිවසට ගියාට පස්සේ අපි දින ගණනාවක් එතුමා බැහැ දකින්න ගියා. ඒ ගිය හැම මොහොතකම තමන්ට තමන්ගේ අදහස් ඉතාමත් විවෘතව ප්‍රකාශ කරන්න බැරි වුණා. තමන්ගේ හදවතින් දැනෙන මිත්‍රශීලී මිතුරන් හමු වුණාම දැනෙන ලෙන්ගතුකම එතුමා ප්‍රකාශ කරන්න අසීමිත වෙහෙසක් දැරුවා. ඒ හදවත තුළ කැකෑරෙන, පළාත් සභාවේ තමන්ගේ ආදරණීය සහෝදරයෙක් කියන එක පිළිබඳව එතුමාට හොඳින් දැනුනා. ගෙදරට ආවාම ව්‍යාංගාර්ථයෙන් හරි සංග්‍රහයක් කරන්න කියලා තමන්ගේ ආදරණීය බිරිඳට ආයාචනා කරනවා අපි දුටුවා. ඒ නිසා ඒ මනුස්සකමේ ප්‍රතිමූර්තිය කවදාක්වත් ජීවිතයේ අපට අමතක වන්නේ නැහැ, එතුමා අප අතරින් වියෝවී සිටියත්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මේ පළාත් සභාවේ කථා කරන අපට 1993 අපි මුලින්ම මේ පළාත් සභාවට පිය නඟන දවසේ හිටිය පළාත් සභා මන්ත්‍රීවරුන් හැටියට කටයුතු කරපු බොහෝ දෙනෙක් අද අපට දකින්න නැහැ. සමහර අය මහජන මන්ත්‍රී ධූරයෙන් ඉවත්ව ගොසින්. සමහර අය ජීවිතයෙන් සමුගෙන ගොසින්. කෙසේ වෙතත්, අප සැම දෙනාටම උරුම වුණු පොදු සනාතන ධර්මතාවයක් තමයි, කවදා හරි දවසක මනුස්සයෙක් හැටියට මේ සමාජය තුළ කටයුතු කරමින් සිට සමාජයෙන් සමුගෙන යෑම. ඒක අපි හැමෝටම පොදු සනාතනික ධර්මතාවයක්. ඒ කෙසේ වෙතත්, මා පෙර කී සේම විජේසිරි ගරු මන්ත්‍රීතුමාගේ දයාබර බිරිඳ, සිරිමතී විජේසිරි මැතිනිය, එම දියණියන් තිදෙනා සහ ඒ බෑණාවරුන් විජේසිරි ගරු මන්ත්‍රීතුමා අසනීප වුණාට පස්සේ තමන්ගේ ශක්තියෙන් තමාට ස්වාධීනව ජීවත් වෙන්න නොහැකි වුණාට පස්සේ මහ පුදුම, දැවැන්ත රැකවරණයක් ඔවුන් විසින් සැපයූවා. මේක ඉතාමත්ම ආදර්ශවත්. එතුමාගේ අවසාන කටයුතු යෙදී තිබුණු දවසේත් මම මේ පිළිබඳව සිහිපත් කළා. මේක අපේ හැන්සාඩ් වාර්තාවේ ගෞරවනීය වචනයක් හැටියට සටහන් කරන්නට ඕනෑ. ඔහුට මොහොතකට හෝ දුකක් නොදැනෙන්නට, ඔහු කළ යුතු සියලු කාරණා මොන ආර්ථික ප්‍රශ්න හෝ මොනයම් බාධක තිබුණත් ඒ කිසි දෙයක් පිළිබඳ අල්පමාත්‍රයක්වත් නොසිතා නොපිරිහෙලා ඒ දයාබර බිරිඳ සහ දරුවන්, බෑණාවරුන් ඒ සියලු කටයුතු ඉෂ්ට සිද්ධ කළා. මේක ඉතාමත් වාසනාවන්ත තත්ත්වයක්. මුළු දේශපාලන ව්‍යුහය තුළ කටයුතු කරන සියලුම ගරු මන්ත්‍රීවරුන්ට සහ ඔවුන්ගේ පවුලවලට මේක යහපත් වූ ආදර්ශයක්. ඒ අන් කිසිවක් නිසා නොවෙයි. ඔහුගේ තිබුණු ගුණ සුවඳ නිසාම ඒ පවුල බොහොම ආදරණීය ලෙස වෙලී සිටියා. එම නිසා සිරිමතී විජේසිරි මැතිනිය, තමන්ගේ දයාබර ස්වාමි පුරුෂයා ගිය ගමන් මග ගමන් කරමින් තමන්ගේ ජනතාවට සේවය කිරීමේ කාර්ය භාරයේ යෙදී සිටියා.

කෙසේ හෝ එතුමා වෙනුවෙන් පැවරී තිබුණු කාර්ය භාරය අතරේ දේශපාලන කටයුතු ඉදිරියට කරගෙන යාමට තිබූ අපහසුතා මත එතුමිය ඊළඟ වර්ෂයේ දේශපාලන ක්‍රියාවලියෙන් ඉවත් වුණත් තමන්ගේ සදාදරණීය ස්වාමි පුරුෂයා වෙනුවෙන් සමාජයට කරන්න ඕනෑ මෙහෙවර සමග බැඳී සිටියා කියන එක අපි ඉතා හොඳින් දන්නා කාරණාවක්. ඒ කාලය තුළ අපත් සමග තිබුණු දැඩි ඇසුර නිසාම. මම පුන පුනා මේ පිළිබඳව තවත් කථා කරන්න අවශ්‍ය නැහැ. අවශ්‍ය පමණට මේ පළාත් සභාවේ සහෝදර ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ වුණා. අශෝකා ලංකාතිලක අපේ ආදරණීය මන්ත්‍රීතුමිය ඇතුළුව. 1946 පෙබරවාරි මාසේ 27 වැනිදා ජන්ම ලාභය ලැබූ ඒ කුල කුමරුවා 2012 සැප්තැම්බර් මාසේ 23 වැනිදා අප අතරින් සදහටම සමු ගෙන ගියත් ඩබ්ලිව්.කේ. විජේසිරි කියන ඒ ශ්‍රේෂ්ට නාමය තවත් වසර ගණනාවක් අපේ ජීවිත කාලයෙන් පසුවත් මේ පළාත් සභාව තුළ ඉතාමත් යහපත් ලෙස සඳහන්ව තිබෙනවා. ඒ පිළිබඳව තව තවත් අනාගතයේ බිහි වන මන්ත්‍රීවරුන් කථා කරාවි කියලා විශ්වාස කරනවා. මොකද, ඔහුගේ ඉතිහාසය ඒ තරම් පැහැදිලියි. ඒ නිසා මට තවදුරටත් ඒ පිළිබඳව කථා කිරීමේ අවශ්‍යතාවයක් නැහැ.

අවසාන වශයෙන් මගේ සදාදරණීය මිතුරාට, අපේ ආදරණීය ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයාට - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සසර ගමන බොහොම දුරයි. බෞද්ධයෙක් හැටියට එතුමා ජීවත් වුණේ. මමත් බෞද්ධයෙක් නිසා මට පැහැදිලිව කථා කරලා කියන්න පුළුවන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක ආත්ම භවයක් පිළිබඳව බෞද්ධයෙක් කථා කරන්නේ, අම්බලමක ගත කරන රාත්‍රියක් පිළිබඳව කථා කරන ස්වභාවයෙන්. ඒ තරම් කෙටි කාලයක් ආත්මයක් කියලා කියන්නේ. මම විශ්වාස කරන්නේ. මේ ගමනේ තව බොහෝ දුර අපට යන්න තිබෙනවා. බුදුන්ගේ ධර්මය අනුව අපි කවදා හරි මේ ගමන අවසාන කරන්න ඕනෑ, නිර්වාණ අවබෝධය තුළින්. ඒ ගමනේදී නිර්වාණය අවබෝධ කර ගැනීම ඉතාම පහසු කාරණාවක් නොවෙයි. ඒ ගමනේදී අපට නැවත නැවතත් ඒ සදාදරණීය මිත්‍රත්වය මේ සසර ගමනේදී මුණ ගැසේවා කියලා ප්‍රාර්ථනා කරමින් අවසානයේ අප ප්‍රාර්ථනා කරන, අප විසින් මෙතෙක් අත්පත් කර ගත් සියලුම පුණ්‍ය ධර්මවල ශක්තියෙන් විජේසිරි ගරු මන්ත්‍රීතුමාට එළැඹෙන

ආත්මය ඉතාමත් සුභවාදී ආත්මයක් වේවා. අනාගතයේ සසර ගමනේදී අපට ඔබව මුණ ගැසේවා. ඉන් අනතුරුව උතුම් වූ නිර්වාණ සම්පත්තිය දැකීමෙන් සසර ගමන කෙළවර කර ගනිත්වා කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. මම හිතන්නේ හදවතේ බොහොම සමීපතම දේශපාලන චරිත දෙකක් පිළිබඳවයි අද බස්නාහිර පළාත් සභාවේ ශෝක යෝජනා ඉදිරිපත් වෙන්නේ. විශේෂයෙන් ඩබ්ලිව්.කේ. විජේසිරි මැතිතුමන් මේ පළාත් සභාව ක්‍රමය බිහි කිරීමෙහිලා සහ ස්ථාපිත කිරීමෙහිලා අනගි ඒ වාගේම ඉතාම උත්කෘෂ්ට මෙහෙවරක් කරපු දේශපාලඥයෙක් හැටියට අපි කවුරුත් බොහොම හොඳින් එතුමාගේ ගුණ, එතුමාගේ සේවාව, සිහිපත් කරනු ලැබුවා. එතුමාගේ කාර්ය භාරය, එතුමා පළාත් සභාවට වාගේම ස්වකීය දූ දරුවන්ට මෙන්ම එතුමාගේ ආදරණීය ජනතාවටත් ඉමහත් සේ ආදරය කළා. යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වාගේ මා සිටිය යුත්තේ මූලාසනයේ නොවෙයි කියලයි මම මොහොතකට කල්පනා කළේ. මට අදහසකුත් ඉදිරිපත් කරන්න ඕනෑ. විජේසිරි ගරු මන්ත්‍රීතුමාත් මමත් එකටම – එතුමාට බස්නහිර පළාත් සභාවෙන් ලැබුණු නිල රථය, මම හිතන්නේ අවසාන මොහොත වනකොට ඉතුරු වී තිබුණු එකම නිල රථය. මේ නිල රථයෙන් මාව හමු වෙන්නට එන්නට පෙර අතරමගදී මට දුකරථන ඇමැතිතුමක් දෙනවා ලොකු හිනාවක් දාලා. මම පෙරමග බලාගෙන ඉන්නවා. එතුමාගේ ඒ නිල රථයේ පිටුපස සීට් එකේ හතර දෙනෙක් හෝ පස් දෙනෙක් නංවාගෙන ඊටත් පිටුපස අර කුඩා අසුන් දෙකේ තවත් තරුණයෝ කිහිප දෙනෙක් නංවාගෙන, යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එතුමාගේ වාර්ෂික දින පොතේ පවතින කොල සංඛ්‍යාවට වඩා තවත් ඒ වාගේම ලිපි සංඛ්‍යාවක් හුවාගෙන, දවසේ වැඩ සටහන ඉතාම නිරවද්‍ය විධියට, න්‍යාය පත්‍රයක් ලෙස සකස් කරලා ඒක වාහනයේ ඉස්සරහින් තියාගෙන තමයි මා හමු වෙන්න එන්නේ. එන්නට පෙර ඉතාම නිවැරැදි, සැලසුම් සහගත, දවසේ වැඩ කොටස නිමා කිරීමේ පරම අභිලාෂයෙන්මයි නිවසින් බැහැර වෙන්නේ. දරුවන්ට, බිරිඳට කොතෙක් ආදරය කළත් මා දැනුවත්ව සිටි නිසාවෙන් කියන්නේ, නිවස ගැන කිසි දෙයක් සොයා බලන්නට එතුමා වෙහෙස මහන්සි වුණේ නැහැ. එතුමා නැති මොහොතක නිවසට ආගිය කෙනෙකුට කිසියම් සමාජයීය උවමනාවක් වෙනුවෙන් පැමිණි කෙනෙකුට යම් තරමක හෝ උපකාරයක් එහෙම නැත්නම් තේ කෝප්පයකින් හෝ නොසලකා තිබුණොත් ඒ පිළිබඳව චෝදනාවත් විජේසිරි මැතිනියට ලැබෙනවා කියලා පවුලේ කෙනෙක් හැටියට මම දන්නවා. එතරම්ම ඒ නිවස, කාර්යාලය, ගේ දොර ජනතාව වෙනුවෙන් විවෘතව තිබුණා. පුදුම ආදරයක් පළාත් සභාවට

[ ගරු නියෝජ්‍ය සභාපතිතුමා ]

තිබුණේ. මුතු කැට වාගේ ලස්සන අකුරෙන් පළාත් සභාවේ ලිය වුණු ඉතිහාසයක් තිබෙනවා. ඒ ඉතිහාසයේ පුරෝගාමීත්වයත් ඩබ්ලිව්.කේ. විජේසිරි මැතිතුමාට තිබෙනවා. ගිණුම් කාරක සභාවේ විතරක්ම නොවෙයි. සියලුම කාරක සභා නියෝජනය කරන්න එතුමාත් මමත් එකට ආවේ. අපව නියෝජනය වෙලා තිබුණේ, හුදෙක් එක් උපදේශක කාරක සභාවක් වෙන්නට පුළුවන්. එසේ වුවත් අනෙකුත් උපදේශක කාරක සභාවල නොවැරැදීම සහභාගී වෙලා ඒ සේවාව ගමට ගෙනියන්න, ජනතාවට ගෙනියන්න ගරු මන්ත්‍රීතුමාත්, මමත් බොහොම ලෙන්ගතුව එකට බැඳී සිටියා. මම මේ වෙලාවේ වැඩි වේලාවක් ගන්නේ නැහැ. නමුත් මටත් යුතුකමක් තිබෙනවා. මම ඒකයි කථා කරන්නේ. එතුමාත් මමත් එකට කොහේ හරි තේ කෝප්පයක් බිව්වා නම්, දිවා හෝ රාත්‍රී ආහාර භෝජනයට එකට වාඩි වෙන්නේ. විදේශගත වූ අවස්ථාවලදී, එහෙම නැත්නම් සම්මන්ත්‍රණවලදී එතුමා මටත් කලින් ගිහිල්ලා එතුමාගේ නමයි මගේ නමයි ඒ ආරාධනා පත්‍රයේ සටහන් කරලා බොහොම ආදරයෙන් මට ආරාධනා කරනවා. අපි දෙන්නා තමයි අද මේ එකට යන්නේ එන්නේ කියලා. ඉතින් ඒ තරම් හොඳ සමීප ලෙන්ගතු මිත්‍රශීලී සහෝදර බැම්මක් විජේසිරි ගරු මන්ත්‍රීතුමා ළඟත්, මා ළඟත් තිබුණා. එතුමාගෙන් මම ඉගෙන ගත්තු බොහෝ දේ තිබෙනවා. නිරවද්‍ය, නිවැරැදි මහජන සේවාවේ යෙදුණේ. අවංකව ශත පහකවත් අල්ලසක්, දූෂණයක් නොමැති ඉතාම උතුම් චරිතයක්. ඒ ගුණය අපේ ජීවිතවලට ආදේශ කර ගන්නට මම උත්සුක වුණා. පිළිවෙළකට සැලසුමකට වැඩ කළ විජේසිරි ගරු මන්ත්‍රීතුමාගෙන් බොහෝ දේ මමත්, උගෙන ගත්තයි කියන කාරණාවත් මේ වෙලාවේදී එතුමාට ගෞරවයක් හැටියට මම මතක් කරන්නට ඕනෑ.

ඒ නිසාවෙන් අද දවසේ විශේෂයෙන් අපේ ගරු සභානායකතුමා තමන්ගේ වගකීම ඉතාම හොඳින් ඉෂ්ට කළා. මම මූලාසනයේ හිටියත් හොඳින් කන් යොමා, සවන් යොමා සිටියා. එතුමාගේ සේවාව පිළිබඳව ඉතාම හොඳ ගුණ කථනයක්, සාරගර්භ ගුණ කථනයක් ගරු සභානායකතුමා වෙතින් කෙරුණා. රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා වෙතින් එතුමාගේ දේශපාලන ප්‍රවේණිය, ඉතිහාසය, එතුමාගේ දේශපාලනයේ ආරම්භක කාලය, මහජන පක්ෂයේ විජය කුමාරතුංග මැතිතුමන් සමග ඒ දේශපාලන ගමන් මහ පිළිබඳව ඉතාම හොඳින් පැහැදිලි කළා. ඒ වාගේම ඒ.එම්. යූසුප් ගරු මන්ත්‍රීතුමා සමකාලීනයෙක් ලෙස ලෙන්ගතු මිතුරෙක් ලෙස දුක් කම්කටොළු පීඩා මැදින් පළාත් සභා ක්‍රමය ස්ථාපිත කිරීමෙහිලා එතුමා වෙතින් ඉෂ්ට සිද්ධ වුණු සේවාව පිළිබඳව ඉතාම හොඳින් අවධානයට ලක් කළා. ඒ වාගේම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා සුපුරුදු පරිදි එතුමාගේත්, කොමියුනිස්ට් පක්ෂයේත් ගෞරවය සහ ගුණ කථනය ඉතාම හොඳින් ඉෂ්ට කළා. ඒ වාගේම අශෝකා ලංකාතිලක මැතිනිය විජේසිරි ගරු මන්ත්‍රීතුමාව බොහොම ළඟින් ආශ්‍රය කළ ගරු මන්ත්‍රීතුමියක්. මම දන්නවා. බොහොම ලොකු හිනාවක් දාලා, බොහොම ආදරයෙන් ළඟින් කථා කරලා මම හිතනවා ඇය

විජේසිරි ගරු මන්ත්‍රීතුමා ළඟින් ඇසුරු කළ කෙනෙක් හැටියට එතුමාගෙන් බොහෝ දේ උගෙන ගන්න ඇතියි කියලා. එතුමිය බොහෝ ගෞරවනීය කථාවක් කළා. ඒ වාගේම අපේ පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා තමන්ගේ ආසනය වන හොරණ ආසනයේ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් බොහොම හොඳ සාරගර්භ කථාවක් කළා. ඒ වාගේම අපේ ජගත් අංගගේ ගරු අමාත්‍යතුමා දීර්ඝ කාලයක් විජේසිරි ගරු මන්ත්‍රීතුමා ආශ්‍රය, නිඃශ්‍රය කොට එතුමාගේ ගුණ සුවඳ හොඳින් දැන හඳුනා ගත් අමාත්‍යතුමෙක්. එතුමාගේ කථාවෙනුත් විජේසිරි ගරු මන්ත්‍රීතුමාගේ මහජන මෙහෙවර මොනවාට පැහැදිලි වුණා. මම හරි සන්තෝෂයි මතක් කරන්න අපේ යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමා ගුරුවරයෙක් හැටියට හොරණ විද්‍යාරත්නයේ කටයුතු කරපු කෙනෙක්. එවකට දේශපාලනයට එන්නට පෙරාතුව සමාජ මෙහෙවරට යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමාව සම්බන්ධ කර ගත්තා. ඒ නිසාවෙන් එතුමා හොඳ දරුවෝ ටිකක් හැදුවා වාගේම හොඳ දියණිවරුන් තුන් දෙනෙක් ඉන්නේ. හොඳ පුතෙක් හැදුවා. ඒ යසපාල කෝරලගේ පුතා කියලයි මම විශ්වාස කරන්නේ. අද හොරණ, කළුතර දිස්ත්‍රික්කය පුරාවට ඉෂ්ට සිද්ධ කරන මහජන මෙහෙවරට දායක වෙන්න විජේසිරි ප්‍රවේණියේ ඊළඟ පුරුක හැටියට යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමාව බිහි කළා.

ඒ නිසාවෙන් මේ මොහොතේ අද සභාවේ පිරිස තරමකට අඩු වුණේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ විශේෂිත රැස්වීම් කිහිපයක් අද දවස තුළ පැවැත්වෙන බැවින් බව මතක් කරන්නට ඕනැ. මාධ්‍යවේදීන් පවා ඉන්න මොහොතේ. නොවැළැක්විය හැකි රැස්වීම් කිහිපයක් පැවැත් වෙනවා. එසේ වුවත් ඒ අඩුව නොදැනෙන්නට අපේ සභාවේ ගරු සභානායකතුමාත්, ගරු අමාත්‍යතුමාත්, අපේ සංවිධායකතුමාත් අනෙක් ගරු මන්ත්‍රීතුමන්ලා සියල්ලම කටයුතු කළා. ඒ වෙනුවෙන් මූලාසනයේ ස්තුතිය, ගෞරවය ඒ සියලු දෙනා වෙත පිරිනැමෙනවා. විශේෂයෙන් උතුම් වූ බිරිඳක් හැටියට සම්බුලාදේවී චරිතය මට මතක් වෙනවා. විජේසිරි ගරු මන්ත්‍රීතුමා අසනීප වූ මොහොතේ සිට අවසන් කටයුතු ඉෂ්ට සිද්ධ වන ගෞරවාන්විත අවස්ථාව දක්වා අද දවසේත් සිරිමතී විජේසිරි මැතිනිය - අපේ පළාත් සභාවේ හිටපු මන්ත්‍රීතුමියක්. ඇය ආදරණීය බිරිඳ හැටියට කටයුතු කළා. දියණියන් තුන්පොළක් සිටිනවා. ඒ දියණියන් තුන්පොළත් එසේමයි. බෑණාවරුත් එසේමයි. ඒ නිසාවෙන් බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා ප්‍රධාන සියලුම ගරු අමාත්‍යතුමන්ලා, පක්ෂ විපක්ෂ සියලු ගරු මන්ත්‍රීතුමන්ලාගේ ගෞරවය සහ ශෝකය මේ අවස්ථාවේදී සිරිමතී විජේසිරි මැතිනිය ඇතුළු පවුලේ දූ දරුවන් සහ ඥාතීන් සියලු දෙනාටම පුද කරනු ලබනවා. ඒ වාගේම ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් ඇතුළත් මේ හැන්සාඩ් වාර්තාව සිරිමතී විජේසිරි මැතිනිය ඇතුළු දූ දරුවන් වෙත ලබා දෙන්නට කටයුතු කරන ලෙස මම ලේකම්තුමාට දැනුම් දෙනවා. බස්නාහිර පළාත් සභාවේ ගෞරවය මේ අවස්ථාවේදී යළිත් විජේසිරි ගරු මන්ත්‍රීතුමාගේ පවුලේ අයට පුද කරමින් ඩබ්ලිව්.කේ. විජේසිරි ඒ කෘතහස්ත ජ්‍යෙෂ්ට දේශපාලඥයා, අපේ ආදරණීය ගරු මන්ත්‍රීතුමාට නිවන් සුව අත්වේවායි පතමින් බස්නාහිර පළාත් සභාව හැටියටත්, මූලාසනයේ සිටින මා බෞද්ධයෙක් හැටියටත්, අනෙකුත් ආගමික වශයෙනුත් එතුමාගේ ඉදිරි ජීවිතය සුවපත් වේවායි ප්‍රාර්ථනා කිරීමට මේ මොහොත භාවිතා කරනවා.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 02.01 ට, 2012 නොවැම්බර් මස 20 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Aaccordingly, the Provincial Council was adjourned at 02.01 p.m. till 09.30 a.m, on 20.11.2012.*